

# පරමාර්ථ ස්වරූප භේදනිය

# පරමාර්ථ ස්වරූප භෙදනිය

## ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ වචන | ශුද්ධ වචන |
|---|---|---|---|
| 2 | 10 | සග්‍රහ | සඞ්ග්‍රහ |
| 2 | 23 | නයක්‍රමයෙන් | නයින් |
| 3 | 3 | බෙදනු | කියනු |
| 4 | 1 | යෙදූ | නොයෙදූ |
| 5 | 12 | චිත්තය | ධ්‍යානචිත්තය |
| 6 | 5 | කළාව | ; කළාව, |
| 6 | 7 | චිත්තානී | ; චිත්තානි |
| 10 | 11 | වති | වෙති |
| 10 | 26 | සිතෙහී | සිතෙහි |
| 11 | 18 | සමගද සමගද | සමගද |
| 11 | 19 | සසම්‍යග් | සම්‍යග් |
| 11 | 20 | පන්ති | පන්තිස සමගද |
| 11 | 28 | ලැබූ | ලැබෙන |
| 11 | 30 | කි | ප්‍රකාශවන |
| 11 | 31 | කී | ප්‍රකාශවන |
| 13 | 8 | ක්‍රයා | ක්‍රියා |
| 13 | 10 | සිතෙහ | සිතෙහි |
| 15 | 23 | සියළු | සියලු |
| 17 | 19 | තියති | නියති |
| 20 | 9 | හිඳොව | හිඳො |
| 20 | 17 | ලැබෙන | ලබන |
| 20 | 20 | තානානත | තානතත |
| 23 | 1 | ආකිඤ්ඤා | ආකිඤ්චඤ්ඤා |
| 25 | 17 | කාමකුශලක්‍රියා | කාමකුශලක්‍රියා අරූපකුශලක්‍රියා |
| 42 | 29 | උපදින්නෝය | උපදින්නෝය. එයින් පඤ්චවිධ රූප භවඞගයෝ කර්මනිමිත්තම අරමුනුකරත්. |
| 43 | 3 | උපදිති | උපදිති. ඉතුරු අටවිස්සක් (28) විපිහු සවිසි (26) පඤ්චවොකාර භූමිවල උපදිත්. |

| පිට | පෙළ | අශුද්ධ වචන | ශුද්ධ වචන |
|---|---|---|---|
| 46 | 1 | විපාකචිත්තයන්ට | චිත්තයන්ට |
| 46 | 18 | මරණාසන්න ජවන පස්වරක් තදාරම්මණ දෙවරක් සහ චුතියද යනු වැඩිව වැටී තිබේ. | |
| | 25 | (20) | (20) චිත්තසවරූපාදීයෙහි විනාඩි පෙර පසු භවදෙක්හි සියලු චිත්තයෝ ක්‍රියා ජවනයන් හැර ඉතුරු සූසාලිස් (44) වැදෑරම් කාම චිත්තයෝයි. |
| 47 | 29 | ප්‍රතිසන්ධි | චුති |
| 47 | 31 | (4) කෙරෙන් | (4) කෙරෙන් ප්‍රතිසන්ධි විස්සමද (20) ආයෂී ත්‍රිහෙතුක කාම චුති සතර (4) කෙරෙන්. |
| 48 | 3 | රූපාවචර | රූපාරූප. |
| 48 | 9 | සමඟකාම | සමඟ මතු අරූප ප්‍රතිසන්ධිකාම |
| 48 | 27 | රූපාවචර පඤ්ච-වොකාර | පඤ්චවිධ රූපාවචර |
| 51 | 14 | කෘත්‍යයෙස් | කෘත්‍යයෙන් |
| 52 | 27 | පණ්ණුසක | පණ්ණාසක |
| 53 | 4 | බලයෙන්ම ඇතිවන | බලයෙන්ම |
| 53 | 13 | ඉශමානිෂට | ඉෂ්ඨානිෂ්ඨ |
| 54 | 1 | ඉෂටාරස අතිෂටා-රස | ඉෂ්ඨාරස අතිෂ්ඨාරස |
| 55 | 22 | ජවනවීපිය | ජවන වෙගය |
| 55 | 20 | කුණුපාදිගෙහි | කුණපාදියෙහි |
| 56 | 35 | පරියොසානෙ | ජීවිත පරියොසානෙ |
| 60 | 17 | වංශයෙන් | වශයෙන් |
| 61 | 19 | එසේ | එසේ පැණවතුන් විසින් |
| 62 | 7 | පඤ්ඤව | පඤ්ඤවන් |
| 62 | 12 | පඤ්ඤව | පඤ්ඤවන් |
| 63 | 19 | හැරිද | හැරීද |
| 65 | 21 | සට්ටනං | සංසට්ටනං |
| 67 | 9 | සක්ඛරොප මාය | සක්ඛරොප මයා |

| පිට | පෙළ | අශුද්ධ වචන | ශුද්ධ වචන |
|---|---|---|---|
| 68 | 23 | මධ්‍ය | මධ්‍යගත |
| 69 | 5 | මධ්‍ය | මධ්‍යගත |
| 69 | 22 | ආදිකම්ම | ආදිකම්මික |
| 70 | 6 | ආදිකම්ම | ආදිකම්මික |
| 70 | 18 | ආවජ්ජන | ආදිකම්මික |
| 72 | 9 | ප්‍රථ්‍ය | ප්‍රත්‍ය |
| 72 | 19 | සමසති | සමතිස |
| 72 | 33 | සමසිතව වශ | සමසිතවශ |
| 73 | 7 | කුසල ජවන | කුසල සොමනස්ස ජවන |
| 74 | 4 | දතයුතු | දතයුතු. ඵල ජවනයෝ නිවන් අරමුණුකරත්. |
| 76 | 26 | පුඤ්ඤතො | පුඤ්ඤවතො. |
| 77 | 5 | ප්‍රථමධ්‍යාන | ලොකිය ප්‍රථමධ්‍යාන |
| 78 | 9 | එකොළොස්දෙන(11) | විසිඑක්දෙන (21) උපදින්නෝය. උපරිඵල චිත්තවශ එක්වර (1) දෙවර (2)) තෙවර (3) බොහෝවරද උපදී. |
| 79 | 4 | උත්පත්ති ක්‍රමයෙන් කියනලද චිත්තස්වරූප විභාගයට අනතුරුව වක්ෂ්‍යමාණ භූමිජාති චිත්ත ස්වරූප විභාගයද ඇතුලත්කර විභාගකරනු. අකුශලයට අනතුරුව අකුශල කාම රූපාරූපවිපාක සතර (4) කොටසද. කාම කුශලයට අනතුරුව කාම රූපාරූපානුත්තර කුශලවිපාක අට (8) කොටසද කාමවිපාකයට අනතුරුව කාම රූපාරූපවිපාක කාම ක්‍රියා සතර (4) කොටසද. කාම ක්‍රියාවට අනතුරුව අකුසල් කාම කුසල් කාම රූපාරූපානුත්තර විපාක කාමරූපාරූප ක්‍රියා නව (9) කොටසද. රූපකුශලයට අනතුරුව රූපකුසල් කාමරූප විපාක තුන් (3) කොටසද. රූපවිපාකයට අනතුරුව කාම රූපාරූපවිපාක කාමක්‍රියා සතර (4) කොටසද. රූප ක්‍රියාවට අනතුරුව රූපක්‍රියා කාමරූපවිපාක තුන් (3) කොටසද. අරූපකුශලයට අනතුරුව අරූප කුසල් කාමරූපාරූපානුත්තර විපාක පස් (5) කොටසද. අරූපවිපාකයට අනතුරුව කාම අරූපවිපාක | |

| පිට | පෙල | අශුද්ධ වචන | ශුද්ධ වචන |
|---|---|---|---|
| | | | කාමක්‍රියා තුන් (3) කොටසද. අරූප ක්‍රියාවට අනතුරුව කාමරූපාරූපානුත්තර විපාක අරූප ක්‍රියා පස් (5) කොටසද. ලොකොත්තර කුශලයට අනතුරුව ලොකොත්තර විපාක පමණක්ද ලොකොත්තර විපාකයට අනතුරුව කාමරූපාරූපානුත්තර විපාක සතර (4) කොටසද උපදින බව දතයුතු. |
| | | | මේ චිත්තයාගේ භූමි ජාති භෙද විභාගයි. |

---

| | | | |
|---|---|---|---|
| 78 | 31 | සංපටිච්ඡනය | සංපටිච්ඡනය. ඊට අනතුරුව සංතීරණය. |
| 81 | 19 | කලාප | කලාප. |
| 81 | 27 | කලාප | කලාප. |
| 82 | 19 | කම්පාවද | කම්පාවද; චිත්තුප්පත්ති, චිත්තොත්පත්තියද; |
| 83 | 18 | ආරුප්‍යා | ආරුප්පා. |
| 84 | 2 | දීහි | දිසී. |
| 84 | 20 | භයා | භාය. |
| 85 | 14 | භවඞ්ගසන්තාන | භවඞ්ගාසන්තාන. |
| 85 | 33 | සඞ්ඛිත | සඞ්ඛිතා. |
| 86 | 9 | පඤ්ච | පඤ්චව. |
| 86 | 31 | නිඃශ්‍රරණ | නිශ්ශරණ. |
| 87 | 17 | සමත්. දනත. | සමත්ථ. දන්ත. |
| 88 | 16 | ආසෙවප්පච්චයෙ | ආසෙවනප්පච්චයො. |
| 88 | 20 | විධානය | විධානය. |
| 88 | 21 | පජ්ජිසි | පජ්ජිය. |
| 88 | 27 | භවභනීද | භවගතීද. |

# පරමාර්ථ ස්වරූප භේදනිය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

භවංකන්තො භවෙ යොගො, භවංපාතු භවිප්පරො,
භවංවන්තො භවෙ නාගො, භවංදාතු භවිස්සරො.

භවං, (වෛනෙය සත්වයින්ගේ දානය ආදි මාර්ගඵලාධිගමය අවසානකොට ඇති) ත්‍රිසම්පත්‍යාභි වෘද්ධිය; කාන්තො, කැමැතිවූ; (භවිප්පරොයන්න හා සම්බන්ධයි.) භවෙ, (ශීලසමාධ්‍යාදි) අභිවෘද්ධි හෙතුයෙහි; යොගො, (තත් තත් බොධීන්ට චරිතයන්ට අනුව වෛනෙය සත්වයින්) යොදවා වදාළාවූ (මෙයද භවිප්පරොයන්න හා සම්බන්ධයි.)–'මෙහි' 'භවං' 'භවෙ' යනු 'සුවිජානො භවංහොති භවෙතස්සනන්දති' යන්නෙහි මෙන් වර්තමානාර්ථයෙහිවැටේ–නොහොත්. භවං, **සර්වඥතා**ඥානයදක්වා ඇති උත්කෘෂ්ට අභිවෘද්ධියට කාන්තො, අනාචාර්යවීව පැමිණියාවූ (මෙයද 'භවිප්පරො'යන්න හා සම්බන්ධයි.) භවෙ, (තදභිවෘද්ධියට හෙතුවූ) පාරමීසම්භාර සම්භරණයෙහි; යොගො, යුක්තවූ; භවිප්පරො, (ධ්‍යානමාර්ග ඵලාධිගමය දක්වා) සාතිශය අභිවෘද්ධි ප්‍රාප්ත **තථාගත**තෙම; භවං, භවත්‍රය; පාතු, (ලෞකික ලොකොත්තරාභි වෘද්ධියෙන් අනූනව) රක්ෂා කෙරේවා; භවං, භවතෘෂ්ණාව; වන්තො, (මාර්ගඥාන මුවයෙන් වමාරා)වදාළාවූ; භවෙ, භවත්‍රයෙහි; නාගො, සැරිසරායාමක් නැත්තාවූ; භවිස්සරො, භවත්‍රයෙහිම අභිවෘද්ධි ප්‍රාප්ත (මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්මයන්ට) ඊශ්වරවූ **තථාගත**තෙම; :මෙ, (ග්‍රන්ථවිධානය පිණිස ආරබ්ධවූමට) භවං, (ශරීර සෞඛ්‍යය ඇතිකොට) සමෘද්ධි අවිප්‍රවාසප්‍රඥාපටුත්වය; දාතු, ප්‍රදානය කෙරේවා—

අනන්තඤ්ඤු විසයං ධම්මං වන්දිත්වාන වදංජිනං,
අත්ථාය මන්ද සොතූනං වක්ඛං තස්ස සරූපකං.

අහං, මම; අනඤ්ඤවිසයං, අන්කිසිවකුටත් විෂයනොවූ; ධම්මං, (ධම්මසඞ්ගණී ආදි සප්තප්‍රකරණ සංඛ්‍යාත) **අභිධර්ම** පිටකය; වදං, වදාළාවූ; ජිනං, **ජිනේන්ද්‍රයා**; වන්දිත්වාන, වැඳ; මන්දසොතූනං, (**අභිධර්ම** පර්‍යාප්තියෙහි) නුවණමඳ ශ්‍රොතෘන්ගේ; අත්ථාය, ප්‍රයොජනය පිණිස; තස්ස, ඒ **අභිධර්ම**යාගේ; සරූපකං, ස්වරූප විභාග ක්‍රමය; වක්ඛං, කියන්නෙමි—

**තථාගතයන්**වහන්සේ විසින් **ධම්මසඞ්ගණී** ආදි සප්තප්‍රකරණ සංඛ්‍යාත **අභිධර්ම** පිටකයෙහි ප්‍රකීර්ණක වශයෙන් වදාළ පරම ගම්භීර **අභිධර්මාර්ථයන්** සංක්ෂෙපයෙන් ගෙන සංග්‍රහ කරනලද හෙයින් '**අභිධර්මාර්ථ සංග්‍රහ**' නම්වූ අර්ථකථාව උද්ග්‍රහණ ධාරණ පරිපෘච්ඡාවතීර්ණාභිලාෂී ශ්‍රද්ධාසම්පන්න බලවච්ඡන්දමන්ද ශ්‍රොතෘ කුලපුත්‍රයන් විසින් වක්ෂ්‍යමාණ (1) **චිත්තස්වරූපවිභාග නය**, (2) **චෛතසික ස්වරූප විභාග නය**, (3) **සම්ප්‍රයොගනය**, (4) **සංග්‍රහ නය**, (5) චෛතසිකයන්ගේ ඔවුනොවුන් හා යෙදීමගැයි කියනලද **තදුභය මිශ්‍රකනය** (6) චිත්තචෛතසිකයන් වෙදනාහෙතු කෘත්‍යද්වාරආරම්මණවස්තුවශයෙන්පිඩුකොටසඞ්ග්‍රහිත **ප්‍රකීර්ණකසංග්‍රහ නය**, (7) **වීථිප්‍රකාරනය**, 8 භූමියෙහිපුද්ගලයාවීමපුද්ගලයාභූමියෙහි වීමයයිකියනලද **භූමිපුද්ගලනය**, 9 භූමියෙහිචිත්තයවීමචිත්තයභූමියෙහිවීමයයිකියනලද **භූමිචිත්තනය**, 10 පුද්ගල විෂයෙහිචිත්තයවීම චිත්තය පුද්ගල විෂයෙහිවීමයයි කියනලද **පුද්ගල චිත්තනය**, (11) **රූපස්වරූප විභාග නය**, (12) **සමුච්චය සංග්‍රහ නය**, (13) **ප්‍රත්‍යසංග්‍රහ නය**, (14) **සමථනය**, (15) **විදර්ශනානය** යන පසළොස් වැදෑරුම් **නය** ක්‍රමයන් උද්ග්‍රහණ ධාරණ පරිපෘච්ඡාවශයෙන් උත්සාහ වැඩිය යුතුයි—

චිත්තං චෙතසිකං යොගං සඞ්ගහඤ්ච තදූභයං,
කිණ්ණං වීථිං භූං පුග්ගලං භූං චිත්තං පුග්ගලංචිත්තං.
රූපං සමුච්චයං පච්චයං සමථඤ්ච විපස්සනං,
පඤ්චද්දස විධං එතං නයංලක්ඛෙය්‍ය පණ්ඩිතො.

යනු සඞ්ග්‍රහගාථායි. කෙසේඋත්සාහ වැඩිය යුතුද ? යත්. 'චින්තෙතීති' චිත්තං, 'ආරම්මණං විජානාතීති අත්ථො, 'විසය විජානන ලක්ඛණං චිත්තං' යනුවෙන් 'විෂය විජානන ලක්ෂණවත්' ධර්මයතෙම, **චිත්තය** නම්වේ. එම **චිත්තය**තෙම සංක්ෂෙපයෙන් සොම්නස් සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික චිත්තය.

සොම්නස් සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික චිත්තය—පෙ—අර්හන්මාර්ගචිත්තය අර්හත්ඵල චිත්තයයි මෙසේ එකූන නවූනි ප්‍රභෙදවේ. ප්‍රතිලොම වශයෙන්ද බෙදනු. තවද "අට්ඨධා ලොභ මූලානි—පෙ—වාදසා කුසලාසියුං" යනුකී හෙයින් ලොභ මූල අකුසල් සිත් අටය,වෙෂමූල අකුසල් සිත් දෙකය, මොහ මූල අකුසල් සිත් දෙකය මෙසේ අකුසල් සිත්දොළොසෙකි. "සත්තා කුසලපාකානි—පෙ—අට්ඨාරස අහෙතුකා" යනුකී හෙයින් අහෙතුකසිත් අටළොසෙකි. "වෙදනා ඤාණසංඛාර—පෙ—පුඤ්ඤපාකක්‍රියාමතා" යනුකී හෙයින් කාමසොභන සිත් සූවිස්සෙකි. "පඤ්ච ධාඣානභෙදෙන—පෙ—තං පඤ්ච දසධාභවෙ" යනුකී හෙයින් රූපසිත් පසළොසෙකි—

"ආලම්බනප්ප භෙදෙන—පෙ—පුනවාදස ධාඨිතං" යනුකී හෙයින් අරූපසිත් දොළොසෙකි. "චතුමග්ගප්ප භෙදෙන—පෙ—අට්ඨධානුත්තරං මතං" යනුකී හෙයින් කුසල් සිත් සතරය, විපාක සිත් සතරය, මෙසේ ලොකොත්තර සිත් අටෙකි. මේ සියල්ල පිඩුකොටද චිත්තය එකූන නවූනි ප්‍රභෙදවේ. තවද "වාදසා කුසලා නෙවං—පෙ—ක්‍රියා චිත්තානි වීසති" යනුකී හෙයින් අකුසල් සිත්දොළොසෙකි. කුසල්සිත්විසිඑකෙකි. විපාක සිත්තිස්සයෙකි. ක්‍රියා විස්සෙකි. මේ සියල්ල පිඩුකොට්ද චිත්තය එකූන නවුනී ප්‍රභෙදවේ. තවද "පාපාහෙතුක මුත්තානි—පෙ—අථෙකනවුතීපිවා" යනුකී හෙයින් අසොභන සිත්තිසෙකි, සොභන සිත්එකුන් සැටෙකි,මේදෙකොටස පිඩුකොටද චිත්තය එකූන නවුනී ප්‍රභෙදවේ—තවද—

එපෙත්ථා ඉච්ඡිතං චිත්තං හජෙ වෙදනා භෙදතො,
සම්පයොග විප්පයොග සඞ්ඛා සඞ්ඛාර භෙදතො,
නයොගෙ නවතථෙව මිස්සතොච යථාක්කමං.

ඉච්ඡිතං,(සවරූප වශයෙන් බෙදනු) කැමැතිවූ; චිත්තං, චිත්තයා; එපෙත්ථා, තබා; වෙදනා භෙදතො; (ත්‍රිවිධ) වෙදනා (පඤ්චවිධ)වෙදනා ප්‍රභෙදයෙන්; හජෙ විභජෙයා, බෙදන්නේය; සම්පයොග විප්පයොගසංඛා සංඛාර භෙදතොච, සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත භෙද අසංඛාරික සසංඛාරික භෙදයෙන්ද; හජෙ, බෙදන්නේය;නයොගෙතව, (සුඛසහගතනොවූ දුක්ඛසහගතනොවූ යනාදි) ප්‍රතිෂෙධ නකාරයොගයෙන්ද; තථෙව, (එම ත කාරය

යේදු) නයක්‍රම්මෙන්ම; හජේ, බෙදන්නේය; යථාක්කමං, (වෙදනායොග සංඛාර යන තුන) පිළිවෙළින්; මිසසතොච, මිශ්‍ර වශයෙන්ද;හජේ, බෙදන්නේය–අකුසල්වලසතරය,අහේතුකවල තුනය, කාමසොභනවල දොළොසය, මහද්ගතවල දොළොසය, ලොකොත්තර අටය,මෙසේ සුඛ සහගත සිත් එකුන් සාලිසෙකි. ද්වෙෂමූලඅකුසල්දෙකය, අකුසල විපාකකායවිඥානඑකය,මෙසේ දුක්ඛසහගතසිත්තුනෙකි. අකුසල්වලසයය,අහෙතුකවල තුදුසය, කාමසොභනවල දොළොසය, මහද්ගතවල පසළොසය, ලොකොත්තර අටය,මෙසේ උපෙක්‍ෂා සහගතසිත් පස්පනසෙකි. මේ සියල්ල පිඩුකොටද චිත්තය එකුන නවුති ප්‍රභෙදවේ—

(මෙහි ධ්‍යානාඞ්ග සම්ප්‍රයොග භෙද භින්නවූ සමසතලිස් ලොකොත්තර චිත්තය පිඩුකොට සංක්‍ෂෙප කළ හෙයින් ලොකොත්තර චිත්තය සුඛ උපෙක්‍ෂා උභය වෙදනා යොග කොට දක්වීමු.) අකුසල්වල අටය, කාමසොභනවල දොළොසය මහද්ගත ලොකොත්තර පන්තිසය, මෙසේ සම්ප්‍රයුක්ත සිත් පස් පනසෙකි. ඉතුරු විප්‍රයුක්ත සිත් සූතිසෙකි. මේ සියල්ල පිඩුකොටද චිත්තය එකුන නවුති ප්‍රභෙදවේ. (මෙහිද සම්ප්‍රයුක්ත භාවසාධක දෘෂ්ටි ආදී චෛතසිකයන් සමග නොයෙදෙන හෙයින් අහෙතුකයන් විප්‍රයුක්තකොට දක්වීමු.) අකුසල්වල පසය,කාමසොභනවල දොළොසය, මහද්ගතලොකොත්තර පන්තිසය, මෙසේස සංඛාරික සිත් දෙපනසෙකි. ඉතුරු අසංඛාරික සිත් තිස්හතෙකි. මේදෙකොටස පිඩුකොටද චිත්තය එකුන නවුති ප්‍රභෙදවේ. (මෙහිද ස්වරූප බෙදීම පහසුවීම පිණිස මොහ මූල දෙසිත සහ අහෙතුකයන් අසංඛාරිකයන්හිද අභිඥා සිත් සසංඛාරිකයන්හිද ඇතුලත්කොට දක්වීමු. ප්‍රාඥයන් විසින් සූක්තා යුක්ති විමසනුලැබෙත්වා.)සුඛ සහගතනොවූ සිත් පනස් අටය, දුක්ඛසහගතනොවූ සිත් අසූසයය යනාදි වශයෙන්ද සටකී නයාශ්‍රයෙන්ම බෙදනු. වෙදනා යොගයන් මුල් කොට තබාගෙන යොගසංඛාරයන් මූලිකරගෙනද බෙදනු. ඒමෙසේය–සුඛ සහගතමවී සම්ප්‍රයුතතනොවන සිත් එකොළොසය, සම්ප්‍රක්තමවී සුඛසහගතනොවන සිත්විසිහතය, දෙකමවන සිත් විසිඅටය, දෙකමනොවන සිත් තෙවිස්සය,මෙසේ සතර කොටස පිඩුකොටද චිත්තය එකුන නවුති ප්‍රභෙදවේ. සුඛසහගතමවී විප්‍රයුක්තනොවනසිත්අට විස්සය,විප්‍රයුක්තමවී සුඛසහගතනොවන සිත් තෙවිස්සය, දෙකමවන සිත් එකොළොසය, දෙකම

නොවන සිත් විසිහතය. මේ සතර කොටස පිඬුකොටද චිත්තය එකුන නවුති ප්‍රභෙදවේ. සසංඛාරික අසංඛාරිකදෙක මුල්කරගෙනද බෙදනු. මේ ක්‍රමයෙන්ම දුක්ඛය මුල්කරගෙන මුලිසතරද උපෙක්ෂාව මුල්කරගෙන මුලිසතරද ඇතුලත්කරනු, සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත දෙක මුල්කොටගෙන සසංඛාරික අසංඛාරික දෙකින්ද බෙදනු. මේ සංක්ෂෙප චිත්ත සවරූප විභාගයයි.

විස්තාරවශයෙන් වනාහි සොම්නස් සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික චිත්තය, සොම්නස් සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික චිත්තය යනාදි වශයෙන් යටකී නයින් ලෞකික සිත් බෙදනු. ලොකොත්තර සිතෙහි වනාහි විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ග පස සමග යෙදෙන ශ්‍රොතා ප්‍රාප්ති මාර්ග ප්‍රථම චිත්තය—පෙ—උපෙක්ෂා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගදෙක සමග යෙදෙන අහිත්ඵල පඤ්චමධ්‍යාන චිත්තය මෙසේ චිත්තය එකාවිස ශත ප්‍රභෙදවේ. තවද යට දැක්වූ සංක්ෂෙප සවරූප බෙදීමෙහි කියනලද නය ක්‍රමාව ස්ථානය දක්වාද බෙදනු. එසේ බෙදීමෙහිද "චතුමග්ගප්පභෙදෙන" යනාදි ගාථා සථානයෙහි "ඣානඞ්ගයොග භෙදෙන" යනාදි ගාථා තබාගෙන බෙදනු. "ද්වාදසා කුසලා නෙවං" යනාදි ගාථා සථානයෙහිද-

ද්වාදසා කුසලා නෙවං කුසලා සතතිංසති
විපඤ්ඤාසෙව පාකානි ක්‍රිය චිත්තානි වීසති-

යනමේ ගාථාව තබාගෙන ගණන් සංඛ්‍යාද යෙදෙන පරිදි බලා කියනු.

තවද-කාම සිත් සිවුපනසය, ප්‍රථම ධ්‍යාන සිත් එකොලොසය, විතීය ධ්‍යාන සිත් එකොලොසය, තෘතීය ධ්‍යානසිත් එකොලොසය,චතුර්ථධ්‍යාන සිත් එකොලසය, පඤ්චමධ්‍යාන සිත් තෙවිස්සය, මේ සියල්ල පිඬුකොටද චිත්තය එකාවිස ශතප්‍රභෙදවේ. මෙසේකියනලද නයක්‍රම යහපත්ලෙස සිත්හිධාරණය කොටගෙන් තැවත තැවත බෙදනු. චිත්ත සවරූප හොඳින් අවබොධවූවිට චෛතසික සංග්‍රහය සහ ප්‍රකීර්ණක සංග්‍රහයද සුවසේ අවබොධ වෙයි.

එකෙකං සඞ්ගහො පුන තථාච වේදනාදිකං,
ඉතිපඤ්චධා චිත්තානි විභජෙය්‍ය පුනප්පුනං.

එකෙකං, එක එක බැගින් බෙදීම; සඞ්ගහො, අවයව සඞ්ග්‍රහ සමුදායසඞ්ග්‍රහගාථා තබාගෙන බෙදීම-පුන, නැවත මධ්‍යම සංග්‍රහ ගාථා තබාගෙන බෙදීම තථාච එමෙන් අතිසංක්ෂිප්ත මහා සංග්‍රහ ගාථා තබාගෙන බෙදීම-වෙදනාදිකං, වෙදනාදියෙන් බෙදීම; ඉති, මෙසේ චිත්තානි, චිත්තයන්; පඤ්චධා, පස්ආකාරයකින්; පුනප් පුනං, නැවත නැවත; විභජෙය්‍ය, විශෙෂයෙන් බෙදන්නේය.

**මේ පරමාර්ථ ස්වරූප භෙදනීයෙහි පළමුවන**
**චිත්ත ස්වරූප විභාග ක්‍රමයයි.**

## චිත්ත සවරූප විභාග ක්‍රමය.

| | | සුඛ සහගත සිත් | දුක්ඛ සහගත සිත් | උපෙක්ෂා සහගත සිත් | සම්ප්‍රයුක්ත සිත් | විප්‍රයුක්ත සිත් | අසංඛාරික සිත් | සසංඛාරික සිත් | සුඛසම්ප්‍රයුක්ත සිත් | සුඛ විප්‍රයුක්ත සිත් | සුඛඅසංඛාරික සිත් | සුඛසසංඛාරික සිත් | දුක්ඛසම්ප්‍රයුක්ත සිත් | දුක්ඛවිප්‍රයුක්ත සිත් | දුක්ඛඅසංඛාරික සිත් | දුක්ඛ සසංඛාරික සිත් | උපෙක්ෂාසම්ප්‍රයුක්ත සිත් | උපෙක්ෂාවිප්‍රයුක්ත සිත් | උපෙක්ෂාඅසංඛාරික සිත් | උපෙක්ෂාසසංඛාරික සිත් | සම්ප්‍රයුක්ත අසංඛාරික සිත් | සම්ප්‍රයුක්ත සසංඛාරික සිත් | විප්‍රයුක්තඅසංඛාරික සිත් | විප්‍රයුක්තසසංඛාරික සිත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලෝභමූල සිත් | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| ද්වෙෂමූල සිත් | 2 | 0 | 2 | 0 | 2 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 |
| මෝහමූල සිත් | 2 | 0 | 0 | 2 | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 2 | 0 | 2 | 0 | 0 | 0 |
| මහාකුසල් | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| මහාවිපාක | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| මහාක්‍රියා | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| කාමකුසල් | 8 | 4 | 0 | 4 | 4 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 |
| කාමවිපාක | 23 | 6 | 1 | 16 | 4 | 19 | 19 | 4 | 2 | 4 | 4 | 2 | 0 | 1 | 1 | 0 | 2 | 14 | 14 | 2 | 2 | 2 | 17 | 2 |
| කාම ක්‍රියා | 11 | 5 | 0 | 6 | 4 | 7 | 7 | 4 | 2 | 3 | 3 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 4 | 4 | 2 | 2 | 2 | 5 | 2 |
| ලෞකික කුසල් | 17 | 8 | 0 | 9 | 13 | 4 | 4 | 13 | 6 | 2 | 2 | 6 | 0 | 0 | 0 | 0 | 7 | 2 | 2 | 7 | 2 | 11 | 2 | 2 |
| ලෞකික විපාක | 32 | 10 | 1 | 21 | 13 | 19 | 19 | 13 | 6 | 4 | 4 | 6 | 0 | 1 | 1 | 0 | 7 | 14 | 14 | 7 | 2 | 11 | 17 | 2 |
| ක්‍රියා | 20 | 9 | 0 | 11 | 13 | 7 | 7 | 13 | 6 | 3 | 3 | 6 | 0 | 0 | 0 | 0 | 7 | 4 | 4 | 7 | 2 | 11 | 5 | 2 |
| සංක්ෂෙප කුසල් | 21 | 12 | 0 | 13 | 17 | 4 | 4 | 17 | 10 | 2 | 2 | 10 | 0 | 0 | 0 | 0 | 11 | 2 | 2 | 11 | 2 | 15 | 2 | 2 |
| විස්තාර කුසල් | 37 | 24 | 0 | 13 | 33 | 4 | 4 | 33 | 22 | 2 | 2 | 22 | 0 | 0 | 0 | 0 | 11 | 2 | 2 | 11 | 2 | 31 | 2 | 2 |
| සංක්ෂෙප විපාක | 36 | 14 | 1 | 25 | 17 | 19 | 19 | 17 | 10 | 4 | 41 | 10 | 0 | 1 | 1 | 0 | 11 | 14 | 14 | 11 | 2 | 15 | 17 | 2 |
| විස්තාර විපාක | 52 | 26 | 1 | 25 | 33 | 19 | 19 | 33 | 22 | 4 | 4 | 22 | 0 | 1 | 1 | 0 | 11 | 14 | 11 | 11 | 2 | 31 | 17 | 2 |

## චිත්තස්වරූප විභාග ක්‍ර ම ය.

| චිත්තස්වරූප විභාග ක්‍රමය | | සුඛසහගත සිත් | දුක්ඛ සහගත " | උපෙක්ෂා සහගත " | සම්ප්‍රයුක්ත " | විප්‍රයුක්ත " | අසංඛාරික " | සසංස්ඛාරික " | සුඛ සම්ප්‍රයුක්ත " | සුඛ විප්‍රයුක්ත " | සුඛ අසංඛාරික " | සුඛ සසංඛාරික " | දුක්ඛ සම්ප්‍රයුක්ත " | දුක්ඛ විප්‍රයුක්ත " | දුක්ඛ අසංඛාරික " | දුක්ඛ සසංඛාරික " | උපෙක්ෂා සම්ප්‍රයුක්ත " | උපෙක්ෂා විප්‍රයුක්ත " | උපෙක්ෂා අසංඛාරික " | උපෙක්ෂා සසංඛාරික " | සම්ප්‍රයුක්ත අසංඛාරික " | සම්ප්‍රයුක්ත සසංඛාරික " | විප්‍රයුක්ත අසංඛාරික " | විප්‍රයුක්ත සසංඛාරික " |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් | 12 | 4 | 2 | 6 | 8 | 4 | 7 | 5 | 2 | 2 | 2 | 2 | 2 | 0 | 1 | 1 | 4 | 2 | 4 | 2 | 5 | 3 | 2 | 2 |
| අහෙතුක සිත් | 18 | 3 | 1 | 14 | 0 | 18 | 18 | 0 | 0 | 3 | 3 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 14 | 14 | 0 | 0 | 0 | 18 | 0 |
| අසොභන සිත් | 30 | 7 | 3 | 20 | 8 | 22 | 25 | 5 | 2 | 5 | 5 | 2 | 2 | 1 | 2 | 1 | 4 | 16 | 18 | 2 | 5 | 3 | 20 | 2 |
| කාමසොභන සිත් | 24 | 12 | 0 | 12 | 12 | 12 | 12 | 12 | 6 | 6 | 6 | 6 | 0 | 0 | 0 | 0 | 6 | 6 | 6 | 6 | 6 | 6 | 6 | 6 |
| කාම සිත් | 54 | 19 | 3 | 32 | 20 | 34 | 37 | 17 | 8 | 11 | 11 | 8 | 2 | 1 | 2 | 1 | 10 | 22 | 24 | 8 | 11 | 9 | 26 | 8 |
| රූප සිත් | 15 | 12 | 0 | 3 | 15 | 0 | 0 | 15 | 12 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 3 | 0 | 15 | 0 | 0 |
| අරූප සිත් | 12 | 0 | 0 | 12 | 12 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 12 | 0 | 0 | 12 | 0 | 12 | 0 | 0 |
| මහග්ගත සිත් | 27 | 12 | 0 | 15 | 27 | 0 | 0 | 27 | 12 | 0 | 0 | 12 | 0 | 0 | 0 | 0 | 15 | 0 | 0 | 15 | 0 | 27 | 0 | 0 |
| ලෞකික සිත් | 81 | 31 | 3 | 47 | 47 | 34 | 37 | 44 | 20 | 11 | 11 | 20 | 2 | 1 | 2 | 1 | 25 | 22 | 24 | 23 | 11 | 36 | 26 | 8 |
| සංක්ෂෙපලොකොත්තර | 8 | 8 | 0 | 8 | 8 | 0 | 0 | 8 | 8 | 0 | 0 | 8 | 0 | 0 | 0 | 0 | 8 | 0 | 0 | 8 | 0 | 8 | 0 | 0 |
| විස්තාරලොකොත්තර | 40 | 32 | 0 | 8 | 40 | 0 | 0 | 40 | 32 | 0 | 0 | 32 | 0 | 0 | 0 | 0 | 8 | 0 | 0 | 8 | 0 | 40 | 0 | 0 |
| සංක්ෂෙප සිත් | 89 | 39 | 3 | 55 | 55 | 34 | 37 | 52 | 28 | 11 | 11 | 28 | 2 | 1 | 2 | 1 | 33 | 22 | 24 | 31 | 11 | 44 | 26 | 8 |
| විස්තාර සිත් | 121 | 63 | 3 | 55 | 87 | 34 | 37 | 84 | 52 | 11 | 11 | 52 | 2 | 1 | 2 | 1 | 33 | 22 | 24 | 31 | 11 | 76 | 26 | 8 |

## 2 දැන් චෛතසික ස්වරූප විභාගනය කියනු ලැබේ.

“චෙතසි නියුත්තං තදායත්ත වුත්තිතායාති චෙතසිකං” යනු නිර්වචන හෙයින්ද “එකුප්පාද නිරොධාච—පෙ—ධම්මා චෙතසිකා මතා” යනුකීහෙයින්ද මෙබඳු සවභාව ලක්ෂණවත්වූ ධර්මයතෙමේ චෛතසික නමවේ. එම චෛතසිකය තෙම ඵස්ස වෙදනා සඤ්ඤා-පෙ-කරුණා මුදිතා පඤ්ඤින්ද්‍රිය යන මොවුන්ගේ වශයෙන් දෙපනස් වැදෑරුම්වේ. ප්‍රතිලොමවශයෙන්ද කියනු. තවද “තෙරසඤ්ඤ සමානාච—පෙ—විපඤ්ඤාස පවුච්චරෙ”යනු කී හෙයින් අන්‍ය සමාන චෛතසික තෙළසෙකි. අකුශල චෛතසික තුදුසෙකි’ සොභන චෛතසික පස්විස්සෙකි. මේතුන්කොටස පිඬුකොටද චෛතසිකය දෙපනස් වැදෑරුම්වේ. තවද “ඉස්සාමච්ඡෙර කුක්කුච්ච-පෙ-සෙසානියත යොගිනො”යනු කී හෙයින් අනියත යොගී චෛතසික එකොළොසෙකි. නියතයොගී චෛතසික එක්සාලිසෙකි. මෙ දෙකොටස පිඬුකොටද චෛතසිකය දෙපනස් වැදෑරුම්වේ.

**මේ පරමාර්ථ ස්වරූප හෙදනියෙහි දෙවන චෛතසික ස්වරූප විභාග ක්‍රමයයි.**

---

### 3 දැන් සම්ප්‍රයොගනය කියනු ලැබේ.

“සත්ත සබ්බත්ථ යුජ්ජන්ති” යනු කී හෙයින් සර්වචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන සංක්ෂෙප එකූන නවුති ප්‍රභෙද චිත්තයෙහිද විස්තාර එකවීස ශතප්‍රභෙද චිත්තයෙහිද යෙදෙති. “විතක්කොතාව-පෙ-උප්පජ්ජන්ති” යනුකී හෙයින් විතර්ක චෛතසිකයතෙම සිත් පන්පනසෙක්හි යෙදෙයි. “විචාරොපන—පෙ—ඡසට්ඨි චිත්තෙසු” යනුකී හෙයින් විචාර චෛතසිකයතෙම සිත් සසැටෙක්හි යෙදෙයි. මේ ක්‍රමයෙන් සංග්‍රහ පාළිය කිය කියා ප්‍රභෙදන්ද්‍රිය දක්වා බෙදනු. සර්වචිත්ත සාධාරණාදියමූලකරගෙන විතර්කාදිය මූලිකොටගෙනද බෙදනු.

තවද;-

සර්වචිත්ත සාධාරණයන් සමග යෙදී විතර්කය සමග නොයෙදෙන සිත් සසැටකි. විතර්කය සමගයෙදී සර්වචිත්ත සාධාරණයන් සමග නොයෙදෙන සිත්නැත්තේය. දෙකම සමග යෙදෙන සිත් පස්පනසෙකි. දෙකම සමග නොයෙදෙන සිත් නැත්තේය. මේ ක්‍රමයෙන් ප්‍රභෙදන්ද්‍රිය දක්වා මූලී ඇතුල්කර බෙදනු. එමෙන්ම විතර්කය මූලකරගෙන ප්‍රභෙදන්ද්‍රියදක්වාද විචාරාදිය මූලකරගෙන ප්‍රභෙදන්ද්‍රියදක්වාද බෙදනු. **අතිශයින් ආකූල ව්‍යාකූල ස්ථානයකි.**

එහෙයින් අකුසීතව නැවත නැවතබෙදනු. මෙම සම්ප්‍රයොගනය පුහුණුවීනම් සංග්‍රහනය තදුභය මිශ්‍රකනයත් සුවසේ වැටහෙයි ප්‍රකීර්ණක සංග්‍රහනය අවබොධයටද උපකාරවෙයි.

**මේ තෙවන සම්ප්‍රයොග නයයි.**

---

4 දූන් සංග්‍රහනය කියනු ලැබේ.

ලොභ මූල ප්‍රථම අසංස්කාරික සිතෙහි චෛතසික එකුන් විස්සක් යෙදේ. ද්විතීය සසංස්කාරික සිතෙහි චෛතසික එක්විස්සක් යෙදේ. තෘතිය සිතෙහි එකුන් විස්සක්ද චතුර්ථ සිතෙහි එක්විස්සක්ද පචම සිතෙහි අටලොසක්ද සවන සිතෙහි විස්සක්ද සත්වන සිතෙහි අටලොසක්ද අට වනි සිතෙහි වීස්සක්ද ද්වෙෂ මූල ප්‍රථම සිතෙහි විස්සක්ද ද්විතිය සිතෙහි දෙවිස්සක්ද මොහමූල දෙසිතෙහි පසළොස බැගින්ද දෙපස් විඥන දසයෙහි සත බැගින්ද—පෙ—අභීත්ඵල ප්‍රථමධ්‍යාන සිතෙහි සතිසක්ද ද්විතියධ්‍යාන සිතෙහි පන්තිසක්ද තෘතිය ධ්‍යානසිතෙහි සූතිසක්ද චතුර්ථධ්‍යාන සිතෙහි තෙතිසක්ද පච මධ්‍යාන සිතෙහි තෙතිසක්ද යෙදේ. තවද. එකම සිතෙක්හි යෙදෙන චෛතසික එකය. දෙසිතෙක්හි යෙදෙන චෛතසික සතරය. සතරෙක්හි දෙකය. පසෙක්හි දෙකය. අටෙක්හි එකය. දෙළොසෙක්හි සතරය. සොළොසෙක්හි තුනය. අටවිස්සෙක්හිදෙකය. සත්සාලිසෙක්හිඑකය. එක්පණස්පස්පනස් සිත්වලද එක බැගින්ය. පනස් නවයෙක්හි එකුන් විස්සෙක්ය. සසැටෙක්හි එකය. නවසැට තිසැත්තෑ අටසැත්තෑ සිත්වලද එකබැගින්මයෙදේ. සංක්‍ෂෙපයෙන් එකුන්අනුවූ විස්තරයෙන් එකසිය විසිඑක් මැදූරුම්වූ චිත්තයන්හි චෛතසික සත්දෙනෙක්ද යෙදෙති.

තව්ද ලොභමූල සිතෙහිම යෙදී ද්වෙෂමූල සිතෙහි නොයෙදෙන චෛතසික සතරය. ද්වෙෂමූල සිතෙහිම යෙදී ලොභමූල සිතෙහි නොයෙදෙන චෛතසිකද සතරය. දෙසිතෙහිම යෙදෙන චෛතසික අටළොසය. දෙකෙහිම නොයෙදෙන චෛතසික සවිස්සය. මේ සතර කොටස පිඩුකළවිට දෙපණස සම්පූර්ණවේ. මේ ක්‍රමයෙන් අභිත්ඵල පඤ්චමධ්‍යාන සිත දක්වා මූලිකර බෙදනු. එමෙන්ම ද්වෙෂ මූලාදී සිත් මූලකරගෙනද එම පඤ්ච මධ්‍යාන සිත දක්වාම මූලිඇතුල්කර බෙදනු. මෙය බණ්ඩචක්‍ර ක්‍රමයයි. චක්‍රාකාරයෙන් ගෙනවුත් මූලින්කියා අවසානවන නය සමග සම්බන්ධකොට බඳිනලද චක්‍රය බඩචක්‍රයයි නොහොත්

ප්‍රථම මූලය බණ්ඩචක්‍රයි. ද්විතීය මූලාදිය බඩචක්‍රයි. මෙසේ චක්‍ර දෙකේ වෙනසද දතයුතුයි. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි සඞ්ග්‍රහනය නොබලා සම්ප්‍රයොගනයානුසමරණයෙන්ම බෙද පුහුණු කරනු.

**මේ සතරවන සංග්‍රහනයයි.**

---

5 දැන් තදුභය මිශ්‍රකනය කියනු ලැබේ.

ඵස්ස චෛතසිකය තෙම සුදුසු පරිද්දෙන් ඉතුරු එක්පනස් චෛතසිකයන් සමග යෙදෙයි. වේදනාදි චෛතසිකයෝද එසේමැයි. අධිමොක්ෂ චෛතසිකය තෙම අධිමොක්ෂ විචිකිච්ඡා වර්ජිත චෛතසික පනස සමග යෙදෙයි. වීර්‍ය්‍යය ඵස්ස චෛතසිකය මෙති. ප්‍රීතිය පීති ද්වෙෂ ඉස්සා මච්ඡරිය කුක්කුච්ච විචිකිච්ඡා වර්ජිත චෛතසික සසාලිස සමග යෙදෙයි. ඡන්දය අධිමොක්ෂයමෙති. මොහය චෛතසික සවිස්සක් සමග යෙදෙයි. අහිරිකාදී චෛතසිකයෝද එසේමැයි ලොභය චෛතසික එක් විස්සක් සමග යෙදෙයි. දෘෂ්ටිය සහ මානය විස්සක් සමගද ද්වෙෂය විසිඑකක් සමගද ඊර්ෂ්‍යාව එකුන් විස්සක් සමගද මච්ඡරිය හා කුක්කුච්චය එකුන් විස්සක් සමගද ථීනය සහ මිද්ධය පස්විස්සක් සමගද විචිකිච්ඡාව තුදුසක් සමගද ශ්‍රද්ධාව සත්තිසක් සමගද සමෘති ආදී චෛතසිකයෝ සත්තිසක් සමගද සමගද සසම්‍යග්වාචා චෛතසිකය සම්‍යග්වාචා අප්‍රමාණ්‍ය වර්ජිත පන්ති සම්‍යක්කර්මාන්ත සම්‍යග්ආජීව චෛතසිකයෝද පන්තිසක් සමගම කාරුණා චෛතසිකය විරතිඅප්‍රමාණ්‍යවර්ජිත චෛතසික තෙතිසක් සමගද යෙදේ. මුදිතාවද එසේමයි ප්‍රඥාචෛතසිකය ශ්‍රද්ධාවමෙති. සම්ප්‍රයොගනය සංග්‍රහනය යන නාමයෝ වනාහි චෛතසික සංග්‍රහ පර්‍ය්‍යාපන්නවූ හෙයින් චෛතසිකයන්ගේ සම්ප්‍රයොග මාත්‍රය දක්වන නයක්‍රමය සම්ප්‍රයොගනය නම්වේ. සම්ප්‍රයුක්තවූ චෛතසික මෙපමණයයි රාශීකොට සංග්‍රහය දක්වන ක්‍රමය සංග්‍රහනය නම්වේ. මෙසේ ඒ නාම චෛතසික ප්‍රධාන කරගෙන ලැබූ නාමයොයී.

දැන් මේ කියා නිමවූ නය වනාහි චෛතසිකයන්ගේ සම්ප්‍රයොගයකී හෙයින්ද සම්ප්‍රයුක්ත චෛතසික මෙපමණයයි රාශිකොට සංග්‍රහය කී හෙයින්ද නයදෙක මිශ්‍රවූ තදුභය මිශ්‍රක නය නම්වේ.

**මේ පස්වන තදුභය මිශ්‍රක නයයී.**

—:o:—

## චෛතසිකස්වරූප විභාගනය.

යටදැක්වූ චිත්ත ස්වරූප විභාගනයෙහි මෙන් කොටුපුරවා ගණන්ලියනු.

| | සබ්බචිත්ත සාධාරණ 7 | ප්‍රකීර්ණක 6 | අන්‍යසමාන 13 | අකුසල චෛතසික 14 | සොභන සාධාරණ 19 | සොභන චෛතසික 25 | නියත යොගී චෛතසික 41 | අනියතයොගී චෛතසික 11 | සියලු චෛතසික 52 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලොභමූල සිතෙහි- | | | | | | | | | |
| ද්වෙෂමූල සිතෙහි - | | | | | | | | | |
| මොහමූල සිතෙහි- | | | | | | | | | |
| අකුසලයෙහි - | | | | | | | | | |
| ද්විපඤ්චවිඥානයෙහි- | | | | | | | | | |
| සම්පටිච්ඡනයෙහි - | | | | | | | | | |
| උපෙක්ෂා සන්තීරණයෙහි- | | | | | | | | | |
| සුඛ සන්තීරණයෙහි- | | | | | | | | | |
| පඤ්චද්වාරාවජ්ජනයෙහි- | | | | | | | | | |
| මනොධාතුවෙහි - | | | | | | | | | |
| මනොද්වාරාවජ්ජනයෙහි- | | | | | | | | | |
| හසිතුප්පාදයෙහි - | | | | | | | | | |
| අහෙතුක අකුසල විපාකයෙහි- | | | | | | | | | |
| අහෙතුක කුසල විපාකයෙහි - | | | | | | | | | |

| කොටුපුරවා ගණන් ලියනු. | සබ්බචිත්ත සාධාරණ 7 | පකිණ්ණක 6 | අන්‍යසමාන 13 | අකුසල 14 | සෝභන සාධාරණ 19 | සෝභන 20 | නියතයෝගී 41 | අනියතයෝගී 11 | සියලු චෛතසික 52 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අහේතුකක්‍රියාසිතෙහි | | | | | | | | | |
| අහේතුකසිතෙහි | | | | | | | | | |
| අසෝභන සිතෙහි | | | | | | | | | |
| මහාකුසල සිතෙහි | | | | | | | | | |
| මහා විපාකසිතෙහි | | | | | | | | | |
| මහා ක්‍රියාසිතෙහි | | | | | | | | | |
| කාමාවචරසිතෙහි | | | | | | | | | |
| රූපාවචරසිතෙහි | | | | | | | | | |
| අරූපාවචරසිතෙහි | | | | | | | | | |
| මහග්ගත සිතෙහි | | | | | | | | | |
| ලෞක්කාසිතෙහි | | | | | | | | | |
| සංක්ෂෙප ලොකොත් | | | | | | | | | |
| විස්තාර ලොකොත් | | | | | | | | | |
| ප්‍රථමධ්‍යාන සිතෙහි | | | | | | | | | |
| ද්විතියධ්‍යානසිතෙහි | | | | | | | | | |
| තෘතියධ්‍යානසිතෙහි | | | | | | | | | |
| චතුර්ථධ්‍යානසිතෙහි | | | | | | | | | |
| පඤ්චමධ්‍යානසිතෙහි | | | | | | | | | |
| මහග්ගත ලොකොත් | | | | | | | | | |
| සංක්ෂෙප සිතෙහි | | | | | | | | | |
| විස්තාර සිතෙහි | | | | | | | | | |

**තදුභය මිශ්‍රක නයක්‍රමය.**

යමදැක්වූ චිත්තස්වරූප නය ක්‍රමයමෙන් කොටු පුරවා ගණන් ලියනු.

| | ස්පර්ශය සමග යෙදෙන | වේදනාව සමග යෙදෙන | අධිමොක්ෂය සමග | වීර්‍යය සමග | ප්‍රීතිය සමග | ඡන්දය සමග | මෝහය සමග | අහිරිකාදි තුන සමග | ලෝභය සමග | දෘෂ්ටිය සමග | මානය සමග | ද්වේෂය සමග | ඊර්ෂ්‍යාව සමග | මච්ඡරිය කුක්කුච්චයන් | ථීනය සමග | මිද්ධය සමග | විචිකිච්ඡාව සමග | ශ්‍රද්ධාව සමග | සමානත්‍යාදී අටලොස | සම්‍යග් වාචාව සමග | සම්‍යග් කර්මාන්තය සමග | සම්‍යග් ආජීවය සමග | කරුණාව සමග | මුදිතාව සමග | ප්‍රඥෙන්ද්‍රිය සමග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සබ්බචිත්ත සාධාරණ ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ප්‍රකීර්ණක ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| අන්‍යසමාන ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| අකුසල සාධාරණ ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සෙසු අකුශල චෛතසික ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| අකුසල චෛතසික ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සොභන සාධාරණ ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| අවශෙෂ සොභන ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සියළු සොභන ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| නියතයොගී චෛතසික ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| අනියතයොගී චෛතසික ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සියලු චෛතසික ... | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

## 6 දුන් ප්‍රකිණ්ණකසඞ්ග්‍රහනය කියනු ලැබේ.

"සුඛමෙකත්ථ දුක්ඛංච—පෙ—පංචපඤ්ඤාසකෙතරා" යනුකී හෙයින් සුඛසහගත සිත්එකය. දුක්ඛසහගතසිත්ද එකය. දෞම්නස් සහගත සිත් දෙකය. සෞම්නස් සහගත සිත් දෙසැටය. උපේක්ෂා සහගත සිත්පස්පනසය.මේසියල්ල පිඬුකළවිට චිත්තය විස්තාර ක්‍රමයෙන් එකවිසශතප්‍රභෙදවේ.මෙය ඉන්ද්‍රිය භෙද ක්‍රමයෙනි. ආරම්මණානු භවන භෙදයෙන් වනාහි සෞම්නස් සුඛයෙහිද. දෞම්නස් දුඃඛයෙහිද ඇතුළත්කොටබෙදනු."තෙසංඅතියථාරහං—පෙ—සඞ්ගහොනාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදියයුතුයි.කෙසේද?යත්:සුඛසහගත චෛතසිකසයෙකි. දුක්ඛසහගත චෛතසිකත් සයෙකි. සෞම්නස් සහගත චෛතසික සසාලිසෙකි. දෞම්නස් සහගත චෛතසික විසිඑකෙකි උපේක්ෂා සහගත චෛතසික සසාලිසෙකි. අගහිතග්‍රහණ වශයෙන් පරමාර්ථ සූත්‍ර මතු දක්වන නයින් දතයුතුයි. (එකායජ. ද්වීහි අඞ්වීසං. තීහි එකාදස. පංචහිජ්. එකාය පිනෙකං ඡපඤ්ඤාස සබ්බකං) ද්වෙෂ, ඊර්ෂ්‍යා, මාත්සර්‍ය්‍ය, කෞකෘත්‍ය, විචිකිච්ඡා, ප්‍රීති යන සදෙන එක්වෙදනාවක් සමග යෙදෙති. ලොභ. දිඨි. මාන. සොභන යන අටවිස්ස වෙදනා දෙකක් සමග යෙදෙති. මේ ආදි වශයෙන් ඒ ඒ වෙදනා සමග යෙදෙන චෛතසික සොයා බෙදනු- **වෙදනා සඞ්ගහයයි.**

---

"අහෙතුකඨාරසෙකා—පෙ—චත්තාලීසතිහෙතුකා" යනුකී හේසින් අහෙතුක සිත් අටලොසය. එකහෙතුක සිත් දෙකය. ද්විහෙතුක සිත් දෙවිස්සය. ත්‍රිහෙතුක සිත් සත්සාලිසය. මේ සියළු සිත් පිඬුකළවිට චිත්තය එකූන නවුති ප්‍රභෙදවේ.

"තෙසංඅතියථාරහං—පෙ—සඞ්ගහොනාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදිය යුතුයි. කෙසේදයත් ? මොහමූල දෙසිතෙහි යෙදෙන මොහය අටලොස් අහෙතුකයන්හි යෙදෙන ඡන්දවර්ජිත අන්‍ය සමාන දොළසය යනමේ චෛතසික තෙළෙස සම්ප්‍රයුක්ත හෙතුවිරහිත බැවින් අහෙතුක චෛතසිකයෝවෙති. මොහමූල දෙසිතෙහි යෙදෙන අතිරික්ත චෛතසික පසළොස ලොභ මූල ද්වෙෂ මූලයන්හි හෙතු තුන ඥානවිප්‍රයුක්ත සොභනයන්හි හෙතු දෙක යනමේ චෛතසික විස්ස එක හෙතුක චෛතසිකයෝවෙති.

ලොභමූලයන්හි අතිරික්ත චෛතසික විස්ස ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍යය ඥානවිප්‍රයුක්ත චිත්තයන්හි අතිරික්ත සොභන චෛතසික දෙවිස්ස ඥානසම්ප්‍රයුක්ත චිත්තයන්හි හෙතු තුන

යනමේචෛතසික අට්සාලීස ද්විහේතුකචෛතසිකයෝවෙති. ඥාන සම්ප්‍රයුක්තචිත්තයන්හි අතිරික්ත චෛතසික පන්තිස ත්‍රිහේතුක චෛතසිකයෝවෙති.

(අහේතුකා තෙරස. වීසති ඒකහේතුකා. අඨතාලීස ද්විහේතුකා. තිහේතුකා පඤ්චතිංසති—ඒකාංසික අගහිත ග්‍රහණ වශයෙන් වනාහි තයොඒකහේතුකා ද්විහේතුකානව තිහේතුකා සත්තවීස පංචහෙතු ඒකාං, ඡහෙතු වාදස, ද්විපඤ්ඤාස සබ්බකාං,) ලෝභ ද්වේෂ විචිකිච්ඡායන චෛතසිකතුන ඒක හේතුකයි. මෝහ දෘෂ්ටි මාන ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය අලෝභ අද්වේෂ අමෝහයන නවය ද්විහේතුකයි යනාදී වශයෙන් සොයා බෙදනු.

**හේතු සංග්‍රහයයි.**

———:o:———

“අට්ඨසට්ඨි තථාචෙව—පෙ—කිච්චට්ඨානානි නිද්දිසෙ” යනුකී හෙයින් ඒක කෘත්‍යස්ථානික සිත් අටසැටය යනාදී වශයෙන් බෙදනු. ප්‍රතිසන්ධි කෘත්‍යස්ථානිකමවී භවඞ්ගකෘත්‍යස්ථානික නොවන්සිත් නැත. භවඞ්ග කෘත්‍යස්ථානිකමවී ප්‍රතිසන්ධි කෘත්‍යස්ථානික නොවනසිත්ද නැත. උභය කෘත්‍යස්ථානිකවන සිත් එකුන්විස්සය. උභයකෘත්‍යස්ථානිකනොවන සිත්සැත්තෑවය. මේසියල්ලවිඩුකල විට චිත්තය එකූන නවුති ප්‍රභේදවේ. මේ ක්‍රමයෙන් ආවර්ජන දර්ශනාදී කෘත්‍යස්ථානික සිත්ද මූලිකරගෙන බෙදනු. එසේම භවඞ්ග ආවර්ජනාදි කෘත්‍යස්ථානික සිත්ද මූලකරගෙන චතුෂ්කනය කරනු. මෙහි සාමාන්‍යයෙන් ස්ථාන දසයෙකි. විශේෂයෙන් වනාහි ස්ථානය පස්විසි වැදෑරුම්වේ. එම ප්‍රභේදය මතුදක්වන ගාථායෙන් දතයුතුයි.

සන්ධිඒකං ඡභවඞ්ගං චාවජ්ජනං පඤ්චදොසකං,
වෙවො ජෙ ඡතදා,වෙති චුතිතිපණ්ණ වීසති.

සන්ධි, ප්‍රතිසන්ධිස්ථානය; ඒකං, එකෙකි; භවඞ්ගං, භවඞ්ගස්ථානය; ඡ, සයෙකි; ආවජ්ජනං, ආවර්ජනස්ථානය; වෙ, දෙකෙකි; පඤ්චාදි, පංචවිඥානස්ථානාදිය හෙවත් පංචවිඥාන සම්පටිච්ඡන සන්තීරණස්ථාන; ඒකං, එක බැගින්; වො, වොඨ්ඨපනස්ථාන; වෙ, දෙකෙකි; ජො, ජවනස්ථාන; ඡ, සයෙකි; තදා, තදාරම්මණස්ථාන; වෙ, දෙකෙකි; චුති, චුතිස්ථාන; ති, තුනෙකි; ඉති, මෙසේ; ඨානං, ස්ථානය; පණ්ණවීසති, පස්විසි වැදෑරුම්වේ.

**මේ සංක්ෂේප ක්‍රමයයි—විස්තරය වනාහි ව්‍යාඛ්‍යායමාණකයින්දතයුතු.**

සන්ධියානං චුභනන්තරං පආ තආ ජආ වොආ,
තචුජචුනන්තරං භස්ස ඡියානං පරිදීපයෙ.
භවිභජ්නන්තරංයෙව දුආ ඨානං ආසනන්තරං,
වියානෙකං විතිනන්තරං සංයානෙකං සංවොනන්තරං,
තීයානෙකං දුවොයානං තිජතීභනන්තරංතථා,
වොතවොභවොචුනන්තරං ආත ආභ ආචුනන්තරං.
ජයානං ජ ජභජචුනන්තරං සෙඩ්‍යං දුතලයානං,
තප ජප භපනන්තරං චුතියානං තිධාමතං.

**“සබ්බෙ පවණ්ණනාභිකා”** එහිඅර්ථ—චුභනන්තරං, චුතිභවාඞ්ග යන්ගේ අනන්තරය; සන්ධියානං, ප්‍රතිසන්ධිස්ථානයයි; පරිදීපයෙ, දක්වන්නේය. පආ තආ ජආ වොආ තචු ජචුනන්තරං, ප්‍රතිසන්ධි ආවජ්ජන- තදාරම්මණ ආවජ්ජන- ජවන ආවජ්ජන- වොට්ඨපන ආවජ්ජන-තදාරම්මණ චුති-ජවන චුති-යනමොවුන්ගේ අනන්තරය, භස්ස, එකුන්විසි (19) භවාඞ්ගයාගේ; ඡියානං, ෂට්විධස්ථානයයි; පරිදීපයෙ, දක්වන්නේය. අතිරික්ත පදාර්ථ සුගමයි වී යනු “පඤ්චවිඥානය”යි කියාද, සං යනු “සම්පටිච්ඡනයයි” කියාද තී යනු “සන්තීරණය”යි කියාද, අර්ථ කියනු—මේ ස්ථාන භෙදය හොඳින් පුහුණුවීම පිණිස විපිප්‍රස්තාරය ප්‍රගුණකටයුතු. “තෙසංඅති යථා රහං—පෙ—සඞ්ගහොනාම තියතෙ” යනු කිහෙයින් චෛතසිකද බෙදියයුතු. කෙසේද?යත්. **ප්‍රතිසන්ධි නානාස්ථානික** චෛතසික පන්තිසය(35) **භවාඞ්ග නානාස්ථානික** චෛතසිකද පන්තිසය(35) **ආවජ්ජන නානාස්ථානික** චෛතසික එකොළොසය(11) **දර්ශන නානාස්ථානික** චෛතසික සතය (7) යනාදි වශයෙන් බෙදනු— **අගහීන ග්‍රහණ** නයින්:—

එකකිච්චං සත්තරස මෙනොනාති චතුකිච්චකා,
පඤ්චකිච්චෙචක වීසෙව එකංඡසතාන තිකිච්චකං,
නවකිච්චංතීණි සතාන හොනාති චුද්දසකිච්චකා.

අකුසල චෛතසික තුදුස (14) විරති තුන (3) යන චෛතසිකයෝ සතළොස්දෙන (17) **එක නානාස්ථානිකයොයි** යනාදි වශයෙන් බෙදනු.

**—: නානා සඞ්ග්‍රහයයි. :—**

---

“පඤ්චද්වාර වජ්ජන චක්ඛු විඤ්ඤාණ—පෙ—ජවනානාලී සෙව භවන්ති” යනුකී හෙයින් චක්ෂු ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හා කාය යන පඤ්ච

ද්වාරයෙහි සිත් සසාලිස(46)බැගින් උපදිති."මනොද්වාරෙපන-පෙ-සත්ත සට්ඨි චිත්තානි භවන්ති"යනුකී හෙයින් **මනොද්වාර**යෙහි සිත් හැටහත්දෙනෙක්(67) උපදනාහුය."එකූන වීසති පටිසන්ධි භවඞ්ග චුතිවසෙන ද්වාරවිමුත්තානි" යනුකීහෙයින් **උපෙක්ෂාසන්තීරණ** දෙකය(2)මහාවිපාක අටය(8)යන සිත් **ද**සදෙන (10) කිසිකලෙක **ද්වාරික**වද කිසිකලෙක **ද්වාරවිමුක්ත**වද උපදනාහුය. මහද්ගත විපාක නවදෙන (9) සර්වප්‍රකාරයෙන් **ද්වාර විමුක්ත**යෝයි. තවද චක්ෂුද්වාරයෙහිම වී සොතද්වාරයෙහි නොවන සිත්දෙකය. (2) සොතද්වාරයෙහිම වී චක්ෂුද්වාරයෙහි නොවන සිත්ද දෙකය. (2) දෙදොරෙහිමවනසිත් සිවුසාලිසය(44)දෙදොරෙහිම නොවනසිත් එක්සාලිසය(41)සතරකොටස පිඩුකළවිට සිත් එකුන් අනූව (89) සම්පූර්ණවේ.

ඝ්‍රාණ:ජිව්හා කායමූලී තුනද (3) මේ නයින්ම දතයුතු. තවද චක්ෂුද්වාරයෙහිම වී මනොද්වාරයෙහි නොවන සිත් පසය (5) මනොද්වාරයෙහිම වී චක්ෂුද්වාරයෙහි නොවනසිත් සවිස්සය(26) දෙදොරෙහිම වනසිත් එක්සාලිසය(41)දෙදොරෙහිම නොවනසිත් සතළොසය(17)මේසතරකොටසපිඩුකළවිටදසිත්එකුන්අනූව(89)සම්පූර්ණවේ. මෙසේශ්‍රොතද්වාරාදිය මූලකරගෙනදබෙදනු. තවද"එකද්වාරික චිත්තානි—පෙ—පඤ්චධා පරිදීපයෙ' යනුකී හෙයින් එක් ද්වාරයෙක්හිම උපදිනා සිත් සතිසෙක(36)යනාදි වශයෙන් ස්වරූප උදුරාකියනු. "තෙසංදානි යථාරහං—පෙ—සඞ්ගහො නාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදියයුතු කෙසේද? යත්. අප්‍රමාණ්‍යයන් දෙදෙනාය(2)විරති තුන්දෙනාය(3)යනමොවුහු මනොද්වාරයෙහිම උපදනාහුය. අතිරික්ත චෛතසිකයෝ සත්සාලිස්දෙන (47) චක්ෂුරාදි ෂඩ්ද්වාරයෙහිම උපදිත්. ද්වාරවිමුක්ත චෛතසිකයෝ වනාහි පන්තිස් (35) දෙනෙකි.

සරූපානං විභාගෙන සඞ්ගහෙච තුධාඨිතෙ,
සුගමමාතෙන සඞ්ඛෙප නයතො සො උදීරිතො.

—: **ද්වාර සඞ්ග්‍රහයයි.** :—

---

"පඤ්චවීස පරිත්තම්හි—පෙ—අට්ඨ නිබ්බාන ගොචරෙ" යනුකී හෙයින් තෙවිසි(23)කාම විපාක **පඤ්චද්වාරාවජ්ජන හසිතොත්පාද** යනචිත්තයෝ පස්විසිදෙන(25) කාමසිත් සිවුපනස(54)චෛතසික දෙපනස(52)රූපවිසිඅට(28)යන කාමධර්මයන්ම අරමුණුකරති. අවශෙෂ මහද්ගත ලොකොත්තර නිර්වාණ ප්‍රඥප්ති ධර්මයන් අරමුණු

නොකරත්. විඤ්ඤාණ ායතන කුසල චිත්තයතෙම ප්‍රත්‍යොත්
පන්න අතීත භවයන්හි ආධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවූ ආකාසා
නඤ්චායතන කුසලය අරමුණුකරයි. විඤ්ඤාණඤ්චායතන විපාක
චිත්තයතෙම අතීතභවයෙහි ආධ්‍යාත්මසන්තානයෙහි ඇතිවූ ආකා
සානඤ්චායතන කුසලසඞ්ඛ්‍යාත කර්මනිමිත්ත අරමුණුකරයි. විඥා
නඤ්චායතන ක්‍රියාචිත්තයතෙම ප්‍රත්‍යොත්පන්න අතීතභවයන්හි
ආධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසල
යන්ද ප්‍රත්‍යොත්පන්න භවයෙහි ආධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවූ
ආකාසානඤ්චායතන ක්‍රියාද අරමුණුකරයි. මේ නයින් නෙව
සඤ්ඤා නාසඤ්ඤායතන චිත්තයෝ තිදෙනද (3) ආකිඤ්චඤ්ඤා
යතන දෙසිත (2) අරමුණුකරති රූපප්‍රථමධ්‍යාන චිත්තයෝ තිදෙ
න(3) දසකසිණ (10) දසඅසුභ(10) කායගතා සමෘතියට අරමුණුවන
කෙසාදිකොට්ඨාස ප්‍රඥප්ති ආනාපාණ සමෘතියට අරමුණුවන
ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්ති මෛත්‍රීකරුණාමුදිතා බ්‍රහමවිහාරයන්ට
අරමුණුවන අප්‍රමාණ සත්ව ප්‍රඥප්තියන පඤ්චවිසති ප්‍රඥප්ති(25)
ධර්මයන් අරමුණු කරති. ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන චිත්තයෝනව
දෙන(9) දසකසිණයන්(10) හා ආනාපාණ සමෘතියට අරමුණුවන
ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්ති මෛත්‍රීකරුණා මුදිතා යන බ්‍රහමවිහාර
යන්ට අරමුණුවන අප්‍රමාණ සත්ව ප්‍රඥප්ති යන තුදුස් වැදෑරුම්
ප්‍රඥප්තිධර්මයන් (14) අරමුණුකරති. රූපපඤ්චමධ්‍යාන චිත්තයෝ
තිදෙන (3) දසකසිණ (10) හා ආනාපාණ සමෘතියට අරමුණුවන
ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්ති හා උපෙක්ෂා බ්‍රහමවිහාරයට අරමුණුවන
අප්‍රමාණ සත්වප්‍රඥප්තියන දොළොස්වැදෑරුම් ප්‍රඥප්ති ධර්මයන් (12)
අරමුණුකරති. මෙහිසාමාන්‍යපඨමධ්‍යානයම ගතයුතු. අභිඥතෘත්‍ය
වත් පචමධ්‍යානයවනාහි අනෙකාංසික ගාථායෙහි එනබව සැලකිය
යුතු. ආකාසානඤ්චා යතන චිත්තයෝ තිදෙන(3) ආකාශ වර්ජිත
නවවිධ(9) කසිණයන් අතුරෙන් එකි එකි කසිණයක් උද්ඝාටනය
කිරීමෙන් ලබනලද ආකාස ප්‍රඥප්තිය අරමුණු කරති. ආකිඤ්ච
ඤ්ඤා යතනචිත්තයෝ තිදෙන(3) ආකාසානඤ්චායතනකුසලක්‍රියා
වන්ගේ අභාව සඞ්ඛ්‍යාත නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණුකරති.
මෙම ප්‍රඥප්ති ආලම්බනයෝ අටවිසිදෙන(28) අර්පනාධ්‍යානයට පමු
ණුවන ආලම්බනයෝයි. අවශෙෂ අනුසමෘතිඅට ආහාරෙ ප්‍රතිකූල
සංඥා චතුධාතුව්‍ය වස්ථානයන දසවිධ (10) ආලම්බනයෝ වනාහි
උපචාරධ්‍යානයටමුත් අර්පනාධ්‍යානයට නොපමුණුවත්. විඥා
නඤ්චායතන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයන්ගේ දෙවැ
දෑරුම් ආලම්බනක් (සමග මෙකී සියළු අරමුණු පිඬුකළවිට සමථ

කාමසඵාතසත් සමසතලිස (40) සම්පූර්ණවනබව දතයුතු. ලො කොත්තර චිත්තයෝ අටදෙන (8) නිර්වාණය අරමුණු කරත්.

—: මෙය ඒකාංශික ආලම්බන විභාගයයි. :—

"විසානුත්තර මුත්තම්හි—පෙ—සත්තධාතවො සංගහො" යනුකී හෙයින් අකුසල් දොළොසය (12) මහාකුසල් මහාක්‍රියා විප්‍රයුක්තඅටය (8) යන චිත්තයෝ සමවිසිදෙන(20)ලෞකික සිත් අසූඑක(81)චෛතසික දෙපනස(52) රූප අටවිස්ස(28) ප්‍රඥප්ති යන ධර්මයන් අරමුණුකරති. සම්ප්‍රයුක්ත මහාකුසල් සතරදෙන(4) කුශලාභිඥවයනචිත්තයෝ පස්දෙන(5)අහීත්මාගීඵලවර්ජිතසිත්අසූහත(87)චෛතසික දෙපනස(52)රූපවිසිඅට (28) නිර්වාණ ප්‍රඥප්ති යන ධර්මයන් අරමුණුකරති. මහාක්‍රියා සම්ප්‍රයුක්ත සතර(4)වොඑපතයක්‍රියාඅභිඥවයන චිත්තයෝ සදෙන(6) සියළු චිත්ත චෛතසික රූප නිර්වාණ ප්‍රඥප්ති ධර්මයන්ම අරමුණු කරති.

—: මේ අනෛකාංශික ආලම්බන විභාගයයි. :—

විප්‍රකාර කුසලක්‍රියා අභිඥවන්ගේ අරමුණු විස්තරවශයෙන් දක්වියයුතු නමුත් විපිප්‍රස්තාරනොදත් අයට අවබොධකරගැනීම දුෂ්කර හෙයින්ද විපිසඞ්ග්‍රහයෙහි විස්තරකරනුලැබෙන හෙයින්ද මෙහි නොදක්වා හැරියෙමු.

"ධාරවිමුත්තාන කඤ්ච පටිසන්ධි—පෙ—ආරම්මණංහොති" යනුකී හෙයින් ධාරවිමුක්ත සිත් එකුන් විස්ස(19)අතීතානානන්තර භවයෙහි ඡවාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නා ලද්දාවූ ප්‍රත්‍යුත්පන්න අතීත ප්‍රඥප්ති කර්ම කර්මනිමිති ගතිනිමිති අතුරෙන් යථාලබ්ධ ආලම්බනයක් අරමුණුකරති එසින් කර්මය අතීත කාලික ධර්මාලම්බනයක් හෙයින් මනොධාරවීපියට අරමුණුවේ. කර්මනිමිත්තෙහි පචාලම්බනය ප්‍රත්‍යුත්පන්න අතීතකාලික වීමෙන් ඡවාරික වීපින්ට අරමුණුවේ. ධර්මාලම්බනයද ප්‍රත්‍යුත්පන්න අතීතකාලිකවීමෙන් මනොධාරවීපින්ටම අරමුණුවේ. ගතිනිමිත්ත වූකලී ප්‍රත්‍යුත්පන්නකාලික රූපාලම්බනමය. එය්ද මනොධාරවීපියටම අරමුණුවේ. අනාගත කාලිකයයි කියා අරමුණක් නොමැතියි. ප්‍රත්‍යුත්පන්න ආලම්බනද මනොධාරයෙහි ප්‍රතිසන්ධි චිත්තයෙන් පසු සතරවෙනි භවාඞ්ග චිත්තය දක්වා ප්‍රත්‍යුත්පන්න ගතිනිමිත්ත අරමුණුවන බවද පඤ්චධාරයෙහි

චිතාංහි ප්‍රතිසන්ධි චිත්තය දක්වා පම්ණක් ප්‍රත්‍යුත්පන්න කර්ම නිමිත්ත අරමුණුවනබවද ආචාර්ය්‍ය සමඞ්ගලසාමි ටීකාචාර්ය්‍යයෝ කියත්. ඒ එසේමය ප්‍රතිසන්ධිවශයෙන් කාම භවයෙන් චුතව කාම භවයටම යාමෙහි කර්ම්බලයෙන් සුප්‍රකට ආලම්බන සම්භවය වන හෙයින් තදාලම්බනයට අනතුරුව චුතිය තදාලම්බනයට අනතුරුව භවාඞ්ගය භවාඞ්ගයට අනතුරුව චුතිය වන මේ දෙවීපිය පමණක් ටීකාචාරීන්ට අභිමතබව පෙනේ. එහෙයින් පඤ්චම පරිච්ඡේද වණ්ණනාටීකායෙහි "තත්‍ථකාමභවතොචවිත්‍වාතත්‍ථෙව උප්පජ්ජමානානං තදාලම්බන පරියොසානානි. සෙසානංජවන පරියොසානානීති ධම්මානුසාරණියං වුත්තං "යි කීහ. මෙහි අර්‍ථ:—තත්‍ථ, ඒ ද්විවිධ වීථීන් අතුරෙන්; කාමභවතො, කාමභවයෙන්; චවිත්‍වා, චුතවී; තත්‍ථෙව, ඒ කාමභවයෙහිම; උප්පජ්ජමානානං, උපදින්නාවූ සත්‍වයන්ට; තදාරම්මණ පරියොසානානි, තදාරම්මණය අවසන් කොටඇති වීථිචිත්තයෝ; හොන්ති, වෙත්. සෙසානං, අවශෙෂ සත්‍වයන්ට; ජවනපරියොසානානි, ජවන අවසන්කොටඇති වීථි චිත්තයෝ; හොන්ති, වෙත්. ඉති, මෙසේ; ධම්මානුසාරණියං, ධම්මානුසාරණියෙහි, වුත්තං, කියනලදී.

ආචාර්ය්‍යවරයෝ තදාරම්මණයට අනතුරුව චුතිය, තදාරම්මණයට අනතුරුව භවාඞ්ගය භවාඞ්ගයට අනතුරුව චුතිය, ජවනයට අනතුරුව චුතිය, ජවනයට අනතුරුව භවාඞ්ගය භවාඞ්ගයට අනතුරුව චුතිය, යන චතුර්විධ වීථියම ප්‍රස්තාරකොට දක්වත්. එම් ආචාර්ය්‍යමතය "තදාලම්බන පරියොසානාය සුඛායවා ජවන වීථියා අනන්තරං භවඞ්ග විසයං ආරම්මණංකත්‍වා චුතිචිත්තං උප්පජ්ජති" යන ප්‍රතිත්‍ය සමුත්පාද විභඞ්ගාර්‍ථකථා පාඨාදියහා ගැළපෙන හෙයින් අතිශය ප්‍රසංසනීයයි. මෙසේ සමහර ප්‍රතිසන්ධි භවාඞ්ග චිත්තයෝ කිසි කාලෙක ප්‍රත්‍යුත්පන්න ආලම්බනද කිසිකලක අතීතාලම්බනද අරමුණුකෙරෙති. සමහර භවාඞ්ග චුතිචිත්තයෝ වනාහි අතීතාලම්බනයන්ම අරමුණුකොරෙති. මෙම වාරවිමුක්ත ආලම්බනයන් යට දක්වූ නමුත් මඳක් විශෙෂ ඇතිවූයෙන් නැවතද දක්වීමු. එහෙයින් මෙය නිතර බෙදීමෙන්ද මෙනෙහි කිරීමෙන්ද යථාභූත අර්‍ථාවබොධය පිණිස උත්සාහ වැඩියයුතු.

තවද තෙවිසිකාම විපාක චිත්තය (23) පඤ්චද්වාරාවර්ජනය හසිතොත්පාදය. යන චිත්තයෝ විසිපස්දෙන (25) කාමධර්මයන් එකාංසික වශයෙන් අරමුණුකරති. හසිතොත්පාද වර්ජිත

කාමජවන වොඨපන අභිඥ සහ චිත්තයෝ එක්ත්‍රිස්දෙන(31)
අනෙකාංසික වශයෙන් අරමුණු කරත්. ම තු ම ත් නෙහිද
මෙසේ සම්පූර්ණකොට යොදා කියයුතු. මහද්ගත ධර්මයන්
එකාංසික වශයෙන් විඤ්ඤාණඤ්චායතන නෙ ව ස ඤ්ඤා
නාසඤ්ඤායතන චිත්තයෝ සදෙනය.(6)අනෙකාංසිකවශයෙන්
සටකියනලද චිත්තයෝඑක්තිස්දෙනය(31)නිර්වාණයඑකාංසිකවශ
යෙන් ලොකොත්තර සිත්අටදෙනය (8) අනෙකාංසික වශයෙන්
සම්ප්‍රයුක්ත මහාකුසල ක්‍රියා අට (8) වොඨපනය අභිඥවයන චිත්
තයෝ එකොළොස්දෙනය(11)නාමධර්ම එකාංසිකවශයෙන් විඤ්ඤා
නඤ්චායතන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ලොකොත්තරචිත්
තයෝ තුදුස්දෙනය (14) අනෙකාංසික වශයෙන් තදාලම්බන කාම
ජවන වොඨපන අභිඥ චිත්තයෝ තිසාලිස්දෙනය(43) රූපධර්ම
ඒකාංසිකවශයෙන් දෙපස් විඥන මනොධාතුයන චිත්තයෝ
තෙලෙස් දෙනය(13) අනෙකාංසික නාමධර්මයෙහිමෙනි. ප්‍රත්‍යුත්
පන්න එකාංසික රූපධර්මයෙහිමෙනි. අනෙකාංසික නාමධර්මයෙහි
මෙනි. අතීත එකාංසික මහද්ගත ධර්මයෙහිමෙනි. අනෙකාංසික නාම
ධර්මයෙහිමෙනි. අනාගත එකාංසිකනොමැතියි. අනෙකාංසික නාම
ධර්මයෙහිමෙනි. කාලවිමුක්තධර්මයන් එකාංසිකවශයෙන්රූපාවචර
ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන ලොකොත්තරයන
එකුන්තිස් දෙනය (29) අනෙකාංසික කාමධර්මයෙහිමෙනි. ප්‍රඥප්ති
ධර්ම එකාංසික වශයෙන් රූපාවචර ආකාසානඤ්චායතන ආ
කිඤ්චඤ්ඤායතන විසිඑක්දෙනය (21) අනෙකාංසික කාමධර්මයෙහි
මෙනි. පරමාර්ථධර්ම එකාංසික වශයෙන් කාමවිපාක පඤ්චද්වාර
වර්ජන හසිතොත්පාද විඤ්ඤානඤ්චායතන නෙවසඤ්ඤා
නාසඤ්ඤා යතන ලොකොත්තරයන චිත්තයෝ එකුන්සාලිස්
දෙනය(39)අනෙකාංසික කාමධර්මයෙහිමෙනි. ආධ්‍යාත්ම එකාංසික
මහද්ගතයෙහිමෙනි. අනෙකාංසික වශයෙන් කාමාවචර අභිඥ
චිත්තයෝසපනසය(56)බහිද්ධා එකාංසිකවශයෙන් රූපාවචර ආකා
සානඤ්චායතන ලොකොත්තරයන සවිස්සය (26) අනෙකාංසික
ආධ්‍යාත්ම ධර්මයෙහිමෙනි. ආධ්‍යාත්ම බහිද්ධා එකාංසික නැත්තේ
ය. අනෙකාංසික ආධ්‍යාත්මයෙහිමෙනි. රූපාරම්මණ එකාංසිකවශ
යෙන් චක්ෂුර්විඥන දෙසිතය(2)අනෙකාංසිකනාමඅනෙකාංසිකයන්
හා මනොධාතුතුන පිඩුකොට සසාලිසය(46)ශබ්දාලම්බනාදියෙහිද
ආරම්මණික මේනසින් දතයුතු. ධර්මාලම්බනය එකාංසිකවශයෙන්
මහද්ගත ලොකොත්තර පන්තිසය(35)අනෙකාංසික නාමධර්මයෙහි
මෙනි. එකඅරමුණක් එකාංසික වශයෙන් දෙපස්විඥන(10)ආකාසා

ඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන කුසල විපාකක්‍රියා විඥානඤ්චා යතන නෙවසංඥා නාසංඥායතන කුසලවිපාක ලොකොත්තරයන අට විසිදෙනය(28) අරමුණුදෙකක් ඒකාංසික වශයෙන් විඤ්ඤාණඤ්චා යතන නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනක්‍රියා දෙසිතය (2) පඤ්ඤා ලම්බනය ඒකාංසික වශයෙන් මනොධාතු තුනය (3) ආලම්බන දොළොසක්(12)ඒකාංසිකවශයෙන් රූපාවචර පඤ්චමධ්‍යානතුනය (3) ආලම්බන තුදුසක් (14) ඒකාංසික වශයෙන් රූපාවචර විතිය තෘතීය චතුර්ථධ්‍යාන සිත්නවදෙනය (9) සවිසි අරමුණක් (26) ඒකාංසිකවශයෙන් රූපප්‍රථමධ්‍යාන චිත්තයෝ තිදෙනය (3).

(පඤ්චවීසකාමෙ. ඡමහග්ගතෙ. අට්ඨනිබ්බානෙ. චුද්දසනාමෙ. තෙරසරූපෙ. තථාපච්චුප්පන්නෙ. ඡාතීතෙ. තථානාගතෙ. විමුත්තෙකූනතිංසති, පඤ්ඤත්තීයමෙකවීසති, පරමත්ථෙ නවතිංස, ඡාජ්ඣත්තෙ, බාහෙය ඡබ්බීසති, වෙ වෙ පඤ්චා ලම්බනෙ, ධම්මෙ පඤ්චතිංසති, අට්ඨවීසෙකම්හි,වෙ වීසු, ති පඤ්චවසු, තථාචාදසෙ, චුද්දසෙනව, තිපඤ්චවීසකෙ,)

අනෙකාංසිකායන්ද සංක්ෂෙපයෙන් පිඩුකොට මෙසේ දතයුතු.

(ඒකතිංසති කාම මහග්ගත විමුත්ත පඤ්ඤත්ති පරමත්ථ පඤ්චකෙ—තිචත්තාළිස පච්චුප්පන්නා තීතානාගත නාමරූප ධම්මාලම්බක ඡයෙක—ඡපඤ්ඤාස අජ්ඣත්තාදිත්තිකෙ—නිබ්බානෙකාදස—ඡචත්තාළීස පඤ්චාලම්බනෙ) තවද ගරුකව අරමුණු ගැනීම් නොගැනීම් වශයෙන් ආරම්මණික චිත්තය දෙවැදෑරුම්. ගරුකරනලද ධර්මයන්ගේ වශයෙන් අරමුණද දෙවැදෑරුම්, එසින්:—

සෙජං තිපාකං කිරියං චතුරූපඤ්ච සෙජිතො,
තිපුඤ්ඤංකාම පුඤ්ඤස්ස සෙජස්සාධිපතීහවෙ,
උත්තරං ඛීසුත්ත එනහං නිබ්බානං උත්තරස්සතු.

මෙහිඅර්ථ-සෙජං,ලොභමූලසිත්අටද(8) තිපාකං,දුක්ඛසහගත කායවිඥාන වර්ජිත ලෞකික විපාක තිස්එකද(31)කිරියං ක්‍රියාවිස්සද(20)චතුරූපඤ්ච,චතුසමුට්ඨානික ඉෂ්ටනිෂ්පන්න රූපඅටළොසද (18)යනමෙය;සෙජිතො,අටවැදෑරුම්(8)ලොභමූල චිත්තයාගේ;අධිපතිහවෙ,ගරුකටයුතු අරමුණුහෙවත් ආරම්මණාධිපතිප්‍රත්‍යයවේ. තිපුඤ්ඤං, සතළොස්(17) ලෞකික කුසලය; කාමපුඤ්ඤස්සච,කාම කුශලයාගේද; සෙජස්සච, ලොභමූල චිත්තයාගේද; අධිපතිහවෙ, ගරුකටයුතු අරමුණු හෙවත් ආරම්මණාධිපතිප්‍රත්‍යයවේ. උත්තාරං,

නවවිධ (9) ලොකොත්තර ධර්‍මය; ධියුත්තට්ඨානං, මහාකුසලක්‍රියා ඥාන සම්ප්‍රයුක්තසිත් අටදෙනාගේ (8) අධිපතිභවෙ, ගරුකටයුතු අරමුණු හෙවත් ආරම්මණාධිපති ප්‍රත්‍යයවේ; මෙසේ කී හෙයින් ලොභමූලසිත් අටදෙන 8) වෙෂමූල මොහමූල දුක්ඛසහගත කාය විඥාන වර්ජිත සසැත්තෑ(76) ලෞකික චිත්තය තත්සම්ප්‍රයුක්ත ඉස්සාමච්ඡරියකුක්කුච්ච විචිකිච්ඡාවර්ජිතසත්සාලිස් චෛතසික(47) චතුසමුට්ඨානික ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස (18) යන නාමරූප ධර්‍මයන් ගරුකොට අරමුණු කරත්. පෘථග්ජනයන්ගේ මහාකුසල් අටදෙන(8) වනාහි ලෞකිකකුසල් සතළොස(17) ගරුකොට අරමුණු කරත්. ශ්‍රොතාපන්න පුද්ගලයාගේ මහාකුසල් සම්ප්‍රයුක්ත සිත් සතර(4)දෙන වනාහි ස්වකීය ශ්‍රොතාපත්තිමාර්ගඵල නිර්‍වාණද එසේම සකෘදාගාමි අනාගාමි පුද්ගලයන්ගේ මහාකුසල් සම්ප්‍රයුක්ත සිත් සතර(4)දෙන ස්වකීයමාර්ගඵලනිර්‍වාණද ගරුකොට අරමුණුකරත්. රහතන්වහන්සේගේ ක්‍රියා සම්ප්‍රයුක්තසිත් සතර(4)දෙන වනාහි ස්වකීය අර්හත් මාර්ගඵල නිර්‍වාණ ගරුකොට අරමුණු කරත්. මෙසේ කුසලක්‍රියාසම්ප්‍රයුක්ත අටදෙන(8) නවවිධ(9) ලොකොත්තරධර්‍මයන් ගරුකොට අරමුණු කරත්. ලොකොත්තරසිත් අටදෙන(8) වනාහි නිර්‍වාණයම ගරුකොට අරමුණු කරත්. තවද රූපාලම්බනයම අරමුණුකොට ශබ්දාලම්බනය අරමුණු නොකරන, ශබ්දාලම්බනයම අරමුණුකොට රූපාලම්බනය අරමුණු නොකරන, දෙකම(2) අරමුණු කරන, දෙකම(2) අරමුණු නොකරන, යනාදි වශයෙන් ෂඩාලම්බනයද, කාමධර්‍ම අරමුණුකොට මහද්ගත ධර්‍ම අරමුණු නොකරන මහද්ගතධර්‍ම අරමුණුකොට කාමධර්‍ම අරමුණු නොකරන, දෙකම (2) අරමුණු කරන දෙකම(2) අරමුණුනොකරන යනාදී වශයෙන් යටදැක්වූ පිළිවෙළ නොසික්මවාද මූල මූලිකතබාංගෙන බෙදනු. ග්‍රන්ථ ගරු බියෙන් නොකියා හැරියෙමු.

"තෙසංදානියථාරහං—පෙ—සඞ්ගහොනාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදිය යුතු. කෙසේද?යත්. චෛතසික දෙපනස (52) අතුරෙන් අකුසල චෛතසිකයෝ තුදුස්දෙන (14) ලෞකිකයෝම්ය, ඊර්ෂ්‍යා අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසිකයෝ එකුන් පනස්දෙන (49) ආධ්‍යාත්ම ධර්‍මයන් අරමුණුකරති. විරති චෛතසිකයෝ තිදෙන (3) විරමිතව්‍ය වස්තුයයි සම්මත ප්‍රත්‍යොත්පන්න අනාගත කාලික කාම නාමරූපධර්‍මයන් අරමුණු කරති අප්‍රමාණ්‍යයෝ කාලවිමුක්ත ප්‍රඥප්තිධර්‍ම අරමුණු කරති. ඉතුරු චෛතසිකයෝ තෙතිස්දෙන (32) සියළු ධර්‍මයන්ම අරමුණු

කරති. ලොකොත්තර චිත්තයහා සම්ප්‍රයුක්තවූ සමුච්ඡෙද විරතිත්‍රය චතාහි නිර්වාණ සඞ්ඛ්‍යාත අප්‍රමාණ කාලවිමුක්ත ධර්මය අරමුණු කරති.

## —: ආරම්මණ සඞ්ග්‍රහයයි. :—

චක්ඛු ශ්‍රොත ඝ්‍රාණ ජිව්හා කාය හෘදය සඞ්ඛ්‍යාත සයවැදෑරුම් වස්තුරූප අතුරෙන් ඝ්‍රාණජිව්හා කාය යන වස්තුරූපත්‍රිකය පසළොස් වැදෑරුම් රූපාවචර භූමින්හි නොලැබේ. අරූතල අසංඥ තලයන්හි චතාහි වස්තුරූප ෂට්කයම නැත්තේය. "තත්‍ර පඤ්චවිඤ්ඤාණ ධාතුයො—පෙ—ආරුප්ප විපාක වසෙන හදයං අනිස්සායෙව" යයිකී හෙයින් චක්ෂුර්විඥාන ධාතු මය චක්ෂු වස්තුරූපය නිශ්‍රයකොටගෙනම උපදනේය.—පෙ—කායවිඥාන ධාතුවය කායවස්තුරූපය නිශ්‍රයකොට ගෙනම උපදනේය. මනොධාතු තුනද ද්වෙෂමූල සන්තීරණ හසිතොත්පාද මහාවිපාක රූපාවචර චිත්ත ශ්‍රොතාපත්ති මාර්ගී සඞ්ඛ්‍යාත මනොවිඥාන ධාතු සමතිසද යන සිත් තෙතිස්දෙන හෘදය වස්තු රූපය නිශ්‍රයකොට ගෙනම උපදී. ලොභමූල මොහමූල මනොවාරා වජ්ජන මහාකුසල ක්‍රියා සමඟ අතිරික්ත ලොකොත්තර සිත් සතද යන මනොවිඥාණ සිත් දෙසාළිස්දෙන සවිසි පඤ්චවොකාර භූමින්හි උපදිනවිට හෘදයවස්තු රූපය නිශ්‍රයකොටගෙන උපදිති. චතුවොකාර භූමින්හි උපදිනවිට නිශ්‍රය වස්තුරූප රහිතව උපදිත්. අරූප විපාකයෝ සතරදෙන චතාහි වස්තුරූප නිශ්‍රය රහිතවම උපදිති.

තවද- "ඡවත්ථුංනිස්සාතාකාමෙ—පෙ—ධාතෙකා නිස්සිතාමතා" යනුකී හෙයින් එකොළොස් වැදෑරුම් කාමාවචර භූමියෙහි සප්ත විඥාන ධාතු අසූදෙන යථාහිවශයෙන් වස්තුරූපයන් සදෙන නිශ්‍රයකොටගෙන උපදිති. පසළොස් වැදෑරුම් රූපාවචර භූමියෙහි චතුර්විධවිඥානධාතු එකුන්සත්තෑදෙන යථාහිවශයෙන් ත්‍රිවිධ වස්තුරූපයන් නිශ්‍රයකොටගෙන උපදිති. චතුර්විධ අරූපාවචරභූමියෙහි මනොවිඥාන ධාතු සසාළිස්දෙන වස්තුරූපයක්නිශ්‍රයකොට නොගෙනම උපදිති. තවද "තෙ චත්තාළීස නිස්සාය—පෙ—පාකාරුප්පං අනිස්සිතා" යන ගාථා ගතක්‍රමයෙන්ද බෙදනු. "තෙසංඥනි යථාරහං—පෙ—සඞ්ගහොතාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදියයුතු. කෙසේද? යත් සර්වචිත්ත සාධාරණයෝ සත්දෙන පඤ්චවොකාර භූමින්හි උපදිනවිට වස්තුරූප නිශ්‍රය ඇතිවම උපදිති. අරූපාවචර භූමියෙහි උපදිනවිට

නිශ්‍රය වස්තුරූප රහිතවම උපදිති. ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කුක්කුච්ච යන චෛතසිකයෝ සතරදෙන හෘදය වස්තුරූපය නිශ්‍රය නොටගෙනම උපදිති. අතිරික්ත චෛතසිකයෝ එක්සාලිස්දෙන පඤ්චවොකාරයෙහි හෘදය වස්තුරූපය නිශ්‍රයකොටගෙන උපදිති. අරූපාවචර භූමියෙහි උපදිනවිට වස්තුරූප නිඃශ්‍රය රහිතවම උපදිත්. සියාසත්තවිඤ්ඤාණ ධාතුයො ඡවත්ථු නිස්සිතා හදය මෙව චතුබ්බිධා එකතාලීස සියාවත්ථු නිස්සිතා.

—: වස්තු සඞ්ග්‍රහයයි. :—

මෙය ප්‍රකීර්ණක සඞ්ග්‍රහයෙහි අමිශ්‍ර විභගයි. මිශ්‍රවශයෙන් වනාහි ලොභමූල සිත් අටදෙන සොම්නස් උපෙක්ෂා යන විවිධ වෙදනාවන් සමගද ලොභමොහ යන විවිධ හෙතූන් සමගද යෙදේ. ජවන කෘත්‍යය කරති. චක්ෂුරාදී සදොරෙහිම උපදිති. ලෞකික ධර්ම අරමුණුකරති. කිසිකලෙක හෘදය වස්තුව නිශ්‍රය කොට ගෙනද කිසිකලෙක නිශ්‍රයකොට නොගෙනද උපදිති. මේ ක්‍රමයෙන් අභිත්ඵල චිත්තය දක්වා බෙදනු. "තෙසංදානි යථා රහං—පෙ—සඞ්ගහො නාම නීයතෙ" යනුකී හෙයින් චෛතසිකද බෙදිය යුතු. කෙසේද? යත් ඵස්ස චෛතසිකයතෙම වෙදනා පඤ්චකයමසමග යෙදේ. කිසිකලෙක හෙතු ෂට්කය සමග යෙදේ කිසිකලෙක හෙතු විප්‍රයුක්තවේ. තුදුස් කෘත්‍යයම කරයි. කිසිකලෙක ෂට්වාරිකද කිසිකලෙක ඡවාර විමුක්තදවේ. සකල ධර්මය යන්ම අරමුණුකරයි. කිසිකලෙක ෂට්වස්තුකවද කිසිකලෙක අවස්තුකවද උපදී. වෙදනා තොමෝ කිසිම වෙදනාවක් සමග නොයෙදේ. හෙත්වාදී ධර්මයෝද සංඥාදි ධර්මයෝද ඵස්සය හා සමානයහ. විතර්කය වෙදනා හෙතුවාර ආරම්මණවශයෙන් ඵස්සය හා සසමානයි. කෘත්‍යකවයක් කරයි. කිසිකලෙක හෘදය වස්තු රූපය නිශ්‍රයකොට ගෙනද කිසිකලෙක නිශ්‍රයකොට නොගෙනද උපදී. මේආදී වශයෙන් ප්‍රභෙදක්‍රිය දක්වා බෙදනු.

—: මේ සවෙනි ප්‍රකීර්ණක සඞ්ග්‍රහනයයි. :—

**වේදනා සඞ්ග්‍රහ හෙතු සඞ්ග්‍රහ දෙක්හි ස්වරූප විභාගනය.**

**කොටුපුරවා ගණන් ලියනු.**

| | සුඛ සහගත සිත් 63 | දුක්ඛ සහගත ,, 3 | උපෙක්ඛා සහගත ,, 55 | අහෙතුක ,, ,, 18 | සහෙතුක ,, ,, 71 | එකහෙතුක ,, ,, 2 | ද්විහෙතුක ,, ,, 22 | ත්‍රිහෙතුක ,, ,, 47 |
|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් … | | | | | | | | |
| අහෙතුක සිත් … | | | | | | | | |
| අසොභන සිත් .. | | | | | | | | |
| කාමසොභන සිත් … | | | | | | | | |
| කාම සිත් … | | | | | | | | |
| රූප සිත් … | | | | | | | | |
| අරූප සිත් … | | | | | | | | |
| මහද්ගත සිත් … | | | | | | | | |
| ලොකිය සිත් … | | | | | | | | |
| සංක්ෂෙපලොකොත්තර සිත්… | | | | | | | | |
| එම විස්තාර සිත් … | | | | | | | | |
| සංක්ෂෙප සිත් … | | | | | | | | |
| එම විස්තාර සිත් … | | | | | | | | |

## වේදනා සඞ්ග්‍රහ හෙතු සඞ්ග්‍රහ දෙක්හි ස්වරූප විභාගනය.

### කොටුපුරවා ගණන් ලියනු.

| | සුඛසහගත සිත් 63 | දුඃඛසහගත " 3 | උපෙක්ඛාසහගත " 55 | අහෙතුක " 18 | සහෙතුක " 71 | එකහෙතුක " 2 | ද්විහෙතුක " 22 | ත්‍රිහෙතුක " 47 |
|---|---|---|---|---|---|---|---|---|
| ලොභමූල සිත් ... | | | | | | | | |
| වෙෂමූල " ... | | | | | | | | |
| මොහමූල " ... | | | | | | | | |
| මහාකුසල් " ... | | | | | | | | |
| මහාවිපාක " ... | | | | | | | | |
| මහාක්‍රියා " ... | | | | | | | | |
| කාමකුසල් " ... | | | | | | | | |
| කාමවිපාක " ... | | | | | | | | |
| කාමක්‍රියා " ... | | | | | | | | |
| ලොකියකුසල් " ... | | | | | | | | |
| ලොකියවිපාක " ... | | | | | | | | |
| ක්‍රියා " ... | | | | | | | | |
| සංක්ෂෙප කුසල් " ... | | | | | | | | |
| එම විස්තාර " ... | | | | | | | | |
| සංක්ෂෙප විපාක " ... | | | | | | | | |
| එම විස්තාර " ... | | | | | | | | |

## කිච්ච සඞ්ග්‍රහ සරූප විභාගනය.

කොටුපුරවා ගණින් ලියනු.

| | ප්‍රති සන්ධි කෘත්‍යවත් සිත් 19 | භවංගකෘත්‍යවත් 19 | ආවජ්ජන කෘත්‍යවත් 2 | දශීන-ශ්‍රවණ-ඝායන | සායන-ඵුසන | සම්පටිච්ඡන කෘත්‍යවත් | සිත්ද දෙක බැගිනි 2 |
|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් ... | | | | | | | |
| අහෙතුක „ ... | | | | | | | |
| අසොභන „ ... | | | | | | | |
| කාමසොභන „ ... | | | | | | | |
| කාම „ ... | | | | | | | |
| රූප „ ... | | | | | | | |
| අරූප „ ... | | | | | | | |
| මහද්ගත „ ... | | | | | | | |
| ලොකිය „ ... | | | | | | | |
| සංක්‍ෂෙපලොකුත්තර „ ... | | | | | | | |
| එම විසතාර „ ... | | | | | | | |
| සංක්‍ෂෙප „ ... | | | | | | | |
| එම විස්තාර „ ... | | | | | | | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | සන්තීරණ කෘත්‍යවත් | සිත් | 3 |
| | | | | | | | | | | | | | වොඩ්ඨපන කෘත්‍යවත් | „ | 1 |
| | | | | | | | | | | | | | ජවන කෘත්‍යවත් | „ | 55 |
| | | | | | | | | | | | | | තදාරම්මණ කෘත්‍යවත් | „ | 11 |
| | | | | | | | | | | | | | චුතිකෘත්‍යවත් | „ | 19 |
| | | | | | | | | | | | | | එකකෘත්‍යවත් | „ | 68 |
| | | | | | | | | | | | | | ද්විකෘත්‍යවත් | „ | 2 |
| | | | | | | | | | | | | | ත්‍රිකෘත්‍යවත් | „ | 9 |
| | | | | | | | | | | | | | චතුකෘත්‍යවත් | „ | 8 |
| | | | | | | | | | | | | | පඤ්චකෘත්‍යවත් | „ | 2 |

| කිච්චසඞ්ගහ ස්වරූප විභාගනය. කොටුපුරවා ගණන් ලියනු. | ප්‍රතිසන්ධි කෘත්‍යයන් 19 | භවාඞ්ග කෘත්‍යයන් 19 | ආවර්ජන කෘත්‍යයන් 2 | දර්ශන ශ්‍රවණ | ඝායන සායන | ස්පර්ශන සම්පටිච්ඡන | කෘත්‍යයන් සිත් | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|
| ලෝභමූල සිත්.. | | | | | | | | |
| ද්වේෂමූල ,, ... | | | | | | | | |
| මෝහමූල ,, ... | | | | | | | | |
| මහාකුසල් ,, ... | | | | | | | | |
| මහාවිපාක ,, .. | | | | | | | | |
| මහාක්‍රියා ,, ... | | | | | | | | |
| කාමකුසල් ,, ... | | | | | | | | |
| කාමවිපාක ,, ... | | | | | | | | |
| කාමක්‍රියා ,, ... | | | | | | | | |
| ලෞකිය කුසල් ,, ... | | | | | | | | |
| ලෞකිය විපාක ,, ... | | | | | | | | |
| ක්‍රියා ,, ... | | | | | | | | |
| සංක්ෂේප කුසල් ,, ... | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | |
| සංක්ෂේප විපාක ,, ... | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | |

| | | |
|---|---|---|
| සන්තීරණ කෘත්‍යවත් සිත් | | 3 |
| වොඃප්පන කෘත්‍යවත් | ,, | 1 |
| ජවන කෘත්‍යවත් | ,, | 55 |
| තදාරම්මණ කෘත්‍යවත් | ,, | 11 |
| චුති කෘත්‍යවත් | ,, | 19 |
| එකකෘත්‍යවත් | ,, | 68 |
| ද්විකෘත්‍යවත් | ,, | 2 |
| ත්‍රිකෘත්‍යවත් | ,, | 9 |
| චතුකෘත්‍යවත් | ,, | 8 |
| පඤ්චකෘත්‍යවත් | ,, | 2 |

## වාර සඞ්ග්‍රහ සවරූප විභාගනය.

### කොටුපුරවා ගණන් ලියනු.

| | චක්ඛුවාරික සිත් 46 | සොතවාරික ,, 46 | ඝානවාරික ,, 46 | ජිව්හාවාරික ,, 46 | කායවාරික ,, 46 | මනොවාරික ,, 67 | වාරවිමුක්ත ,, 19 | එකවාරික ,, 36 | පඤ්චවාරික ,, 3 | ඡවාරික ,, 31 | ඡවාරික වාරවිමුක්ත ,, 10 | ඒකාන්තවාර විමුක්ත ,, 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල් සිත් ... | | | | | | | | | | | | |
| අහෙතුක ,, ... | | | | | | | | | | | | |
| අසොභන ,, ... | | | | | | | | | | | | |
| කාමසොභන ,, ... | | | | | | | | | | | | |
| කාම ,, ... | | | | | | | | | | | | |
| රූප ,, ... | | | | | | | | | | | | |
| අරූප ,, ... | | | | | | | | | | | | |
| මහද්ගත ,, ... | | | | | | | | | | | | |
| ලොකිය ,, ... | | | | | | | | | | | | |
| සංක්‍ෂෙපලොකුත්තර... | | | | | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | | | | | |
| සංක්‍ෂෙප සිත් ... | | | | | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | | | | | |

## ද්වාර සඞ්ග්‍රහ ස්වරූප විභාගනය.

කොටුපුරවා ගණන් ලියනු.

| | චක්ඛුද්වාරික සිත් 46 | සොතද්වාරික ,, 46 | ඝානද්වාරික ,, 46 | ජිව්හාද්වාරික ,, 46 | කායද්වාරික ,, 46 | මනොද්වාරික ,, 67 | ද්වාරවිමුක්ත ,, 19 | එකද්වාරික ,, 36 | පඤ්චද්වාරික ,, 3 | ඡද්වාරික ,, 31 | ඡද්වාරිකද්වාරවිමුත් ,, 10 | එකාන්තද්වාරවිමුත් ,, 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලොභමූල සිත් ... | | | | | | | | | | | | |
| ද්වෙෂමූල ,, ... | | | | | | | | | | | | |
| මොහමූල ,, ... | | | | | | | | | | | | |
| මහාකුසල් ,, ... | | | | | | | | | | | | |
| මහාවිපාක ,, ... | | | | | | | | | | | | |
| මහාක්‍රියා ,, ... | | | | | | | | | | | | |
| කාමකුසල් ,, ... | | | | | | | | | | | | |
| කාමවිපාක ,, ... | | | | | | | | | | | | |
| කාමක්‍රියා ,, ... | | | | | | | | | | | | |
| ලොකිය කුසල් ,, ... | | | | | | | | | | | | |
| ලොකිය විපාක ,, ... | | | | | | | | | | | | |
| ක්‍රියා ,, ... | | | | | | | | | | | | |
| සංක්ෂෙප කුසල් ,, ... | | | | | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | | | | | |
| සංක්ෂෙප විපාක ,, ... | | | | | | | | | | | | |
| එම විස්තාර ,, ... | | | | | | | | | | | | |

## ආලම්බන සඞ්ගහ

### සඞරූප විභාගනය.

කොට්ඨපුරවං

ගණන්ලියනු.

| | අකුසල් සිත් 12 | අහෙතුක „ 18 | අසොභන „ 30 | කාමසොභන „ 24 | කාම „ 54 | රූප „ 15 | අරූප „ 12 | සංක්ෂෙපලොකුත් „ 8 | එම විස්තාර „ 40 | සංක්ෂෙපසොභන „ 59 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පඤ්චවීසකාමෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| ඡමහගගතෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| අට්ඨනිබ්බානෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| චුද්දසනාමෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| තෙරසරූපෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| තථාපච්චුප්පන්නෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| ඡඅතීතෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| විමුත්තෙඑකූනතිංස ... | — | — | — | — | — | — | — | — | — | — |
| පඤ්ඤත්තියංඑකවීස ... | — | — | — | — | — | — | — | — | — | — |
| පරමත්ථෙනවතිංස ... | — | — | — | — | — | — | — | — | — | — |
| ඡඅජ්ඣත්තෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| බාහ්‍යෙඡබ්බීස ... | — | — | — | — | — | — | — | — | — | — |
| වෙවෙපඤ්චවසු ... | — | — | — | — | — | — | — | — | — | — |
| ධම්මෙපඤ්චතිංස ... | — | — | — | — | — | — | — | — | — | — |
| අඨවීසඑකම්හි ... | — | — | — | — | — | — | — | — | — | — |
| ඡෙවිසු ... | — | — | — | — | — | — | — | — | — | — |
| තීණිපඤ්චවසු ... | — | — | — | — | — | — | — | — | — | — |
| තීණිවාංදසෙ .. | — | — | — | — | — | — | — | — | — | — |
| නවචුද්දසෙ ... | — | — | — | — | — | — | — | — | — | — |
| තීණිපඤ්චවීසතියං ... | — | — | — | — | — | — | — | — | — | — |
| එකනානාරම්මණිකා ... | — | — | — | — | — | — | — | — | — | — |

| | | |
|---|---|---|
| එම විසතාර | සිත් | 91 |
| සංක්ෂෙප | ,, | 81 |
| එම විසතාර | ,, | 121 |
| සංක්ෂෙපකුසල් | ,, | 21 |
| එම විස්තාර | ,, | 37 |
| සංක්ෂෙපවිපාක | ,, | 36 |
| එම විස්තාර | ,, | 52 |
| ක්‍රියා | ,, | 20 |
| සචිත්තකෘ-චෛතසික | | 7 |
| ප්‍රකීර්ණක | ,, | 6 |
| අන්‍යසමාන | ,, | 13 |
| අකුසල | ,, | 14 |
| සොභනසාධාරණ | ,, | 19 |
| සොභන | ,, | 25 |
| නියතයොගී | ,, | 41 |
| අනියතයොගී | ,, | 11 |
| සියලු චෛතසික | ,, | 52 |

| ආලම්බනසඞ්ග්‍රහ ස්වරූප විභාගය<br>කොටු පුරවා ගණන් ලියනු. | අකුසල් සිත් 12 | අහේතුක ,, 18 | අසෝභන ,, 30 | කාමසෝභන ,, 24 | කාම ,, 54 | රූප ,, 15 | අරූප ,, 12 | සංක්ෂේපලෝකෝත්තර ,, 8 | ධම විස්තාර ,, 40 | සංක්ෂේපයෝගය ,, 59 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාම අනේකාං ... | | | | | | | | | | |
| මහග්ගත ... | | | | | | | | | | |
| නිර්වාණ ... | | | | | | | | | | |
| නාම ... | | | | | | | | | | |
| රූප ... | | | | | | | | | | |
| ප්‍රත්‍යුත්පන් ... | | | | | | | | | | |
| අතීත ... | | | | | | | | | | |
| අනාගත ... | | | | | | | | | | |
| කාලවිමුක්ත ... | | | | | | | | | | |
| ප්‍රඥප්ති ... | | | | | | | | | | |
| පරමාර්ථ ... | | | | | | | | | | |
| ආධ්‍යාත්ම ... | | | | | | | | | | |
| බහිද්ධා ... | | | | | | | | | | |
| පඤ්චාරම්මණ. | | | | | | | | | | |
| ධම්මාරම්මණඅනේකාංසික.. | | | | | | | | | | |
| සර්වඅනේක .. | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | එම විස්තාර | සිත් 91 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සංක්ෂේප | „ 89 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | එම විස්තාර | „ 121 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සංක්ෂේපකුසල් | „ 21 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | එම විස්තාර | „ 37 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සංක්ෂේපවිපාක | „ 36 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | එම විස්තාර | „ 52 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | ක්‍රියා | „ 20 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සබ්බචිත්තසා-චෛතසි | „ 7 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | ප්‍රකීර්ණක | „ 6 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | අන්‍යසමාන | „ 13 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | අකුශල | „ 14 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සෝභනසාධාරණ | „ 19 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සෝභන චෛතසික | „ 25 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | නියතයෝගී | „ 41 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | අනියතයෝගී | „ 11 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | සියලු චෛතසික | „ 52 |

| වස්තු සඞ්ග්‍රහ ස්වරූප විභාගනය. කොටු පුරවා ගණන් ලියනු. | අකුසල් සිත් | අහේතුක ,, | අසෝභන ,, | කාමසෝභන ,, | කාම ,, | රූප ,, | අරූප ,, | මහග්ගත ,, | ලෝකිය ,, | සංක්ෂේප මාර්ග ,, |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| චක්ඛුවස්තුක සිත් | | | | | | | | | | |
| සොතවස්තු ,, . | | | | | | | | | | |
| ඝාණවස්තු ,, . | | | | | | | | | | |
| ජිව්හා වස්තු ,, . | | | | | | | | | | |
| කායවස්තු ,, . | | | | | | | | | | |
| හෘදයවස්තුක නිත්‍ය ,, . | | | | | | | | | | |
| හෘදයවස්තුක අනිත්‍ය ,, . | | | | | | | | | | |
| වස්තුරූප අනිඃශ්‍රිත ,, . | | | | | | | | | | |
| නිත්‍යනිඃශ්‍රිත ,, . | | | | | | | | | | |
| නිත්‍යඅනිඃශ්‍රිත, . | | | | | | | | | | |
| සඞ්කාරඅනිඃශ්‍රිත | | | | | | | | | | |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | එම විස්තාර | සිත් |
| | | | | | | | | | | | සංක්‍ෂෙපඵල | ” |
| | | | | | | | | | | | එම විස්තාර | ” |
| | | | | | | | | | | | සංක්‍ෂෙප ලොකුත්තර | ” |
| | | | | | | | | | | | එම විස්තාර | ” |
| | | | | | | | | | | | සංක්‍ෂෙප සොභන | ” |
| | | | | | | | | | | | එම විස්තාර | ” |
| | | | | | | | | | | | සංක්‍ෂෙප | ” |
| | | | | | | | | | | | එම විස්තාර | ” |
| | | | | | | | | | | | සබ්බචිත්තසා- චෛතසික | ” |
| | | | | | | | | | | | ප්‍රකීර්ණක | ” |
| | | | | | | | | | | | අන්‍යසමාන | ” |
| | | | | | | | | | | | අකුසල චෛතසික | ” |
| | | | | | | | | | | | සොභන සාධාරණ | ” |
| | | | | | | | | | | | සොභන චෛතසික | ” |
| | | | | | | | | | | | නියතයොගී | ” |
| | | | | | | | | | | | අනියතයොගී | ” |
| | | | | | | | | | | | සියලු චෛතසික | ” |

මෙතැන්පටන් **වීථි සංග්‍රහ නය** කියනු ලැබේ.

"වීයන්ති ගච්ඡන්ති සත්තා එත්ථාතිවීථි" "වීථිවියාතිවීථි" යනු නිර්වචන හෙයින් මනුෂ්‍යයන් ගමනාගමනය කරන 'වීථි' තොමෝ පිළිවෙළින් පිහිටි ගම්පෙළ නොඉක්මවා වැටී යන්නාක් මෙන් නියාමධර්මවූ පරිදි උපදින චිත්ත පරම්පරා තොමෝද මනුෂ්‍යයන් ගමනා ගමනය කරන 'වීථි'යකට බඳුවූ හෙයින් 'වීථි' නම්වේ—ඒ 'වීථි' තොමෝ **පඤ්චද්වාර වීථි මනොද්වාර** වීථි වශයෙන් දෙවැදෑරුම්වේ. එයින් **පඤ්චද්වාර** වීථි තොමෝද **චක්ෂුද්වාර** වීථිය **ශ්‍රොත්‍රද්වාර** වීථිය **ඝ්‍රාණද්වාර** වීථිය **ජිව්හාද්වාර** වීථිය **කායද්වාර** වීථියයි කියා පස්(5)වැදෑරුම්වේ.

එයින් චක්ෂුද්වාර වීථි තොමෝ **අතිමහන්තා ලම්බන** වීථි එකය (1) **මහන්තාලම්බන** වීථි දෙකය (2) **පරිත්තා ලම්බන** වීථි සයය (6) **අතිපරිත්තා ලම්බන** වීථි සයය (6) යි කියා මෙසේ පසළොස් (15) වැදෑරුම්වේ.

එයින් රූපාලම්බන චක්ෂුඃ ප්‍රසාදයන්ගේ අන්‍යොන්‍ය අභිමුඛව ඉපදීමෙහි පටන් අතීතභවඞ්ග භවඞ්ග චලන භවඞ්ගුපච්ඡේද පඤ්චද්වාරාවර්ජන චක්ෂුර්විඥාන සම්පටිච්ඡන සන්තිරණ වොඨපන ජවන සත්වරක් තදාලම්බන දෙවරක් තදනන්තරයෙහි යථාරත භවඞ්ග පාතයවී රූපාලම්බනචක්ෂුඃ ප්‍රසාදයන් සප්තරසා ශුෂ්කාවීමෙන් ද්විතීය තදාලම්බනයාගේ භඞ්ග ක්ෂණයෙහි නිරුද්ධවන වීථිය **අතිමහන්තා ලම්බන වීථි** නම්වේ. අතීත භවඞ්ග දෙවරක් තුන්වරක්වී තදාලම්බනය නොව භවඞ්ගයම වීමෙන් රූපාලම්බන චක්ෂුඃ ප්‍රසාදයන් ප්‍රථම භවඞ්ගයාගේ භඞ්ගක්ෂණයෙහිද සප්තම ජවනයාගේ භඞ්ගක්ෂණයෙහිද නිරුද්ධවන දෙවීථිය (2) **මහන්තා ලම්බන වීථි** නම්වේ.

අතීත භවඞ්ගය පිළිවෙළින් සතරවර පස්වර සවර සත්වර අටවර නවවර දක්වාද වොඨපනය දෙවරක් සහ තුන්වරක්ද වීමෙන් ජවනපතනයනොව භවඞ්ගපතනයම වීමෙන් රූපාලම්බන චක්ෂුඃ ප්‍රසාදයන් පඤ්චම භවඞ්ගයාගේ භඞ්ගක්ෂණයෙහිද චතුර්ථ තෘතීය ද්විතීය ප්‍රථම භවඞ්ගයන්ගේ භඞ්ගක්ෂණයෙහිද ද්විතීය තෘතීය වොඨපනයන්ගේ භඞ්ගක්ෂණයෙහිද නිරුද්ධවන සවීථිය (6) **පරිත්තා ලම්බන වීථි** නම්වේ.

අතීත භවඞ්ගය පිළිවෙළින් දසවර එකොළොස්වර දොළොස්වර තෙළෙස්වර තුදුස්වර පසළොස්වර දක්වාද භවඞ්ග චලනය

දෙවරක්ද වීමෙන් වීථි චිත්ත පතනය නොව භවඞ්ගපතනයමවී රූපාලම්බන චක්ෂුඃ ප්‍රසාදයන් පඤ්චම භවඞ්ගයාගේ භඞ්ගක්ෂණ යෙහිද චතුර්ථ තෘතීය ද්විතීය ප්‍රථම භවඞ්ගයන්ගේ භඞ්ගක්ෂණ යෙහිද ද්විතීය භවඞ්ග චලනයාගේ භඞ්ගක්ෂණයෙහිද නිරුද්ධවන සවීථිය (6) අතිපරිත්තාලම්බන වීථිනම්වේ. ශ්‍රොත්‍රඝ්‍රාණ ජිව්හා කායද්වාර වීථිහුද මේ නයින් පසළොස පසළොස බැගින් වන්නා හුය. ඒ සියළු වීථි පිඩුකළවිට පන්සැත්තෑව(75) කි.

සද්දංපඨම චිත්තෙනතා තීතං දුතීය චෙතසා,
නාමංතතීය චිත්තෙන අත්ථංචතුත්ථචෙතසා.

යනු අර්ථ කථා හෙයින් මෙසේ කියනලද එකි එකී පඤ්චද්වාර වීථියකටඅනතුරුව තදනුවර්තක මනොද්වාර වීථි සහ සුද්ධ මනොද්වාර වීථි ද සුදුසු පරිද්දෙන් වනබව දතයුතු.

"පඤ්චසන්තති වීථී පඤ්චද්වාරෙ චතුපඤ්ඤාසචිත්තානි කාමාවචරා නෙව පුබ්බාපරභවඞ්ගානි කම්ම කම්ම නිමිත්තාදි එකෙකාලම්බනානි සෙසානි පච්චුප්පන්න පඤ්චාලම්බනානි පඤ්චවිඤ්ඤාණං පසාදවත්ථුකං සෙසමතීතානන්තර හදය වත්ථුකං කාමාවචරෙ ඝානාදි තිවත්ථුකාචෙව අතිමහන්තාලම්බනාච සත්තතාලිස වීථියො පඤ්චවොකාරෙ අට්ඨවීසති සබ්බාපි පුග්ගලට්ඨකෙ."

මේ සූත්‍ර පදානුසාරයෙන් ඒ පන්සැත්තෑ (75) වීථින්ගේ චිත්තස්වරූප ආරම්මණ නිශ්‍රය වස්තු භූමි පුද්ගල භෙද දතයුතු. කෙසේද?යත්. පඤ්චද්වාරාවර්ජනය ආදි කොට තදාලම්බනය අවසානකොට ඇත්තාවූ සියළු වීථිචිත්තයෝම සිවුපනස්(54)වැදෑරුම් කාමාවචර චිත්තයෝය. පූර්වාපර භවඞ්ගයෝ ස්වකීය ස්වකීය ප්‍රතිසන්ධි චිත්තය හා භූමිජාති [illegible]ප්‍රයුක්ත ධර්ම සංස්කාර ආරම්මණ වශයෙන් සමාන හෙයින් අතීතානන්තර භවයෙහි ජවාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නාලද්දාවූ කම් කම්නිමිති ගතිනිමිති අතුරෙන් යම් ඒ ලබනලද අරමුණක එල්බගෙන උපදින්නෝය. පඤ්චද්වාරාවර්ජනාදි වීථි චිත්තයෝ අතීත භවඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි ඉපිද භවඞ්ග චලනක්ෂණයෙහි ද්වාර ඝට්ටණවූ මධ්‍යමායුෂ්ක ප්‍රත්‍යුත්පන්න පඤ්චාලම්බනය අරමුණු කෙරෙති. නිශ්‍රය වශයෙන් දෙපස් විඥානයෝ අතීත භවඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි උපන්නාවූ පඤ්ච ප්‍රසාද වස්තුරූප නිශ්‍රයකර ගනිති. අවශෙෂ සියළු චිත්තයෝම ස්වකීය ස්වකීය අතීතානන්තර චිත්තය සමඟ උපන්නාවූ හෘදය වස්තුරූප නිශ්‍රය කරගනිති. භූමිවශයෙන් චක්ෂුශ්‍රොත්‍ර දෙදෙර උපදනාවූ අතිමහන්තා

ලම්බන දෙවීථිය(2) ඝ්‍රාණජිව්හා කාය යන තුන්දොර උපදනාවූ පන්සාලිස්(45)වීථිය යනමේ සත්සාලිස්(47)වීථිහු එකොළොස්(11) වැදෑරුම් කාමාවචරයෙහි උපදිති. මෙහි තදාලම්බන පතනය නොවන අතිමහන්තා ලම්බන වීථි රූපාවචරයෙහිද ලැබෙනබව දතයුතු. හුදෙක් කාමාවචරය සඳහාම අතිමහන්තා ලම්බන වීථිය තදාරම්මණයෙන් වෙනස්කොට කියනලදී. මතුදක්වන විභූතා ලම්බන වීථින්ගේ වෙනසද මේ නයින්ම දතයුතු.

පුද්ගලවශයෙන් මේ සියලු වීථිහුම පෘථග්ජනයෝ සතර(4) දෙන ආර්‍ය්‍යඵලස්ථයෝ සතරදෙන යන අට(8)දෙනාකෙරෙහි උපදිත්. භවඞ්ගවශයෙන් වෙනසනම් කාමාවචර භූමික වීථියක්නම් කාමභවඞ්ග දශයද දුර්ගති අහෙතුක පුද්ගලයාතුල උපදින වීථියක් නම් අකුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ භවඞ්ගයදවේ. මේ ආදීන්ගේ වශයෙන් ඒ ඒ වීථියට උත්පත්ති ස්ථානවූ භූමි පුද්ගල භෙදය පරීක්ෂාකිරීමෙන් භවඞ්ග සඞ්ක්‍රමණ විශෙෂය දතයුතු.

### පඤ්චද්වාර වීථී ප්‍රස්ථාර නයයි.

මනොද්වාර වීථිද 'කාමජවන' 'අර්පනා ජවන' වීථින්ගේ වශයෙන් දෙවදෑරුම්වේ. එයින් 'කාමජවන' වීථි තොමෝද විඥප්ති රූපද්වය ලක්ෂණ රූපචතුෂ්කය වර්ජිතකොටඇති සප්තරසා යුෂ්ක ප්‍රත්‍යුත්පන්න දෙවිසි (22) රූපය අරමුණුකොටගෙන විභූතා ලම්බන වීථිපස(5) අවිභූතාලම්බන වීථි දෙකය(2) සප්තරසායුෂ්ක නොවන අතීරික්ත නාමරූප ප්‍රඥප්ති ධර්‍මයන් අරමුණුකොට ගෙන විභූතාලම්බන වීථි එකය (1) අවිභූතාලම්බන වීථි එකය (1) මෙසේ නව (9) වැදෑරුම්වේ.

එයින් ප්‍රත්‍යුත්පන්න දෙවිසි (22) රූපයාගේ උත්පාදයෙහි පටන් අතීතභවඞ්ග පිළිවෙළින් එක්වර දෙවර තුන්වර සතරවර පස්වර දක්වාද භවඞ්ග චලන භවඞ්ගුපච්ඡේද මනොද්වාරාවර්ජන එක්වර බැගින්ද ජවන සත්වරක්ද තදාලම්බන දෙවරක්ද වීමෙන් තදනන්තරයෙහි සුදුසු පරිද්දෙන් භවඞ්ග පතනයවී ප්‍රත්‍යුත්පන්න දෙවිසි (22) රූපය සප්තරසායුෂ්කව චතුර්ථ භවඞ්ගය සමගද තෘතීය චිත්ත ප්‍රථම භවඞ්ගය සමගද ද්විතීය තදාලම්බනය සමගද නිරුද්ධවන වීථිපස(5) විභූතාලම්බන වීථිනම්වේ.

මෙසේම අතීත භවඞ්ගසවරක්(6)ද සත් (7) වරක්ද වීමෙන්තදාලම්බන පතනය නොව භවඞ්ග පතනයමවී ප්‍රත්‍යුත්පන්න

දෙවිසි (22) රූපය සප්තරසායුෂ්කාව ප්‍රථම භවඞ්ගය සමගද සප්තම ජවනය සමගද නිරුද්ධවන දෙවීථිය (2) 'අවිභූතාලම්බන වීථි' නම්වේ.

**මනොද්වාරෙසත්තවීථිචිත්තා නිපනඑකචත්තාලීසපඤ්ච විඤ්ඤාණ මනොධාතු වජ්ජානි කාමාවචරානෙව පුබ්බාපර භවඞ්ගානි කම්ම කම්ම නිමිත්තාදි එකෙකාලම්බනානි සෙසානි පච්චුප්පන්න සත්තරසායුක බාවීසති රූපාලම්බනානි නිස්සයතො අනන්තානන්තර හදය වත්ථුකානෙව කාමාවචරෙ විභූතාලම්බන වීථියො අවිභූතාපන සබ්බෙ සබ්බාපි පුග්ගලෙකෙ.**

මෙහි අදහස:-යටකී නයානුසාරයෙන් දතයුතු චතුවොකාර භූමියෙහි නිශ්ශ්‍රය වස්තුරූපයාගේ අභාවයම වෙනසී.

විභූතාලම්බන අවිභූතාලම්බන උභය වීථි ප්‍රස්ථාරය කෙසේද? යත්. සප්තරසායුෂ්කා නොවන අතීතානාගත ප්‍රත්‍යුත්පන්න කාමචිත්ත චෛතසික විඥප්තිරූප ලක්ෂණරූප අතීතානාගත අවශෙෂ දෙවිසි (22) රූප යන මොවුන් අරමුණුකොටගෙන අතීත භවඞ්ග නොවයට කී පරිද්දෙන් වීථි චිත්ත ප්‍රවෘත්තියම වීමෙන් තදාලම්බනයට අනතුරුව භවඞ්ග පතනයවන වීථිය 'විභූතාලම්බන වීථි' නම්වේ. ත්‍රෛකාලික එකුන නවුති (89) ප්‍රභේද චිත්තය හා තත්සම්ප්‍රයුක්ත චෛතසික පනස්දෙක (52) විඥප්ති රූපදෙක(2)ලක්ෂණරූප සතර(4)අවශෙෂ අතීතානාගත දෙවිසි (22) රූප කාල විමුක්ත නිර්වාණ ප්‍රඥප්ති යන මොවුන් අරමුණුකොටගෙන තදාලම්බන පතනය නොව යටකී නයින් වීථි චිත්ත ප්‍රවෘත්තිය වීමෙන් ජවනයට අනතුරුව භවඞ්ගපතනයවන වීථිය 'අවිභූතාලම්බන වීථි' නම්වේ.

මේ දෙවීථියෙහි ආලම්බනයන්ගේ උත්පාද නිරොධයෙහි අමුත්තක් නැත්තේය.

**මනොද්වාරෙමෙවම්පි චිත්තානි පන එකචත්තාලීස පඤ්ච විඤ්ඤාණ මනොධාතු වජ්ජානි කාමාවචරානෙව. පුබ්බාපර භවඞ්ගානි කම්ම කම්ම නිමිත්තාදි එකෙකාලම්බනානි. විභූතාලම්බෙ වීථි චිත්තානි කාමචිත්ත චෙතසික විඤ්ඤත්ති ලක්ඛණාතීතානාගත බාවීසති රූපාලම්බනානි. අවිභූතාලම්බෙ වීථි චිත්තානි සෙස චිත්ත චෙතසික නිබ්බාන පඤ්ඤත්ති සඞ්ඛාතානි නානෙවාලම්බනානි. නිස්සයතො සබ්බ චිත්**

තානි අතීතානන්තර හදය වත්ථුකානි. විභූතාලම්බනවීථි කාමාවචරෙ. අවිභූතාපන සබ්බත්ථ. සබ්බාපි පුග්ගලඤ්ඤෙක-මෙහි අදහසද යටකී නයානුසාරයෙන් දතයුතු.

සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් 'සම්මොහ විනොදනී' අර්ථකථායෙහි සුපිනෙනෙවදිට්ඨංවිය මෙසුනාංවිය මෙති කථන කාලෙපි අබ්‍යාකතොයෙව යනු කී හෙයින් සියලු ධර්‍මයන්ම අරමුණු කොටගෙන ජවන පතනය නොව මනොද්වාරා වර්ජනයම දෙවරක් තුන්වරක් වීමෙන් භවඞ්ග පතනයවන අව්‍යාකෘත අවිභූතා ලම්බනවීථියක්ද ප්‍රස්ථාර කටයුතුයයි කියති. මෙහි 'සුපිනෙනෙව'යනු 'කථනකාලෙපි' යන්න හා සම්බන්ධයි. ඒ වීථිය පූර්‍වාචාර්‍ය්‍යයන් විසින් ප්‍රස්ථාරකොට නොදක්වනලද හෙයින්ද මූල ටීකාචාර්‍ය්‍ය ආනන්දස්ථවිරාදි මහාපණ්ඩිතයන්ට අනභිමත හෙයින්ද අප විසින් මෙහි නොදක්වන ලද්දේය.

සුකතා සුක්ති විමසා බැලූකල ආරම්මණ ආරම්මණික යන්ගේ දුර්‍වල දුර්‍වලතර දුර්‍වල තමාදී නානා අවස්ථා ඇතිවියහැකි හෙයින් පඤ්චද්වාරයෙහි මෙන් මනොද්වාරයෙහිද මොඝවාරය පවා ඇතිවිය යුතුයයිහැඟේ. ආවර්ජනවාරයවූ අව්‍යාකෘත වීථින් හි කියනුම කවරේද ? මූලටීකාචාරීන් වහන්සේට ව්‍යාහි පඤ්චද්වාරයෙහි වොඨ්ඨපනවාරය පවා අනභිමතය එහෙයින්ම උන් වහන්සේ විසින් ජවන පතනය නොවන්නාවූ වීථියක් නැත්තේ යයි කියන ලද්දේය අව්‍යාකෘත වීථියට සියලු භවඞ්ග ඇතුලත් කිරීම සහ ඒ වීථිය සියලු භූමිවල ප්‍රස්ථාර කිරීමත් වොඨ්ඨප්පන කිරියාඵපෙන්වා කිරියා මනොධාතු දසන්නං කාමාවචර කිරියානං කාමාවචර කුසලා කුසලානං පඤ්චවොකාරෙ භවඞ්ගව සෙන පවත්තානං පන්නරසන්නං විපාක චිත්තානඤ්චාති පඤ්චචත්තාලීසාය යන සඞ්ඛාත අර්ථකථා වචනයට විරුද්ධය. මෙහිඅර්ථ:-වොඨ්ඨපන කිරියා,(ආවර්ජන කෘත්‍යවත්) ව්‍යවස්ථාපන ක්‍රියාචිත්තය; කිරිය මනොධාතුං ඵපෙත්වා,ක්‍රියා මනොධාතු පඤ්චද්වාරා වර්ජන චිත්තය තබා; දසන්නං කාමාවචර කිරියානං, දශවිධ කාමාවචර ක්‍රියා චිත්තයන්ටද; කාමාවචර කුසලා කුසලානං, කාමාවචර කුශලාකුශල චිත්තයන්ටද; පඤ්චවොකාරෙ, පඤ්චවොකාර භූමියෙහි; භවඞ්ගවසෙන, භවඞ්ගවශයෙන්; පවත්තානං, පවත්නාවූ; පන්නරසන්නං විපාක චිත්තානඤ්ච, පසළොස් වැදෑරුම් විපාක චිත්තයන්ටද, ඉති, මෙසේ; පඤ්ච චත්තාලී

ඝාය චිත්තාන්තං, පන්සාලිස් වැදෑරුම් විපාක චිත්තයන්ට; අනන්ත රපපච්චයෙන, අනන්තර ප්‍රත්‍යයෙන්, පච්චයො, ප්‍රත්‍යය වේ.

මතු කියනු ලබන්නාවූ 'ප්‍රත්‍යවෙක්ෂාවීථි' සහ 'පරිකර්මවීථි'ද මේමනොද්වාර වීථින්හිම සුදුසු පරදෙදන් සඞ්ග්‍රහවනබව දතයුතු.

## කාම මනොද්වාර වීථි ප්‍රස්ථාර නයයි.

මරණාසන්න වීථිද සුදුසු පරිදෙදන් මේ කාමාවචර වීථිවලම සඞ්ග්‍රහයටයේ. එහෙයින් ඒ මරණාසන්න වීථි තොමෝද චක්ෂු ද්වාර වීථි ශ්‍රොතද්වාර වීථි ඝ්‍රාණද්වාරවීථි ජිව්හාද්වාරවීථි කායද්වාරවීථි මනොද්වාරවීථි යන මොවුන්ගේ වශයෙන් ස(6)වදෑරුම්වේ. එයින් චක්ෂුද්වාර වීථිය ජවනයට අනතුරුව චුතිය. ජවන භවඞ්ග යන්ට අනතුරුව චුතිය. තදාරම්මණයට අනතුරුව චුතිය. තදා ලම්බන භවඞ්ගයන්ට අනතුරුව චුතියයි මෙසේ සිවුවැදෑරුම්වේ. එහි වීථි ප්‍රස්ථාරය මෙසේයි:-අතීත භඞ්ගය භවඞ්ග චලනය භවඞ්ගුපච්ඡෙදය පඤ්චද්වාරා වර්ජනය චක්ෂුර්විඥානය සම්පටිච්ඡනය සන්තීරණය වොඨපනය ඊට අනතුරුව මරණාසන්න ජවන පස්වරක් සහ චුතියද. මරණාසන්න ජවන පස්වරක් භවඞ්ගයවරක් සහ චුතියද. මරණාසන්න ජවන පස්වරක් තදා රම්මණ දෙවරක් සහ චුතියද. මරණාසන්න ජවන පස්වරක් තදා රම්මණ දෙවරක් සහ චුතියද. මරණාසන්න ජවන පස්වරක් තදා රම්මණ දෙවරක් භවඞ්ගය වරක් සහ චුතියද. ඊට අනතුරුව පිළිවෙළින් ප්‍රතිසන්ධිය භවඞ්ග පසළොස්(15)වරක් හෝ සොළොස් (16) වරක් මනොද්වාරා වර්ජනය වරක් (1) භවනිකාන්තිකලොභ ජවන සත් (7) වරක්ද වීමෙන් යථාරහ භවඞ්ග පතනයවේ.

මේ නයින්ම ශ්‍රොත ඝ්‍රාණ ජිව්හා කායද්වාර වීථිද ප්‍රස්ථාර කරනු. සියළු මරණාසන්න වීථි පිඬුකළවිට සමවිස්සෙකි(20 )

ආරම්මණ වශයෙන් පූර්වභවයෙහි චුතිභවඞ්ග චිත්තයෝ සවකීය ප්‍රතිසන්ධිය සමග භූමි ජාති සම්ප්‍රයුක්ත ධර්මසංස්කාර ආරම්මණ වශයෙන් සමානවූයෙන් අතීතානන්තර භවයෙහි ජවා රික මරණාසන්න ජවනයන් විසින් ගෙනදෙනලද කර්ම කර්ම නිමිති ගතිනිමිති අතුරෙන් එකී එකී ආලම්බනයක් අරමුණු කෙරෙති. පූර්වභවයෙහි අතිරික්ත පඤ්ච ද්වාර වර්ජනාදි වීථි චිත්තයෝද පශ්චිම භවයෙහි අභිනව ප්‍රතිසන්ධි භවඞ්ගයෝද අභි නව ප්‍රතිසන්ධි ජනක කර්මයාගේ ආරම්මණය හා සදෘශවූ හෙයින් සදෘශොපචාරයෙන් හෝ එක සන්තානිකවූ යෙන් එකසන්තා

ඤාත්‍යායෙන් හෝ එකණෙහිමඤ්ඤතිමිත්‍රයන් විසින් ලඟට එලවන ලද කර්ම නිමිත්තයයි සම්මත මල් පහන් සිවුරු පිරිකරාදි වස්තු ගත ප්‍රත්‍යුත්පන්න පඤ්චාලම්බනය අරමුණු කෙරෙති. මනොද්වාරාවර්ජනය සහ භවනිකාන්තික ලොභජවනයෝද අභිනව ප්‍රතිසන්ධි විපාක සංඛ්‍යාත කර්මජ රූපයන් අරමුණු කෙරෙති.

නිශ්‍රය වශයෙන් දෙපස් (10) විඥානයෝ චුතිචිත්තයෙන් මත්තෙහි සතළොස් (17) වන චිත්තය හා සමඟ උපන් පඤ්ච ප්‍රසාද වස්තු රූපද පූර්වභවයෙහි අතිරික්ත චිත්තයෝ චුතිචිත්ත යෙන් මත්තෙහි සතළොස් (17) වන චිත්තය හා සමඟ උපන් හෘදය වස්තු රූපයද නිශ්‍රයකර ගනිති. පශ්චිම භවයෙහි ප්‍රති සන්ධි චිත්තය වනාහි තමාහා සමග උපන් හෘදයවස්තුරූපයද අති රික්තසකල චිත්තයෝම තම තමන්ගේ අතීතානන්තර චිත්තය හා සමග උපන් හෘදය වස්තු රූපද නිශ්‍රයකර ගනිති.

මේ සියලු චිත්තයෝම භූමිවශයෙන් එකොළොස් (11) වැදෑරුම් කාමාවචර භූමියෙහි උපදින චිත්තයෝයි.

පුද්ගල වශයෙන් කාමභූමියෙන් චුතව කාමභූමියෙහිම උපදින පෘථග්ජනයෝ සතරදෙන ශ්‍රොතාපන්න සකෘදාගාමී ඵලසථ යෝදෙදෙන යන සදෙන (6) තුළ උපදිති

## පඤ්චද්වාර මරණාසන්න වීථි ප්‍රස්ථාර නයයි.

මනොද්වාර වීථිද කාමභූමියෙන් චුතව කාමභූමියෙහිම පිළිසිඳ ගන්නාවූ සත්ත්වයන්ට පඤ්චද්වාරයෙහිමෙන් සිවුවැදෑරුම්වේ. භවඞ්ග චලනය භවඞ්ගුපච්ඡේදය මනොද්වාරාවර්ජනය වරක් මරණාසන්න ජවන පස්වරක් යනාදි වශයෙන් ප්‍රස්ථාර කරනු. මෙකී මරණාසන්න වීථි චතුෂ්කයෙහි යුක්තායුක්ති යට ආරම්මණ සඞ්ග්‍රහයෙහි කීයෙමු. කාමාවචරභූමිය හැර ශෙෂ භූමිවලින් චුතවී යන සත්ත්වයන්ට ජවනයට අනතුරුව චුතිය ජවන භවඞ්ගයන්ට අනතුරුව චුතියවන දෙවීථිය පමණක් ලැබේ. වීථි ප්‍රස්ථාරය සටකී නයින් දතයුතු.

එහි අහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි සය (6) කෙරෙන් කාම ප්‍රතිසන්ධි දශයද (10) පෘථග්ජනයාගේ ත්‍රිහෙතුක කාමචුති සතර (4) කෙරෙන් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි තෙළසද (13) අසංඥතලයෙහි සුගති අහෙතුකයාගේ චුතිය (1) කෙරෙන් කාමද්විහෙතුක ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි අට (8)ද වෙහප්ඵලය දක්වා දශවිධ රූපාවචරයෙහි පෘථග්ජන චුති පස (5) කෙරෙන් සහෙතුක ප්‍රතිසන්ධි සතළො

ස (17) ද සුභකිණ්හ බඹලොව දක්වා යට නවවිධ රූපාවචර යෙහි ආයුක්ෂයන්ගේ චුති සතර (4) කෙරෙන් ස්වකීය ප්‍රතිසන්ධිය සමග මතුමතු රූපාවචර ප්‍රතිසන්ධි නවය (9) ද. වෙහප්ඵල භූමි යෙහි ආයුක්ෂචුතිය (1) කෙරෙන් ස්වකීය ප්‍රතිසන්ධිය (1) ද. යට සුද්ධාවාස චුතිසතර (4) කෙරෙන් මතු සුද්ධාවාස ප්‍රතිසන්ධිය (1) ද වනබව දතයුතුයි. අකනිෂ්ට බ්‍රහ්මචුතිය කෙරෙන් පසු ප්‍රතිසන්ධි යක් නොමැත්තේය.

අරූපාවචර පෘථග්ජනචුති. සතර (4) කෙරෙන් ස්වකීය ප්‍රතිසන්ධිය සමග කාම ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි පමණක්ද එහිම ආයුක්ෂචුති. සතර (4) කෙරෙන් ස්වකීය ප්‍රතිසන්ධි (1) සමග මතු මතු අරූප ප්‍රතිසන්ධිද ඇතිවේ.

එහෙයින්කිහ.

“ආරුප්ප චුතියා හොන්ති. හෙට්ඨිමාරුප්ප වජ්ජිතා.
පරමාරුප්ප සන්ධිව. තථාකාමෙ තිහෙතුකා,,
රූපාවචර චුතියා. අහෙතු රහිතාසියුං,
සබ්බාකාම ති හෙතුම්හා. කාමෙසෙවව පනෙතරා.
වෙහප්ඵලෙ අකනිට්ඨෙ. භවග්ගෙච පතිට්ඨිතා,
නපුනාඤ්ඤත්‍ථ ජායන්ති. සබ්බෙ අරියපුග්ගලා,
බ්‍රහ්මලොක ගතාහෙට්ඨා. අරියානොප පජ්ජරෙ,
සුද්ධාසෙ භූතපුබ්බා. අකනිට්ඨෙ සමානකා,,
අපායෙකා සිතානත්‍ථි. පරිනිබ්බන්ත භාවතො.

ආරුප්ප චුතියාපරං, අරූපාවචර චුතිසතරින් පසුව; හෙට්ඨි මාරුප්ප වජ්ජිතා, යටයට ආරූප්‍ය ප්‍රතිසන්ධි වර්ජිතකොට ඇත් තාවූ; ආරුප්ප සන්ධිච, (සතර තුන දෙක එක බැගින්වූ) අරූප ප්‍රතිසන්ධිහුද; තථා, එපරිද්දෙන්; කාමතිහෙතුකා, ත්‍රිහෙතුක කාමප්‍රතිසන්ධිහු සතරදෙනද; හොන්ති, වෙත්; රූපාවචර චුතියා පරං, රූපාවචර පඤ්චවොකාර චුතියෙන් පසුව; අහෙතු රහිතා ද්විහෙතුක ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිහු සතලොස්දෙන; සියුං, වෙත්; කාමති හෙතුම්හාපරං, ත්‍රිහෙතුක කාමප්‍රතිසන්ධි සතරින් පසුව; සබ්බා, සකලවිංශති ප්‍රභෙද ප්‍රතිසන්ධිහු; සියුං, වෙත්. ඉතරාපරං පන, අහෙතුක ද්විහෙතුක ප්‍රතිසන්ධි සදෙනාකෙරෙන් පසුවවනාහි කාමෙසෙවව, එකලොස්වැදෑරුම් කාමභූමිවලම; සබ්බා, සකල විංශති ප්‍රභෙද ප්‍රතිසන්ධිහු; සියුං, වෙත්. වෙහප්ඵලෙච, වෙහප් ඵල බඹතලෙහිද; අකනිට්ඨෙ අකනිටාබඹතලයෙහිද; භවග්ගෙච, (නෙවසඤ්ඤානාසඤ්ඤාතලයයිකියනලද)භවග්‍රයෙහිද;පතිට්ඨිතා,

පිහිටියාවූ ; සබ්බෙ අරිය පුග්ගලා, සියලු ආර්‍ය්‍ය පුද්ගලයෝ ; පුන, නැවත, අඤ්ඤත්ථ, අන්‍යභූමියෙක්හි ; න ජායන්ති, නූපදිත්. බ්‍රහ්මලොකගතා, බඹලොවට ගියාවූ ; අරියා, ආර්‍ය්‍යපුද්ගලයෝ හෙට්ඨා, යටභූමිවල ; නුපපජ්ජරෙ, නූපදිත්.

සුද්ධාවාසෙ, (පඤ්ච) සුද්ධාවාසයෙහි ; භූතපුබ්බා, පෙර පිළිසිඳ ගත් විරූසත්වයෝ; න අත්ථි, නැත්තාහුය. අසඤ්ඤෙ, අසඤ්ඤ බඹ තලයෙහි ; පරිනිබ්බන්ත භාවතො, පරිනිබ්බන්ත භාවයෙන් ; සමන්තකා, සමන්ත සත්වයෝ ; න අත්ථි, නැත්තාහුය. අපායෙ, අපායෙහි ; පරිනිබ්බන්ත භාවතො, පරිනිබ්බන්ත භාවයෙන් එකංසිකා, එකංසික සත්වයෝ ; න අත්ථි, නැත්තාහුය.

කියනලද මරණාසන්න වීථින්ගේ චිත්ත ස්වරූපාදිය යථෝක්ත නයින් භූමි පුද්ගල ආලම්බන භෙදය බලා කියයුතු.

අසඤ්ඤතලයෙහි වායොකසිණ භාවනාබලයෙන් ඇතම් ආචාර්‍ය්‍ය කෙනකුන්ගේ මත පරිද්දෙන් නම් ආකාසකසිණ භාවනා බලයෙන් ප්‍රතිසන්ධි ග්‍රහණයකරන බව දතයුතු. රහතුන්ගේ පරිනිර්වාණ චුතිය වනාහි මනොද්වාරවිථියෙන්ම වේ. හෙය ද යථොක්ත පරිද්දෙන් සිවු (4) වැදෑරුම් කොට ප්‍රස්තාර කටයුතු.

ආරම්මණ වශයෙන් වනාහි මනොද්වාරාවර්ජන මරණාසන්න ජවන තදාරම්මණයන්ට යම්යම් ඒ ආපාතගත සංස්කාර ලක්ෂණ රූපප්‍රඥප්ති ධර්‍මයක්ම අරමුණුවේ. මෙපමණක්ම වෙනසි. එහෙයින් **ටීකායෙහි "ඛීණාසවස්ස යථොපට්ඨිතං නාමරූපාදිකමෙව චුතිපරියොසානානං ගොචරභාවං ගච්ඡන්ති"** යි කීහ-**"ආදිසද්දෙන ලක්ඛණපඤ්ඤත්තියො සඞ්ගහිතා චුතිපරියොසානානන්ති එත්ථ මනොද්වාරිකවීථි චිත්තානෙවාධිප්පෙතානි සමාපත්ති සමාපජ්ජන සඞ්ඛාර සම්මසන පච්චවෙක්ඛණෙ හෙව පරිනිබ්බායනතොති අම්හාකං ඛන්ති"** යනු **'මණිසාර මඤ්ජුසා'** යි. අර්ථ:- ඛීණාසවස්ස, ක්ෂීණ ශ්‍රවයන්වහන්සේගේ; යථොපට්ඨිතං, යම් යම් ඒ එළඹ සිටියාවූ; නාමරූපාදිකා මෙව, නාමරූපාදි ධර්‍මයක්ම; චුතිපරියොසානානං, චුතිය අවසන්කොට ඇත්තාවූ මනොද්වාරික වීථි චිත්තයන්ගේ ; ගොචරභාවං, ගොචරභාවයට ; ගච්ඡන්ති යනී.

වීථි සතර බැගින් ලැබෙනහෙයින් පඤ්චද්වාර මනොද්වාර වීථි දෙකොටස පිඩුකළවිට මරණාසන්න වීථි සූවිස්සක් (24) වේ.

භූමි වශයෙන් වනාහි නිරය භූමියෙන් චුතව එකොළොස් (11) වැදෑරුම් කාමාවචරයට යාමෙහි වීථි සතර (4) බැගින් ලැබෙන හෙයින් (11) එකොළොස සතරින් වැඩිකළවිට (11x4) වීථි

සූසාලිසක් (44) වේ. එමෙන්ම ඉතුරු තුන් අපායෙන් චුතව යාමෙහිද සූසාලිස (44) බැගින් ලැබෙන හෙයින් සතර අපායෙන් පමණක් චුතවන සත්ත්වයන්ට ලැබෙන මරණාසන්න වීථි පිඩුකළවිට එකසිය ස සැත්තෑවක් (176) වේ.

මේ නයින් සප්තකාම සුගතියෙන් චුතව එකොළොස්කාමාවචරයට යාමෙහි වීථි සතර (4) බැගින්ද ප්‍රතිසන්ධි වශයෙන් යාමක් නැති රහතුන්වහන්සේලාට වීථි සතර(4)ක්ද පෘථග්ජන ශෛක්ෂයන්ට රූපඅරූප භූමිවලට යාමෙහි වීථිදෙක (2) බැගින්ද ලැබෙන හෙයින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන භූමිය දක්වා පිඩුකළවිට මරණාසන්න වීථි අනෙක සහශ්‍ර ප්‍රභෙද වේ.

(8) මෙතන්හි කාම වීථින්හි **විපාක අවිපර්‍ය්‍යාස ජවන විපර්‍ය්‍යාස** යන උදෘත වචනයවූ පරිද්දෙන් විපාකොත්පත්ති ජවනොත්පත්ති දෙක්හි වෙනස කියනුලැබේ.

"**සබ්බත්ථාපිපනෙත්ථ අනිට්ඨෙ ආලම්බනෙ**—:පෙ:-
කාමෙ ජවනසත්තා ලම්බනානං නියමෙසති,
විභූතෙති මහන්තෙච තදාලම්බන මීරිතං,,

යනු කිහෙයින් අනිෂ්ටාලම්බනයෙහි අකුශල විපාකයෝ සත් (7)දෙනද, ඉෂ්ට මධ්‍යස්ථාලම්බනයෙහි සුඛොපෙක්ෂා කුශල විපාකයෝ එකොළොස් (11) දෙනද, අති ඉෂ්ටාලම්බනයෙහි සොම්නස් සහගත සන්තීරණය සහ සොම්නස් සහගත තදාලම්බනයෝ පස් (5) දෙනද, පහකරනලද විපල්ලාස ඇති හෙයින් රහතුන් වහන්සේට අතිඉෂ්ටාරම්මණයෙහි සොම්නස් සහගත ක්‍රියා ජවන පඤ්චකය (5) කෙරෙන් සොම්නස් සහගත තදාලම්බනයෝ පස් (5)දෙනද, ඉෂ්ටමධ්‍යස්ථ අනිෂ්ටාලම්බනයන්හි උපෙක්ෂා ක්‍රියා ජවන චතුෂ්කය (4) කෙරෙන් අරමුණු අනුකූලව උපෙක්ෂා තදාරම්මණයෝ සදෙන (6) ද, ද්වේෂ ජවනය කෙරෙන් වනාහි උපෙක්ෂා තදාරම්මණයෝ සදෙන (6) හා උපෙක්ෂා භවඞ්ගයෝ සදෙන (6) ද වෙති.

උපෙක්ඛා කිරියාදෙස. ජවනෙහි ජ තදාරමා.
සුඛිත ක්‍රියතො පඤ්ච එකාදසෙව සෙස තො.

**සෙස තොනි සෙසඑාරස ජවනතො තදාලම්බනානි එකාද
සෙවයිශූනති සම්බන්ධො** :—

මෙහිද කාම ජවන, කාමසත්ත, කාමාරම්මණ යන අඞ්ගත්‍රය සම්පූර්ණවීමෙන් අතිමහන්තා ලම්බනයෙහි සහ විභූතාලම්බනයෙහිම තදාරම්මණ පතනය වන බව දතයුතු.

මේ එකාන්තයෙනි. අනෛකාන්ත යෙභුය්‍යවශයෙන් වනාහී ඥාන සම්ප්‍රයුක්ත ජවනයට අනතුරුව සම්ප්‍රයුක්ත තදාරම්මණයෝද විප්‍රයුක්ත ජවනයට අනතුරුව විප්‍රයුක්ත තදාලම්බනයෝද අකුශල ජවනයට අනතුරුව අහෙතුක තදාරම්බණයෝද කුශල ජවනයට අනතුරුව සහෙතුක තදාරම්මණයෝද වෙති.

සෝමනස් සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධි ඇත්තාවූ පුද්ගලයාහට අති ඉෂ්ටාරම්මණයෙහිද මහන්තාරම්මණ අවිභූතාරම්මණයන්හිද ප්‍රඥප්ති මහද්ගතාරම්මණයෙහිද දෞර්මනස් ජවනයට අනතුරුව තදාලම්බන පතනයට අවකාශනොමැත්තෙන් භවඞ්ගපාතයවේ.

එහිදු සෝමනස් සහගත භවඞ්ගයෝද ජවනානුකූල නොවෙති. උපෙක්ෂා සහගත භවඞ්ගයෝද ප්‍රතිසන්ධියට නොගැලපෙත්. එහෙයින් මේ භවයෙහි පූර්වකාලයෙහි පුරුදුකරනලද කාමධර්මයක් අරමුණුකර ගෙන උපෙක්ෂාසන්තීරණ චිත්තය ආවර්ජනා රහිතවම ආගන්තුක භවඞ්ගකෘත්‍යයෙක් වරක්ඉපිද නිරුද්ධ වේ. ඊට අනතුරුව ඒ චිත්තයෙන් අනන්තරාදි ප්‍රත්‍යය ලැබ ප්‍රතිසන්ධිය හා සදෘශ වූ සෝමනස් සහගත භවඞ්ගපතනය වන බව සැලකියයුතු.

එහෙයින් මේ අර්ථය සඳහා :–

“ නිරවජ්ජං කථං චිත්තං හොති නෙතංහි සමමතං,
නියමොනවිනා වජ්ජං නිරොධාඵල දස්සනං.” යි කීහ.

එහි අර්ථය :—නිරවජ්ජං, ආවර්ජන රහිතවූ; චිත්තං, චිත්තය තෙම; කථංහොති, කෙසේ වේද? හි, ඒ එසේමය; එතං, ඒආවර්ජනා රහිතව චිත්තොත්පත්තිය; නසමමතං, (පූර්වාචාර්යයන් විසින්) අසමමතය. ඉති, මෙය චොදනායි. නියමො, (චිත්තොත්පත්තිය ආවර්ජන සහිතවම වේයයි) නියමයෙක්; න, නැත්තේය. (කස්මා, කුමක්හෙයින්ද ? යත් නිරොධා, නිරොධ සමවතින්; වුට්ඨහන්තස්ස, නැගිටින්නාවූ (අනාගාමී රහතුන්වහන්සේට); ආවජ්ජනංවිනා, ආවර්ජනරහිතවම; ඵලදස්සනං,(නිවන් අරමුණුකොටගෙන) ඵල චිත්තයාගේ උත්පත්තිය දක්නා හෙයිනි.

එහෙයින්

“ පටිසන්ධි භවඞ්ගඤ්ච තථාච වනමා නසං,
ඒක මෙව තථේවෙක විසයඤ්චෙක ජාතියං.”

යන ‘අභිධර්මාර්ථ සංග්‍රහ’ ගාථාවහුයොවෘත්තීන් කියනලද්දීයයි දතයුතු.

## විපාක ප්‍රවෘත්තිනයයි.

පෘථග්ජන ශෛක්ෂසන්තානයෙහි අයොනිසොමනසිකාරය ඇතිවීනම් අකුශල ජවනයෝද යොනිසොමනසිකාරය ඇති

වීථිම් කුශල ජවනයෝ ද ක්ෂීණාශ්‍රවනිරනුසය සන්තානයක්නම් අති ඉෂ්ටාලම්බනයක් මුණගැසුණුවිට සොම්නස් සහගත ක්‍රියා ජවනයෝද ඉෂ්ටමධ්‍යස්ත අනිෂ්ටා ලම්බනයන් මුණගැසුණුවිට උපෙක්ෂා ක්‍රියා ජවනයෝද වෙති. ආවර්ජිතයන්ගේ උත්පත්තිය වනාහි ආරම්මණාභිඝාතයෙන් සහ භවඞ්ග සන්තතිය සිඳීමෙනුත් වන බව දතයුතු. එහෙයින් **විපාක අවිපරීතය ජවන විපරීතය** යනු කුශලාකුශල ජවනයන් සඳහා කියනලද්දේ යයි ගතයුතු. ක්‍රියා ජවන වනාහි ප්‍රහීනකරනලද විපල්ලාසඇති ක්ෂීණාශ්‍රවසන්තානයෙහි ඇතිවන හෙයින් අවිපරීත ධර්මකොට්ඨාසයෙකි.

මේ ස්ථානයෙහි සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් විමති උපදවා විරුද්ධමත ප්‍රකාශකෙරෙති. එහෙයින් ඒ ආචාර්‍ය්‍ය මත පළමු කොට දක්වා නැවත එහි විනිශ්චය කියනුලැබේ.

ක්‍රියා ජවන වනාහි පහකරනලද විපල්ලාස ඇති ක්ෂීණාශ්‍රවයන්ට ඇතිවන සිත් කොට්ඨාසයක් හෙයින් අනන්තර ප්‍රත්‍යය විස්තරකොට වර්ණනාකරනලද **‘පට්ඨාන අට්ඨ කථා’ ‘ශසිසමොධාන පාඨ.’** ඒ ඒ **‘අභිධර්ම සඞ්ග්‍රහ සංවර්ණනා’** හා සමග නම් සංසන්දනය වේ. එහෙත් **‘දීඝනිකාය’** පාථේය්‍ය වර්ග සම්පසාදනීය සූත්‍රාදියෙහි **ඉධ භන්තභික්ඛු සචෙ ආකඞ්ඛති පටිකූලෙ අපටිකූල සඤ්ඤී විහරෙය්‍යන්ති අපටිකූලසඤ්ඤී තත්ථ විහරති** යනාදී වශයෙන් වදාළ සූත්‍රාන්ත පාළිය හා සමග අතිශයින්ම විරුද්ධය.

තවද මධ්‍යමනිකාය **උපරිපණ්ණාසක** යෙහි අන්තිම ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි ෂට් ද්වාරය ෂඩාලම්බනයෙන් බෙදුවදාරන ලදී. **‘සංයුත්ත නිකාය’ ‘අඞ්ගුත්තර නිකාය’** යන්හිද එසේම වදාරනලදී. ‘විසුද්ධිමාර්ග’යෙහි සහ ‘ප්‍රතිසම්භිදා මාර්ග ඍද්ධි කථා’ යෙහි ආර්‍ය්‍ය ඍද්ධිවශයෙන්ද තවගුණවර්ණනායෙහි චිත්තිස්සරිය ගුණවශයෙන්ද ආයේය. මෙසේ ආ පෙළ අටුවා සමඟද විරුද්ධය. කෙසේ විරුද්ධ වේද ? යත්. අභිධර්ම සංවර්ණනා මතයෙන් බුදුන් රහතුන්ගේ කාමක්‍රියා ජවන කාම විපාකයන්මෙන් අතිඉෂ්ටාලම්බනයෙහි සොම්නස් වෙදනාව හා සමගද ඉෂ්ටමධ්‍යස්ත අනිෂ්ටාලම්බනයන්හි උපෙක්ෂා වෙදනාව හා සමගද සම්ප්‍රයොගවීමනියතය.

සූත්‍රාන්ත නයින් වනාහි බුදුන් රහතුන් ආර්‍ය්‍ය ඍද්ධියෙන් සමන්විත වූ හෙයින් ඉෂ්ටාලම්බන අනිෂ්ටාලම්බනයන්හි ආකාඞ්ක්ෂා ප්‍රතිබද්ධවෘත්තිකයෝ වෙති. එහෙයින් ඉෂ්ටාලම්බනය

අනිෂ්ටාලම්බන කොටද අනිෂ්ටාලම්බනය ඉෂ්ටාලම්බන කොටද, ඉෂ්ටානිෂ්ට ආලම්බනවය මධ්‍යස්ථාලම්බන කොටද ගනුලැබේ

එසේ උන්වහන්සේලාගේ ගැනීම ද පෘථග්ජනයන්ට නොව ආර්‍ය්‍යයන්ටම ආවෙනික සෘද්ධිබලයෙන්ම ඇතිවන සිදුවන්නේ යයි දතයුතු.

ස්වභාව වශයෙන් වනාහි කාමවිපාකයට සහ විපල්ලාස යටත් ගොචරවන අරමුණු වූකලී අතිඋත්තානය. චතුස්සත්‍ය ප්‍රතිවෙධ ගාම්භීර්‍ය්‍යයෙන් යුක්තවූ රහතුන්ගේ චිත්තාචාරය ඉතා ගැඹුරුය. විපාකයන්ගේ වෙදනා සම්ප්‍රයොග නියමය දක්වීමෙහි විනිශ්චිත ඉෂ්ටානිෂ්ට ස්වභාව වනාහි අතිඋත්තානය. ලෞකිය මහජනයාගේ කැමැත්තට අනුව කියනලද්දකි. එහෙයින් පහනොකරනලද විපල්ලාස ඇති පෘථග්ජන ශෛක්ෂයන්ගේ චිත්තය ම ඒ ඉෂ්ටානිෂ්ට ස්වභාවය කාරණකොටගෙන අරමුණු අනුව ගමන් කරන්නේය. අරමුණු අනුව වෙදනා සම්ප්‍රයොග වන්නේය. එසේ අරමුණු අනුව වෙදනා සම්ප්‍රයොගය වන හෙයින් ම මෙසත්වයන්ට සසරකතරින් එතරවිය නොහැකිවී තිබේ. ඉදින් අරමුණු අනුව වෙදනා සම්ප්‍රයොගයට අවකාශ නොදී අරමුණු පිළිබඳව පවතින ඉටුඅනිටු බලය පෙරළා අරමුණු කට හැකිවේනම් සියලු සත්වයන්ටම සසර කතරින් එතෙරවිට ගොඩවිය හැක්කේය. ඒ අරමුණු පිළිබඳව පවතින ඉටුඅනිටුබලය පෙරලා අරමුණුකිරීමත් ප්‍රහීන විපල්ලාස ඇති රහත්පලයට පැමිණී මෙන්ම මස්තකප්‍රාප්තවන්නේය. ලෞකිය මහාජනසම්මත ඉෂ්ටානිෂ්ට ආරම්මණ රසය වනාහි වෙගවත් ගංගා ජලශ්‍රොතයකට සමවේ. අප්‍රහීන විපල්ලාස ඇති සත්වයන්ගේ ජවන පරම්පරාව කොතනකවත් සිදුරක් නැති වියලීගිය ලබුගෙඩියකට සමවේ. චතුස්සත්‍ය ප්‍රතිවෙධ ගාම්භීර්‍ය්‍යයෙන් සමන්විත වූ රහතුන්ගේ ජවන පරම්පරාව බලවත් කුම්භිලරාජයකු හා සමවේ. ඉදින් ලබුගෙඩිය වෙගවත් ජලශ්‍රොතයකට දමනුලැබීනම් ජලශ්‍රොතයට අනුවී එකපහරින්ම ගසායනුලැබේ. කුම්භිලරාජයා දමනුලැබීනම් ජලශ්‍රොතයට අනුනොවී සිත්කලුවූ තැනකට ගොස් සියකැමැත්තට අනුව සුවසේ වාසයකලහැක්කේය. මෙහි අප්‍රහීන විපල්ලාස ඇති සත්වයන්ගේ ජවන පරම්පරාව කියනලද වියලීගිය ලබුගෙඩිය හාසමානයි. රහතුන්ගේ ජවන පරම්පරාව කුම්භිලරාජයා හා සමානයි ඉෂ්ටානිෂ්ටාරම්මණ රසය වෙගවත් ජලශ්‍රොතය හා සමානයි. විපාක චිත්තය හා සම්ප්‍රයොගවූ වෙදනාවශයෙන් සලකා මෙය ඉෂ්ටාරම්මණයෙක, මෙය අනිෂ්ටාරම්මණයෙකැයි

මෙසේ වෙත්කරතලද එකම අරමුණෙහි පවා ඉෂ්ටාරස අනිෂ්ටාරසද ඇත්තේය. තදන්‍ය නානාරස නානාසවභාවද ඇත්තේය. එසින පෘථග්ජනයන්ගේ ජවන පරම්පරාව ඉෂ්ටානිෂ්ටාරම්මණ රසයෙහිම පරියාදානයට යමින් පවත්නීය. රහතුන්ට වනාහි කැමැතිවූ අරමුණු රසයක්ගෙන කැමැතිවූ වේදනාවකින් යුක්තව වාසයකල හැක්කේය. නානා රසද රසාධාර ආරම්මණයෙන් අන්‍ය නොවේ. එහෙසින් විපාකචිත්තය හා සම්ප්‍රයොගවන වෙදනාවශයෙන් ලබතලද ඉටුඅනිටුනම් ඇත්තාවූ ආරම්මණය නානා රසනානා සවභාවයෙන් යුක්තවී අනිටු අරමුණු ඉටු අරමුණු වනුයේද නොවේ.

තවද විකල්පශක්ති අනුබොධශක්ති ප්‍රතිවෙධශක්ති සහිත කුශලාකුශල ක්‍රියා ජවනයන්ගේ අතිඉෂ්ටාරම්මණයෙහි පවා උපෙක්ෂා වෙදනා සම්ප්‍රයොගයට හෙතු ඉතා බොහෝය. අති අනිෂ්ටාරම්මණයෙහි පවා සොම්නස් වෙදනා සම්ප්‍රයොගයට හෙතු ඉතා බොහෝය. ඒ එසේමය. භාග්‍යවතුන්වහන්සේගේ සූකරපොතිකා දශීනයෙන් සිනාපහල කිරීමෙහි පළමුකොට උපෙක්ෂා සම්ප්‍රයොගයට අවකාශ ඇතිවීය. ඒ සූකරපොතිකාවගේ පූර්වභවයන්පිළිබඳව වෘත්තයාගේ විචිත්‍රත්‍වයදැක සොම්නස් සම්ප්‍රයොගයට අවකාශ ඇතිවිය. මෙහි ජවන වනාහි විචාරණ ප්‍රඥාවෙන් යුක්තාවූ හෙයින් මහාක්‍රියා සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත ජවනම වියයුතුය. පූර්වභාගයෙහි එසේ දශීන කෘත්‍යයෙන් යුක්තව උපන් සොම්නස් සහගත ජවන වීථිය වනාහි පසුව සූකරපොතිකා නැමති අනිෂ්ටාරම්මණය පවා අරමුණුකොට හසන කෘත්‍යයෙන් යුක්තව හසිතොත්පාද සොම්නස් ජවනයට උපනිශ්‍රය හෙතුවිය. උලූකපක්ෂි දශීනයෙන් සිනා පහලකිරීමෙහිද මහාමෞද්ගල්‍යාන ස්ථවිරයන්ගේ ප්‍රෙත දශීනයෙන් සිනාපහලකිරීමෙහිද විනිශ්චය මෙසේමය.

ඉදින් ධනවතකු විසින් බලු කුණප සියගණනක් සොයාදුනහොත් කහවණු සියගණනක් දෙනබව කියා යම්කිසි අසරණ දුප්පතකු මෙහෙයනලද්දේවීනම් ඒ අසරණ දුප්පතා හට බලුකුණප දකින්නට දකින්නට සොම්නස් අධිකව උපදීමය. ඔහුතුල කහවණු කෙරෙහි ඇතිවන සොම්නස්ජවන වෙගය බලු කුණප කෙරෙහි සොම්නස් ජවනොත්පාදයට බලවත් උපනිශ්‍රය වේ. සසර දුකින් මිදෙනු කැමැත්තෙන් කමටහන් පිණිස අසුභ අරමුණු සොයායන යොගාවචරයා හට උද්ධුමාතක අසුභ ආරම්මණයක් සමමුඛවූවිටද කරුණා බ්‍රහ්මවිහාර භාවනා පිණිස

අරමුණු සොයායන යොගාවචරයාහට ක්‍රිමින් විසින් තුඩුදී ලේ මස් අනුභව කරනලදුව සර්වාඞ්ගයෙහි හටගත් වණමුවින් හැරව ගලමින් දුකටපත්ව වාසයකරන කුෂටරොගී ආරම්මණයක් සම්මුඛවූවිට පරිකර්ම අවස්ථාවට පූර්වභාගයෙහි පටන් අර්පනා ධ්‍යානාධිගමය දක්වා සොම්නස් ඇතිවන්නාවූ ජවනොත්පාදයට උපනිශ්‍රයවූ හෙතුදමේ නයින් දතයුතු.

විදර්ශනා භාවනායෙහිද භය ඤාණ ආදීනව ඤාණනිබ්බිද ඤාණ අවස්ථායෙහි ත්‍රෛභූමික ධර්මයන්ගේ අතිශයින් අනිස්ථිර ස්වභාව භයානක ස්වභාව වැටහී එන්ට එන්ට සොම්නස් අධිකවිමද මෙසේ දතයුතු.

මේ ආකාරයෙන් අසරණ දුප්පතාහට කහවණු සියගණනක් ලබාදීමට උපකාරවූ ප්‍රත්‍යරසය අතිශයින් දුර්ගීතිය බලුකුණප වලෑම ඇතිවිය. විශෙෂයෙන් ස්වකීය ස්වකීය චරිතයට අනුකූලවූදපූර්වයෙහි පුරුදුකරනලද්දැවූද අසුභාරම්මණ දුඃඛිත සත්වාරම්මණයන් සොයායන්නාවූ යොගවචරයන්ට සසරදුකින් වහා මිදීමට උපකාරවූ ප්‍රත්‍යරසය උද්ධුමාතක අසුභ වස්තු දුර්ගීතීය කුෂටරොගී වස්තුවල ඇතිවෙයි. විදර්ශනා යොගීන්ටද වහා සමුදයප්‍රහාණයට උපකාරවූ ප්‍රත්‍යරසය ත්‍රෛභූමික ධර්මයන් පිළිබඳව පවත්නා අතිභය භයානක ගතියයි කියනලද දුඃඛලක්ෂණයෙහි ඇතිවෙයි. බලුකුණුපාදියෙහි ඇතිවූ මේ ආරම්මණ රසය වූකලී එය අරමුණු කොටගෙන උපදින්නාවූ ජවනයන්ගේ සොම්නස් සම්ප්‍රයොගය පිණිස උපකාරවේ. මේ ආදී වශයෙන් සසඳගතයුතු.

මෙසේ සසඳගන්ට නොදන්නාවූ ඇත්තන්ට කහවණු අරමුණුකරන වීථිය අතිකක්ය. බලු කුණප අරමුණුකරන වීථිය අතිකක්ය. කහවණු අරමුණුකරන වීථිය සොම්නස් ජවනයෙන් යුක්තය. බලුකුණප අරමුණුකරන වීථිය සොම්නස් ජවනයෙන් විප්‍රයුක්තය කියා මෙසේ වැටහෙනු නොඅනුමානය.

මෙතෙකින් ක්‍රියා ජවනයන්ට වනාහි කුශලාකුශල ජවනයන්ටමෙන් විපාක වෙදනා වශයෙන් පිරිසිඳ දක්වනලද ඉෂ්ටානිෂ්ටආරම්මණයන්හි ආරම්මණානුකූලව වෙදනා සම්ප්‍රයොග නියමය නොකටයුතු බව දක්වනලදි. ඒ එසේමය. මෙබඳු ස්ථානයන්හි ආරම්මණානුකූලව වෙදනා සම්ප්‍රයොගය සම්භාවනීය නොවේ. එසේ ආරම්මණානුකූලව වෙදනා අසම්ප්‍රයොගයම අතිශයින් සම්භාවනීයවේ.

අකුශල ජවන කුශල ජවන ක්‍රියාජවන යන තුන්කොටස අතුරෙන් සමහර කාලෙක අකුශල ජවනයන්ගේ ආරම්මණානු

කූලව වේදනා සම්ප්‍රයොගය විපල්ලාසය නිසා වියහැකිය. සම්හර කලෙක ආරම්මණානුකූලව වේදනා අසම්ප්‍රයොගයද විපල්ලාසය නිසාම වියහැකිය. මෙසේ කීමට අවකාශ තිබේ. කුශල ජවනයන්ගේ ආරම්මණානුකූලව වේදනා සම්ප්‍රයොගය අසම්ප්‍රයොගය යන දෙකම විපල්ලාසය නිසාද වියහැකිය. ආදීනව දර්ශන ආනිශංස දර්ශනය නිසාද වියහැකිය. අනුබොධ ඥානය ප්‍රතිවෙධ ඥානය නිසාද වියහැකිය. ක්‍රියා ජවනයන්ගේ ආරම්මණානුකූලව වේදනා සම්ප්‍රයොග අසම්ප්‍රයොග දෙක වනාහි විපල්ලාසය හැර ඉතුරු සතර නිසා වියහැකිය.

දුර්බොධ ස්ථානයක් නිසා තරමක්දුර නිදසුන් දක්වා සැලකළබව සැලකුව මැනව.

“විරොධොතති සුඛාලෙකො. සමගගා උතති දුකකරා” යනාදීන් දෙවා වදාළ අවවාද සියල්ලක් සිත්හි ධාරණයකරගනිමි. එහෙත් යටපත් නොවියයුතු යථා භූතාර්ථය නානාචාර්ය මත නිසා යටපත්වේදෝ යන කල්පනාවෙන් මදක් තදින් සැලකළෙමි. පූර්වාචාර්යවරයන්ට අගෞරවයෙන් කළ සැලකිරීමක් නොවේ.

රජොහාරෙමනි ථෙරානංසාසනං යෙහි ආහතං,
පාදඩීනි ච සබ්බානි තෙසං වහාම්ම තථෙතො.

රජං හරනති අපනෙනති එත්ථ එතෙනාතිවා රජොහාරෙ පාද පුඤ්ඤජනවත්ථ වටටි. ආහතනති පඨමසඞගීතිතො පඪායයා වජජිත නා ආහතං.

මෙසේ අභිධර්ම සංවර්ණනාවෝ සූත්‍රාන්ත පාලියට සමනොවෙත්යයි විමති උපදවා විරුද්ධමත දක්වා කියනලද ආචාර්යවාදය මතු දක්වන හයින් නිස්සාර වාදයක් බව දතයුතු.

අභිධර්ම සංවර්ණනාවෝයයි කීතන්හි “මූල” ටීකාව හැර අතිරික්ත සංවර්ණනා ගතයුතු. “මූල” ටීකාචාරීන්වහන්සේට වනාහි ක්‍රියා ජවනයට අනතුරුව තදාරම්මණ පතනය පවා අනභිමත බව පෙනේ. එහෙයින් “සොමනසස සහගතතිහෙතුක අසඞඛාරික චිතෙතනහි කමෙම ආයු හිතෙ තාදිසෙනෙව විපාක චිතෙතන ගහිත පටිසනධිකසස චකඛුවාරෙ ඉඨාරමමණෙ ආපාත ගතෙ හෙඨාවුතතනයෙ තෙ වතයො මොඝවාරා හොනති. තසස කුසලතො චතතාරි සොමනසස සහගතානි අකුසලතො චතතාරි කිරියතො පඤචාති ඉමෙසං තෙර සතතං චිතතානං අඤඤතරෙන පරියොසානෙ තදාරමමණං පතිඨ හ මානං සොමනසස සහගතා අසඞඛාරිත ති හෙතුක චිතතංපි දු හෙතුක

චිත්තංපි පතිඨාති” යනුවෙන් මොරවාපී වාසී “මහාදත්ත” සළුවිර වාදය දක්වා කියනලද අඨසාලිනී අඨකථා පාඨය “කිරියතො පඤ්චාති ඉමෙසං – පෙ – පතිඨාතීති කිරිය ජවනානන්තරඤ්ච තදාරම්මණං වුත්තං. පඨානෙපන කුසලාකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජතීති විපාක ධම්ම ධම්මාන මෙව අනන්තරං තදාරම්මණං වුත්තං කුසලත්තිකෙච සෙක්ඛාවා පුථුජ්ජනාවා කුසලං අනිච්චතොති ආදිනා කුසලාකුසල ජවන මෙවවත්වා තදනන්තරං තදාරම්මණං වුත්තං. නඅබ්‍යාකතානන්තරං නච කත්ථචි කිරියානන්තරං තදාරම්මණස්ස වුත්තට්ඨානං දිස්සති. විජ්ජමානෙව තස්මිං අවචනෙ කාරණං නත්ථි. තස්මා උප පරික්ඛිතබ්බා එස ථෙර වාදො. විප්ඵාරිකංහි ජවනං නාවං වියනදීසොතො භවඞ්ගං අනුබන්ධතීති සුත්තං. නපන ඡළඞ්ගු පෙක්ඛවතො සන්ත වුත්තිං කිරිය ජවනං පණ්ණපුටං වියනදී සොතොති” යනුවෙන් නිදසුන් සහිතකොට කරුණු දක්වා ප්‍රතික්ෂෙපකොළේය.

අනුටීකාචාර්‍ය්‍යන්වහන්සේද “එත්ථ කෙචි ඡළඞ්ගු පෙක්ඛවතොපි කිරියාමයචිත්තතාය කිරියා ජවනස්ස විප්ඵාරික භාවො නසක්කානිසෙ ධෙතුනන්ති නිදස්සන භාවෙන පණ්ණපුට මූපනීතං අසමානං. කිරිය ජවනානන්තරං තදාරම්මණාභාවස්ස පාළියං අවචන මපි අකාරණං. ලබ්භමානස්සාපිකත්ථචි කෙනචි අධිප්පායෙන අවචනතො. තථාහි ධම්මසඞ්ගහෙ අකුසලසනිද්දෙසෙ ලබ්භමානොපි අධිපති න වුත්තො. තස්මා කිරිය ජවනානන්තරං තදාරම්මණා භාවො වීමංසිතබ්බොති වදන්ති” යනුවෙන් අටුවාවෙහි සොම්නස්සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික මහාකුශල කාම්විපාකයෙන් පිළිසිඳගත් පුද්ගලයාහට අතිඉෂ්ටාලම්බනයෙහි සොම්නස් ජවන තෙළෙස් (13) දෙනාහට අනතුරුව ත්‍රිහෙතුක ද්විහෙතුක සොම්නස් සහගත අසංස්කාරික තදාලම්බන වන බව දැක්වූ මහාදත්ත සළුවිර වාදයට විරුද්ධව ඔරුව පසු පස්සෙන් ජලශ්‍රොතය ගමන්කරන්නාක් මෙන් චඤ්චල ස්වභාව ඇති කුශලාකුශල ජවනයන්ට අනතුරුව පිඞිභවඞ්ගවන බවද කොළ ගොටුවට බඳු ශාන්ත ස්වභාව ඇති ක්‍රියාජවනයන්ට අනතුරුව පිඞිභවඞ්ග නොවනබවද අටුවාවට විරුද්ධව තරයේකී මූල ටීකාචාර්‍ය්‍යන්වහන්සේටත් විරුද්ධව ඡළඞ්ගුපෙක්ෂක රහතුන්ගේ ක්‍රියාචිත්තයද කායවාග් ව්‍යාපාර ජනකවූයෙන් චඤ්චලය එහෙයින් පණීපුට නිදර්ශනය නොගැලපේයයි ප්‍රතික්ෂෙපකොට

ධම්සඞ්ගනි ප්‍රකරණයෙහි අකුශල නිර්දේශයෙහි සහ ජාතාධිපති ප්‍රත්‍යය ලැබෙත් මුත් එය උදුරා නොවදාළාක්මෙන් මෙහි

තදාරම්මණය නොවදාරා හැරීමද ක්‍රියා ජවනයට අනතුරුව තදා රම්මණ නොවීමට කරුණු නොවේ යයි කී කෙව් වාදය දක්වා "සතිපි කිරියා මයනෙන සබ්බ ඵතාදි භාවපප්පත්තාතං ඛීණාසවානං ජවන චිත්තං න ඉතරෙසංවිය විපඵාරිකං සන්ත ස භාවතායපන සනති සිතතරසං සියාති තසසපණණ පුමනති දසසිතං – පෙ – තඤ්ච වීමංසාය කෙසුචි සබ්බසඤ්ඤ අධිපතීනං අභාවතො එක රසං දෙසනං දස්සෙතුං තදුඛමොතිච සක්කා වත්තුං ඉධපන නතාදිසං අවච නෙකාරණං ලබ්භන්තීති අවච නෙකාරණං නත්ථීති වුත්තං" යි අකුශලයෙහි සහ ජීතාධිපති ප්‍රත්‍යය නොවදාරා හැරීමටකාරණා සොයා දක්වා ක්‍රියා ජවනයට අනතුරුව තදාරම්මණ නොවාදාරා හැරීමට කරුණුවූකලී සොයාගත නොහීව මූල ටීකාචාර්‍ය්‍යී මතයටම අනුගතවීය. කරුණු සොයා කියතහොත් කුශලාකුශල ජවනයන්ට අනතුරුව ඇතිවිය හැකි තදාරම්මණ භවඞ්ග චුති යන තුන්කොටස එකට පිඩුකොටගෙන "කුසලං වුඨානස්ස අකුසලං වුඨානස්ස" යයි වදාළාක්මෙන් අනන්තර ප්‍රත්‍යායෙහිදී ඒ තුන්කොටස එකට පිඩුකොටගෙන "කිරියංවුඨානස්ස" යයි වදාළබව කියහැක්කේය. ආරම්මණප්‍රත්‍යයෙහි වනාහි "අබ්‍යාකතොධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙනපච්චයො" යන උද්දෙස විධි පාලියෙහි අභිධෙය වශයෙන් පෘථග්ජන ශෛක්ෂයන්ට කුශලාකුශල ජවනයට අනතුරුව තදාරම්මණ පමණක් මුත් කුශලාකුශල ජවනනොලැබේ. එහෙයින් "කුසලෙ නිරුද්ධෙ අකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති" යි නිර්දේශඅනුවාද පාලිය වදාළබව පෙණේ රහතුන්ට වූකලී මූලපටන් ක්‍රියාජවනම ලබ්‍යමාන හෙයින් පෘථග්ජන ශෛක්ෂයන්ට වඩා වෙනස දක්වනු පිණිස "අරහා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති" කියා පමණක් වදාළා මිස "කිරියෙ නිරුද්ධෙවිපාකො තදාරම්මණතා උප්පජ්ජති" කියා නොවදාළේය. මෙසේ සොයතහොත් සෑහෙන කරුණු සොයගත හැක්කේය. එහෙයින් මූල ටීකාචාර්‍ය්‍යී මතයට අනුගත නොවී අටුවාවෙහි කියනලද මහාදත්ත ස්ථවිර මතය වූ පරිද්දෙන් ක්‍රියා ජවනයට අනතුරුව තදාරම්මණ සම්භවය ඇදහිය යුතු. එසේම අඤ්ඤ කථායෙහි කී පරිද්දෙන් ක්‍රියා ජවනයන්ගේ සහ තදාරම්මණයන්ගේ ආරම්මණානුකූල වේදනා සම්ප්‍රයොගයද ඇදහිය යුතු. මේබඳු ස්ථානයන්හි ධර්ම ස්වභාව නොවැටහේනම් වැටහිමට තරම් විශෙෂ කාරණා සොයා පරීක්ෂාකිරීම වටී. එසේ නොව අක්ෂි රොමයක පමණ දුර පෙණෙන ස්වකීය ඥාන මාත්‍රයෙන්

කරුණු සොයාබලා නුදුටු පමණින් අට්ඨ කථා මත ප්‍රතික්ෂෙපය සාපරාධයකි.

"බුද්ධෙන ධම්මො විනයොච වුත්තො.
යො තස්ස පුත්තෙහි තථෙව ඤාතො.
සො යෙහි තෙසං මති මච්ච ජන්තා.
යස්මා පුරෙ අට්ඨ කථා අකංසු."

යනු අට්ඨ කථා හෙයින් බුද්ධ මතය පරිද්දෙන් සකල ධර්මයන් අවබොධකර ගත්තාවූ ධර්ම සෙනෙවිසැරියුන් මහතෙරණුන් ආදී බුද්ධ පුත්‍රයින්වහන්සේලාගේ මත ප්‍රතිෂෙධ නොකොට තථාගත යන්වහන්සේගේ "අනන්තර නන්තර කථාප්‍රකීර්ණක දෙශනාව" ම මහාකාශ්‍යපාදි මහරහතන්වහන්සේලා විසින් පෙර අට්ඨ කථා වශයෙන් ගෙන සඞ්ගායනාවට නගනලදී. එසේ සඞ්ගායනාවට නගනලද අට්ඨකථාවෝම සඞ්ග්‍රහාට්ඨ කථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහා ස්ථවිරපාදයන්වහන්සේ විසින් සංක්ෂෙපකොට භාෂා පරිවර්තන යෙන් පිළියෙල කරනලදහ. එහෙයින් ඒ අට්ඨ කථාවන් පෙල පාලිය මෙන්ම ගරුතන්හි තබා ඇදහිය යුතු බව සැලකිය යුත්තේය.

අට්ඨ කථාචාරීන්වහන්සේලා උලාරජ්ඣාසය සම්පන්න යථාභූතාර්ථ වෙදී විසාරද බුද්ධි මහත්තයෝමය.

එහෙයින් ප්‍රස්ථාන අට්ඨ කථාදි අභිධර්ම සංවර්ණිතා සූත්‍රාන්ත පාලියට ගැලපෙනලෙස සසඳා ගතයුතු. කෙසේද ? යත්. සමර්ථ චක්ෂු විදර්ශිතා චක්ෂු විරහිත අන්ධබාල පෘථග්ජනයෝ උම්මත්තක ජනයන් මෙන් ස්වකීය චිත්තය වසඟකර ගතනොහීව සංඥා චිත්තදෘෂ්ටි විපර්‍ය්‍යාස වශයෙන් ඒ ඒ ආරම්මණයන්හි විපරීත ග්‍රහණයට බැසගනිත්. එහෙයින් ඔවුන්ට වාසනා පරිචය පරිණාමනාදි භාවයෙන් පරිභාවිතයොනිසො අයොනිසො මනසකාර යට අනුව කුශල අකුශල ජවනයන් උපදින බව දතයුතු.

බලුකුණප සියගණනක් සොයා දුනහොත් කහවණු සිය ගණනක් දෙන බව කී පමණින් පවා ඉෂ්ටාරම්මණවූ කහවණු කෙරෙහි මෙන් අන්‍යජනයන්ට සහ අන්‍යකාලයකතම් තමන්ට මත් පිළිකුල්වූ බලුකුණප පවා ඒ කාලයෙහි ඒ අසරණ දුප්පතා හට සොම්නස් සහගත ප්‍රීතිය ඇතිවීමට හෙතුවීමෙන් ඉෂ්ටාලම්බන වශයෙන් වැටහිය. එසේ වැටහුණු පරිද්දෙන්ද ඒ බලුකුණප රූස ඒ වේලාවෙහි ඔහුට පුද්ගල ඉෂ්ටාලම්බන පරිකල්ප

ඉෂ්ටාලම්බන වේමය. කහවණු පමණක් නොව ඒ කහවණු ලැබීමට හෙතු වූ අනිෂ්ටාලම්බන බලුකුණපද අරමුණු වූවිට ඉතා බලවත් සොම්නස්සහගත ප්‍රීතිය උපදීමය. යොනී දුෂ්ටකම් දුෂ්ට බලු කපුටු මලප්‍රෙතාදී සත්‍වයන්ට කියනුම කවරේද ? සජී ප්‍රකාරයෙන් ප්‍රගින කරනලද විපශ්‍යනාඥ ඇති බුඬ ප්‍රත්‍යෙක බුඬ ක්‍ෂීණාශ්‍රවයන්වහන්සේට වනාහි තමන්වහන්සේලා චිත්තිස්සරිය ගුණයෙන් යුක්තවූ හෙයින් ජලමාගීය දක්නා නාවිකතෙම සවකීය අදහසට අනුව නෞකාව ගෙනයන්නාක් මෙන් සුලං පාර දක්නා පක්‍ෂි රාජතෙම කැමැති දිශාවකට පියාසරකර යන්නාක් මෙන් අතිශයින් දුර්දශීනීය අනිෂ්ට සත්‍වාරම්මණයන්ද අතිශයින් පිළිකුල් කටයුතු අසුචි මලමුත්‍රාදී ආරම්මණයන්ද හමුවූවිට උත්තානවශයෙන් නොගෙන විචාරණ ප්‍රඥාවෙන් විමසා නන්දනීය සත්‍ව ප්‍රඥප්තිකොටගෙනද පෘථිවි ආපොධාත්වාදී වශයෙන් ඉෂ්ටාරම්මණ කොට ගෙනද සොම්නස්සහගත ක්‍රියා ජවන ඉපදවිය හැක්කේය. අතිශයින් දශීනීය සත්‍වාරම්මණයන්ද රන්රිදී මුතුමැණික්වෛඩූර්‍ය්‍යවස්ත්‍රාභරණාදී ආරම්මණයන්ද හමුවූවිට උත්තානවංශයෙන් නොගෙන විචාරණ ප්‍රඥාවෙන් විමසා ප්‍රතික්කූල අසුභාරම්මණකොට ගෙනද අනිත්‍යදුඃඛ අනාත්ම කොටගෙනද උපෙක්‍ෂා ක්‍රියාජවන ඉපදවිය හැක්කේය. බුඬ ප්‍රත්‍යෙක බුඬ ක්‍ෂීණාශ්‍රවයන්වහන්සේලා පමණක් නොව වඞ්ගීස ස්ථවිරයන්වහන්සේ පවා මහණ උප සම්පදාවෙන්නවක අවස්ථාවෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ සමඟපිඩු පිණිස යනුයේ රූබරින්යුත් මාගමක් දැක සුභනිමිත්ති වශයෙන් ගෙන කාමරාගාග්නියෙන් දැවෙන ලද්දේ :-

කාමරාගෙන දය්හාමි, චිත්තං මෙපරිදය්හති,
සාධු නිබ්බාපනං බ්‍රෑහි, අනුකම්පාය ගොතම.

යනුවෙන් සැලකලවිට අයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේ විසින්,

සඤ්ඤාය විපරියෙසා චිත්තං තෙ පරිදය්හති,
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූප සඤ්හිතං,
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං.
සඞ්ඛාරෙ පරතොපස්ස දුක්ඛතො නොච අත්තතො,
නිබ්බාපෙහි මහාරාගං මාදය්හිත්ථො පුනප්පුනං.

යනුවෙන් වදාළ අවවාද ලැබ මාගම පිළිබඳව ඇතිවූ සුභ නිමිත්තාරම්මණය විෂ්කම්භනය කොට සිත අසුභාරම්මණයෙහි බස්වා කාමරාග නමැති ගින්න නිවාලීමෙන් පිඩු පිණිස හැසිරීය.

එහෙයින්,

යං පස්සති න තං දිට්ඨං යං දිට්ඨං තං න පස්සති,
අපස්සං බජ්ඣතෙ මූළ්හො බජ්ඣමානො න මුච්චති.

යන ගාථාව වදාළසේක. මේ ගාථාවට සතිපට්ඨාන විභඞ්ග ටීකායෙහි "යං පස්සති ඉත්ථිං වා පුරිසං වා තං න චක්ඛුනා ඉත්ථිපුරිස දස්සනං නත්ථීති සච්චං ඉත්ථිං පස්සාමි පුරිසං පස්සාමීති පන පවත්ත සඤ්ඤාය ච සෙනයං පස්සතීති වුත්තං මිච්ඡා දස්සනෙනවා දිට්ඨියා යං පස්සති න තං දිට්ඨං තං රූපායතනං න හොති රූපායතනං වා තං න හොතීති අත්ථො. අථවා තං කෙසාදි භූතුපාදාය සමූහ සඞ්ඛාතං දිට්ඨං න හොති දිට්ඨංවා යථා වුත්තං න හොතීති අත්ථො. යං දිට්ඨං තං න පස්සතීති යං රූපායතනං කෙසාදි භූතුපාදාය සමූහ සඞ්ඛාතං වා දිට්ඨං තං පඤ්ඤාචක්ඛුනා භූතතො න පස්සතීති අත්ථො." යනුවෙන් කරනලද සංවණ්ණනා පරිද්දෙන් විපර්‍යාසානුගත අන්ධ පෘථග්ජනයන් විසින් ප්‍රකෘති චක්ෂුසින් දක්නාලද ස්ත්‍රී පුරුෂාදි නිමිත්ත වනාහි තත්වාකාරයෙන් දක්නාලද්දක් නොවේ. එසේ නුවණැසින් දැකියයුතු කෙසාදි කාය කොට්ඨාසයන්ද භූතුපාදාය රූපයන්ද යථාභූත ඥාන චක්ෂුසින් නොදක්නාවූ බාල අන්ධ පෘථග්ජනයන්ට තෘෂ්ණා වයයි කියනලද සමුදය සත්‍ය රැහැණින් බැඳී සිටින හෙයින් සංසාර වෘත්ත දුඃඛයෙන් මිදීයා නොහැක්කේය. යනු භාවයි. මෙහි මම ස්ත්‍රියකු බලමි පුරුෂයකු බලමියි සිතා බැලීමෙන් පැනෙන ස්ත්‍රී ඒකාන්තයෙන් විද්‍යමාන ස්ත්‍රියක් නොවේ. පුරුෂයා ඒකාන්තයෙන් විද්‍යමාන පුරුෂයෙක් නොවේ. හුදෙක් එපැනෙන සවභන ලෝභය ප්‍රමාදය ආදී ක්ලෙශයන්ගේ උත්පත්තියට කාරණා වූ ඉෂ්ට සුභනිමිත්ත මාත්‍රයකි. සමථ විදර්ශනා ප්‍රඥාචක්ෂුසින් පෙනීයන කෙස් ලොම් ඇට නහර මලමූත්‍ර රාශියම භූතරූප උපාදාරූප රාශියම අනිත්‍ය දුඃඛ අනාත්ම ධර්ම රාශියම නිබ්බිඥ ඤාණාදියට කාරණාවූ අනිෂ්ට අශුභාදි අරමුණුවේ. මෙසේ ස්ත්‍රී පුරුෂාදි එකම වස්තුවක් නමුදු ඉෂ්ට අනිෂ්ට වශයෙන් උභය ප්‍රකාරවීමෙන් ආරම්මණික චිත්තොත්පාද දෙකොට්ඨාසයක් ඉපදවිය හැක්කේය.

මීට නිදර්ශනයක් නම් පෙර පාරු වෙළඳ සමූහයක් පාරුවක බඩු පටවාගෙන වෙළඳාම පිණිස බොහෝ දින ගණනක් මුළුල්ලෙහි ගොස් එක්තරා ප්‍රත්‍යන්ත ග්‍රාමයකට රාත්‍රි කාලයෙහි පැමිණියේය. ඔව්හු බොහෝ දින ගණනක් පාරු පැදීමෙන් කලාන්තවූ හෙයින්ද රාත්‍රි කාලයෙහි ගමට පැමිණි හෙයින්ද ආහාර පිසගැනීම දුෂ්කරවී අසල ගේකට ගොස් කෑමට යමක් ඉල්ලූවිට ගැඩවිලි පණුව ව්‍යඤ්ජනයකුත් සමග බොහෝ බත් ව්‍යඤ්ජන රාශියක් ලැබුනේය. එය ගෙනගොස් පාරුව උඩ පහන් ආලෝකයක් නැති අන්ධකාරයෙහි තබාගෙන සාගිනි කලාන්තයෙන්ම අර ව්‍යඤ්ජනය හොඳය. මේ ව්‍යඤ්ජනය හොඳය යනාදීන් පසසමින් අනුභවකොට ඉතුරු බත්ව්‍යඤ්ජන උදෑසන අනුභවකිරීම පිණිස තබා නිදාගත්තෝය. උදෑසන නැගිට ගැඩවිලි පණුව ව්‍යඤ්ජනය දැක ඉතා පිළිකුල් උපදවා රාත්‍රියෙහි අනුභව කරනලද බත් ව්‍යඤ්ජන සියල්ලම වැමෑරුවෝලු.

මෙහි එකම ගැඩවිලි පණු ව්‍යඤ්ජනය ඇසින් නුදුටු අවස්ථායෙහි ඉටු අරමුණු වශයෙන්ද දුටු අවස්ථායෙහි අනිටු අරමුණු වශයෙන්ද නොහොත් ජිව්හාද්වාරයෙහි ඉටු අරමුණු වශයෙන්ද චක්ෂුද්වාරයෙහි අනිටු අරමුණු වශයෙන්ද නොහොත් ප්‍රත්‍යන්ත ග්‍රාමවාසීන්ට ඉටු අරමුණු වශයෙන්ද පාරුකාර වෙළඳුන්ට අනිටු අරමුණු වශයෙන්ද වැටහින. මෙසේ එකම අරමුණක් නමුදු සොම්නස් දොම්නස් යන උභය වේදනා සම්ප්‍රයොගවූ ජවන උපදවන බව දතයුතු.

විශුද්ධි මාර්ගාදී අර්ථ කථාවලද කිරිබොන ළදරුවන්ගේ අසූචි චක්ෂුද්වාර කායද්වාර දෙක්හි ඉෂ්ටාරම්මණ වශයෙන්ද ඝ්‍රාණද්වාර ජිව්හාද්වාර දෙක්හි අනිෂ්ටාරම්මණ වශයෙන්ද චක්‍රවර්ති රජහුගේ මාණික්‍යරත්නය සෙමින් අල්ලා බලන්නවුන් තුළ කුශල විපාකොත්පත්තියට කාරණාවූ ඉෂ්ටාරම්මණ වශයෙන්ද එය ශීර්ෂාදියට ගසාගැනීමෙන් අකුශල විපාකොත්පත්තියට කාරණාවූ අනිෂ්ටාරම්මණ වශයෙන්ද අරමුණු වන බව දතයුතු. මෙසේ ද්වාර ප්‍රයොග සඞ්ක්‍රමනයෙන් විභාගකළවිට ප්‍රකෘති සත්වයන්ට පවා ඉෂ්ටානිෂ්ට භේදය ඇතිවන හෙයින් සුඛ දුඃඛ සොමනස්ස දොමනස්ස භේදය වන්නේයයි කීහ. බුදුන් රහතුන්වහන්සේලාට වනාහි කියනුම කවරේද? උන්වහන්සේලා කැමැති පරිද්දෙකින් ආරම්මණ සඞ්ක්‍රමනය කළ හැක්කෝමය. එසේ සඞ්ක්‍රමනය කරනු ලබන ආරම්මණයන්ට අනුවද සොම්නස් උපෙක්ෂා සහගත ජවන සහ සොම්නස් උපෙක්ෂා සහගත තදාරම්ම

ණද ඇතිවන බව දතයුතු. "විභඞ්ග අනුටීකා" යෙහිදු කිරිය ජවනානං පනවිසයාභි සඞ්ඛරණස්ස බලව භාවතො තදනන්තරානං තදාරම්මණානං යථා විසයං විසය වෙදනා ච සෙන තදනුගුණතා ඉච්ඡිතා" යනු කීහ. එහි අර්ථ :–

කිරිය ජවනානං පන, ක්‍රියා ජවනයන්ගේ වනාහි ; විසයාභිසඞ්ඛරණස්ස, විසයාභි සංස්කරණය නමා ; බලව භාවතො, බලවත් බැවින් ; තදනන්තරානං, ඒ ක්‍රියා ජවනයන්ට අනතුරු උපදින්නාවූ ; තදාරම්මණානං, තදාරම්මණයන්ගේ ; යථා විසයං, විසයානුකූලව ; විසය වෙදනා වසෙන, අරමුණු රස විඳීම් වශයෙන් ; තදනුගුණතා, ඒ ජවනයට අනුකූලතාවය නොහොත් ඒ ජවනය හා වෙදනා සදෘශතාවය ; ඉච්ඡිතා, කැමැති වන ලද්දීය.

මෙසේ කියනලද ආරම්මණ සඞ්ක්‍රමන අභිසංස්කරණය යථොක්ත ආචාර්ය්‍ය මතයෙහිද විපාකචිත්තය හා සම්ප්‍රයොග වන වෙදනාවශයෙන් සලකා ඉෂ්ටය කියා අනිෂ්ටය කියා පිරිසිඳිනලද එකම ආරමුණෙහි පවා ඉෂ්ටරස අනිෂ්ටරස නානා රස නානා ස්වභාව ඇති බව ප්‍රකාශකොටද සැන්ද ඉනේ ගසාගෙන සැළිය උතුරා එනවිට ශොකයට පත්ව සැන්ද සොයාගනනුහු පුරුෂයා මෙන් යථා භූතාර්ථ අවබොධයට හැරිද නානා රසයක් රසාධාරයෙන් අනිකක් නොවේය යනාදියෙන් පිට පැනගිය බව පෙනේ. පාරමිතා පරිභාවිත **තථාගත ශරීරශ්‍රීය** පවා ඉෂ්ටාරම්මණයයි පිරිසිඳිනලද නමුත් මලමූත්‍රාදි කොටස් වශයෙන් බෙදා අරමුණු කලහොත් අකුශල විපාකොත්පත්තියට හෙතුවේමය. දර්ශනීය ප්‍රාසාදික අග්‍රමහෙසිකාදීන්ගේ මලමූත්‍රාදිය කියනුම කවරේද ? එහෙසින් භාග්‍යවතුන්වහසේ විසින්ම "කිං තෙවක්ක ලිඉමිනා පූතිකායෙන දිඨෙන" යනාදිය වදාරණලදී.

බුදුරජාණන්වහන්සේගේ උලූකපක්ෂි සූකරපොතිකා දර්ශනයෙහිද ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යාන** ස්ථවිරයන්වහන්සේගේ ප්‍රෙත දර්ශනයෙහිද ඒ සූකරපොතිකාදි වස්තු අතිකාරුණායමාන ප්‍රතික්කූල ජෙගුප්ෂිතව්‍ය වූයෙන් කෙසේනම් ආරම්මණ සඞ්ක්‍රමනයෙන් හසිතොත්පාද ජවන ඉපදවියද හැක්කේද? යත්. උලූකපක්ෂි සූකරපොතිකා ප්‍රෙත යන මොවුන් හමුවූ කල්හි ඔවුන්ගේ අනිෂ්ට විපාක ජනක අකුශල කර්මයන් දක ආශ්චර්ය්‍යමක් ඒ ගති විපත්තියට හෙතුවූ අකුශල කර්ම තමන්වහන්සේලා තුළ නැති හෙයින් ඉෂ්ටාරම්මණවූ ස්වකීය ආත්මභාව සම්පත්තිය අරමුණු

එමෙන් හසිතොත්පාද ජවන ඇතිවිය හැක්කේය යනු අටුවායි. ඒ එසේමය. පෙර එක්තරා තරුණයෙක් රැවුල ඇති හම්බයෙක් දැක අඬන්ට වන. එවිට ඒ හම්බයා විසින් ලමයෝ උඹ භය වෙන්ට එපායයි කියනලදින් මම උඹට භයවෙලා අඬනවා නොව උඹ දැක මාගේ නැතිවීගිය එළුවා සිහිපත්ව හඬමි " යි කී පිරුළමෙන් හසිතොත්පාද ජවන ප්‍රෙත උලූකපක්ෂි සූකරපොතිකාවන්ගේ වර්ණායතනාදි අනෞදාරික ආරම්මණ ෂට්කය යථාලබ්ධ වශයෙන් එල්බගෙන උපදින බවද අටුවායෙහිම තිබෙහෙයින් ලොකයෙහි ස්වකීය පුත්‍රයාහා සදෘශවූ කෙනෙක් දුටුවිට යම්සේ පුත්‍රස්නෙහය උපදවා ඇල්ම ඇති කෙරේද එමෙන් ස්වකීය එළුවා සිහිපත්වූ තරුණයා හට එළුවා කෙරෙහි ඇල්ම ඇතිවිය හැක්කේය. එළුවාට බඳු දික් රැවුල ඇති හම්බයා කෙරෙහිද ඇල්ම ඇතිවිය හැක්කේය. එපරිද්දෙන් ස්වකීය සන්තානය අරමුණු කොටගෙන ඇතිවියහැකි සොම්නස්සහගත හසිතොත්පාද ජවන සම්බන්ධයෙන්ම තමන් තුළ ඉපදියනොහැක්කාවූ ප්‍රෙතවර්ණය මේ ප්‍රෙතයාගේ වර්ණය හා සමානයයි කියා අති ඖදාරික ප්‍රෙත වර්ණය තමාතුළ ඉපදියනොහැකි අනෞදාරික ප්‍රෙතවර්ණය පිණිස ප්‍රතිසංස්කරණය කළ හැක්කේය. විචිත්‍ර නානා ගති වූකලී විචිත්‍ර මාත්‍රයෙන් ඉෂ්ටාරම්මණ වියහැකි නොවේ. එහි නානා ගතියන්හි අතිෂට ගතිද ඇතුළත් වේ එසේ ඇතුළත් වන හෙයින්ම විචිත්‍රයයි කී කල්හි " නාහං භික්ඛවෙ අඤ්ඤං එකනිකායම්පි ස මනුපස්සාමි යං එවං චිත්තං යථයිදං භික්ඛවෙ තිරච්ඡානගතාපාණා " යි වදාළ පරිදි බලු කපුටු ආදී හීන තිරශ්චීනයන්ගේ පටන් සියලු තිරිසන්නුද ඉටු අරමුණු වශයෙන් වැටහිය යුතුය. එහෙයින් යථොක්ත ප්‍රකාර ආරම්මණ සඞ්ක්‍රමණය පරිද්දෙන් " ඉධ ආනන්ද භික්ඛු සචෙ ආකඞ්ඛති පතිකකූලෙ අප්පටිකකූල සඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකකූල සඤ්ඤී තත්‍ථ විහරති " යනාදි වශයෙන් වදාළ සූත්‍රාන්ත පාලිය හා අභිධර්ම සංවර්ණනා ගඞ්ගොදකය හා යමුනොදකය මෙන් සංසන්දනය වනබව සැලකියයුතු.

එබැවින් අහඞ්කාර පරවසවූ දිමියා කියන කුඹා සනා පර්වතය බිඳහෙලන්නට ප්‍රයත්නකොට සව්මද ඉඟපිය සිඳගත්තාක් මෙන් අහඞ්කාර ඥාණයෙන් අත්‍යුන්ත නමැති ස්වර්ණ පර්වතය බිඳ හෙලන්ට ගොස් ඉඟපිය සිඳ නොගතයුතු.

ජවන ප්‍රවෘත්තිනයයි.

## දැන් අතීත භවඞ්ගාදි පදයන්ගේ නිර්වචන දක්වනුලැබේ.

"චක්ඛාරම්මණ සංඝට්ටණං අතික්ක මිත්වා ඉතං ගතං පවත්තං තෙනවා අතික්ක මිතන්ති අතීතං තදෙව උප්පත්ති භවස්ස අඞ්ගංකාරණන්ති අතීත භවඞ්ගං. විසදිසවිඤ්ඤාණුප්පත්ති හෙතු භාවෙන භවඞ්ග සන්තතිං චාලෙති තස්සවා චලනං භවඞ්ග මෙවවා චලනන්ති භවඞ්ගචලනං. තථා උපච්ඡිජ්ජති උපච්ඡිජ්ජනංවා භවඞ්ගුපච්ඡෙදො. චක්ඛාදි පඤ්චද්වාරෙ ආපාතගතං රූපාදි පඤ්චාරම්මණං ආවජ්ජෙති කිං නාමෙ තන්ති වදන්තං විය ආභුජතීති පඤ්චද්වාරාවජ්ජනං. තථා මනොද්වාරාවජ්ජනං. චක්ඛති අා විචක්ඛති සම වි සමං රූපංවා අස්සාදෙති, විභාවෙතිවාති චක්ඛු. සුණාතීති සොතං. ඝායතිගන්ධො පාදුනං කරෙතීති ඝානං. ජීවිතනි මිත්තං රසං අව්හායතීති ජිව්හා. විසෙසෙන කුච්ඡිතානං පාප ධම්මානං කොසාදී නංවා ආයො පවත්ති ඨානන්ති කායො. සබ්බත්ථ පසාදො යෙව. තස්මිං නිස්සිතං විඤ්ඤාණන්ති චක්ඛුවිඤ්ඤාණාදි. තමෙවාරම්මණං සම්පටිච්ඡති පටිග්ගණ්හන්තං වියහොතීති සම්පටිච්ඡනං. සම්මා තීරෙති වීමංසන්තං විය භවතීති සන්තීරණං. වවත්ථපෙති සුද්ධුසල්ලක්ඛෙන්තංවිය පවත්තතීති වොත්ථප්පනං. ජවති සීඝං ගච්ඡති වෙගසාපවත්තතීති ජවනං. තස්ස ආරම්මණ මාරම්මණ මෙ තස්සාති තදාරම්මණං" මෙසේවූ වචනාදී හෙයින් අතීත භවඞ්ගාදීහු නම් වෙත්.

මෙහි අර්ථ :- චක්ඛාරම්මණ සඞ්ඝට්ටණං, චක්ෂුරූපයන්හා ආරම්මණයන්ගේ සඞ්ඝට්ටණය; අතික්ක මිත්වා, ගැටීමට පළමුව ඉක්ම; ඉතං ගතං පවත්තං, පවතියි; වා, නොහොත්; තෙන, ඒ සඞ්ඝට්ටණයෙන්; අතික්කමිතං, සහොත්පාද සඞ්ඝට්ටණයට අවකාශ නොතබා ඉක්මව නලදී; ඉති (තස්මා), එහෙයින්; අතීතං, අතීත නම්වේ; තදෙව, ඒ අතීතයම; උප්පත්ති භවස්ස, විපාකස්කන්ධ නාමරූප සඞ්ඛ්‍යාත පවත්නා භවයාගේ; අඞ්ගංකාරණං, නොසිඳී පැවැතීමට කාරණය; ඉති (තස්මා) එහෙයින්; අතීත භවඞ්ගං, අතීත භවඞ්ග නම්වේ. විසදිස විඤ්ඤාණුප්පත්ති හෙතු භාවෙන, භවඞ්ග සන්තතියට සමනොවූ වීථි විඥානොත්පත්තීහුගේ හෙතු භාවයෙන්; භවඞ්ග සන්තතිං, භවඞ්ගසන්තතිය; චාලෙති, සොලවයි. වා, නොහොත් තස්ස, ඒ භවඞ්ගයාගේ; චලනං, සැලීමයි; වා, නොහොත්; භවඞ්ග මෙව, භවඞ්ගයම; චලනං, සැලීමයි; ඉති (තස්මා) එහෙයින්, භවඞ්ග චලනං, භවඞ්ග චලන නම්වේ; තථා, ඒ පරිද්දෙන්; උපච්ඡිජ්ජති, සිඳියි; වා, නොහොත්;

උපච්ඡිජ්ජතං, සිඳීමයි ; ඉති (තස්මා), එහෙයින් ; භවඞ්ගු පච්ඡෙදො, භවඞ්ගු පච්ඡෙද නම්වේ ; චක්ඛාදී පඤ්චද්වාරෙ, චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි ; ආපාථගතං, පෙරමුණුව වැටුණාවූ; රූපාදි පඤ්චාරම්මණං, රූපාදි පඤ්චාරම්මණය ; ආවජ්ජෙති, ආවර්ජනා කෙරේ ; එතං, මේ වචනාහි ; කිං නාම, කිමෙක ; ඉතිවදන්තං විය, මෙසේ කියන්නෙකුමෙන් ; ආභුජති, මෙනෙහිකරයි ; ඉති (තස්මා), එහෙයින්, පඤ්චද්වාරාවජ්ජනං, පඤ්චද්වාරාවර්ජන නම්වේ ; තථා,ඒහා සමානවචනාර්ථ හෙයින්ම ; මනොද්වාරාවජ්ජනං, මනොද්වාරාවර්ජන නම්වේ ; සම්විසමං, සම්විෂමය ; චක්ඛති ආචික්ඛති, කියයි ; වා, නොහොත් ; රූපං, රූපාරම්මණරසය ; චක්ඛති අස්සාදෙති, ආස්වාදකරයි ; වා, නොහොත් ; චක්ඛති විභාවෙති, ප්‍රකාශකරයි ; ඉති (තස්මා), එහෙයින් ; චක්ඛු චක්ෂු නම්වේ ; සුණාති, අසයි ; ඝායති ගන්ධොපාදානං කරොති ; ගන්ධාග්‍රහණයකරයි ; ජීවිත නිමිත්තං, ජීවිත නිමිත්තවූ ; රසං, රසාරම්මණය ; අව්හායති, කැඳවයි ; විසෙසෙන, විශෙෂයෙන් ; කුච්ඡිතානං, පිළිකුල් කටයුතුවූ ; පාපධම්මානං, මෛථුනාදිකුත්සිත ධර්මයන්ගේ ; වා, නොහොත් ; කෙසාදීනං, කෙශාදි කුණප කොට්ඨාසයන්ගේ ; ආයො පවත්තිට්ඨානං, ප්‍රවෘත්ති ස්ථානයි ; ඉති (තස්මා), එහෙයින් ; කායො, කාය නම්වේ ; සබ්බත්ථ, සියලු පස් පදයෙහිම ; පසාදෙයෙව, චක්ෂුරාදි ප්‍රසාද වස්තුරූපයම ලැබේ. තස්මිං, ඒ චක්ෂුරාදි ප්‍රසාදවස්තු රූපයෙහි; නිස්සිතං, නිඃශ්‍රිතවූ ; විඤ්ඤාණං, විඥානයි ; ඉති (තස්මා), එහෙයින් ; චක්ඛුවිඤ්ඤාණාදි, චක්ෂුර්විඥානාදි නම්වේ. තමෙවාරම්මණං, ඒ පඤ්ච විඥානයෙන් ගන්නාලද අරමුණම ; සම්පටිච්ඡති පටිග්ගණ්හන්තංවිය හොති, පිළිගන්නෙකුමෙන්වෙයි ; සම්මා, මනාකොට, තීරෙන්ති විමංසන්තංවිය භවති; විමසන්නෙකුමෙන් වෙයි ; වවත්ථපෙති සුට්ඨුසල්ලක්ඛෙන්තංවිය පවත්තති, මනාව සලකන්නෙකු මෙන්වෙයි ; ජවති සීඝං ගච්ඡති, ශීඝ්‍රවයයි ; වෙගසා විගසින් ; පවත්තති, පවතියි ; තස්ස, ඒජවනයාගේ ආරම්මණං ; ආරම්මණය, එතස්සඉති, මේ පිටසී භවඞ්ගයා හටනුයි; තදාරම්මණං තදාරම්මණ නම්වේ-මේ අර්ථ යොජනායි.

වැදුණුතැන අන්තැනකි රෙදුණුතැන අන්තැනකි යන පිරුළමෙන් පඤ්චාරම්මණය පඤ්චප්‍රසාදයෙහි ගැටුණුවිට හෘදයවස්තු නිඃශ්‍රිත භවඞ්ගසන්තතිය කවර කාරණයකින් සෙලවී සිදීයේද?
ඇත්. පඤ්ච ප්‍රසාදයෝ මහාභූත නිඃශ්‍රිතයහ. මහාභූතයෝ ඔවු

නොවුන්නා සම්බන්ධනහ. හෘදය වස්තුරූපය මහාභූත නිඃශ්‍රිතය භවඞ්ගචිත්තසන්තතිය හෘදයවස්තු රූප නිඃශ්‍රිතය. මෙසේ එකාබද්ධ සම්බන්ධයැති හෙයින් සෙලවී සිදියයි. ඊට නිදසුණක් නම්,

දෙමුහුණු බෙරයක එක මුහුණකට ගැසූවිට අනික් මුහුණේ අලවා තබතලද සකුරුකැටයෙහි වසා සිටින මැස්සා හෙරිවම්ය කම්පාවීමෙන් පියාසරකර යන්නාක්මෙනි.

එහෙයින් කීහ :-

ඝට්ටිතෙ අඤ්ඤවත්ථුම්හි අඤ්ඤනිස්සිත කම්පනං
එකාබද්ධෙන හොතීති සක්ඛරොප මාය ව දෙ. යී.

අඤ්ඤවත්ථුම්හි, අන්‍යපක්ෂව ප්‍රසාද වස්තුයෙක්හි; ඝට්ටිතෙ, පඤ්චාලම්බනය ගැටුණු කල්හි, අඤ්ඤනිස්සිත කම්පනං, අන්‍ය හෘදය වස්තු රූප නිඃශ්‍රිත භවාඞ්ගසන්තතිහුගේ කම්පනය; එකාබද්ධෙන, එකාබද්ධ සම්බන්ධයෙන්; හොති, වේ. ඉති (එතං) මේ අර්ථය, සක්ඛරොපමාය, සකුරුකැට උපමායෙන් ; වදෙ, කියන්නේය. මේ ගාථාර්ථයි.

(9) දෙපස් විඥුතයෝ දස (10) දෙන වනාහි තමන්ගේ උත්පාද ක්ෂණයෙහි විද්‍යමානව පවත්නා එකුන්පනසක් (49) ප්‍රසාදරූපයන් අතුරෙන් අතීත භවඞ්ග චිත්තයාගේ උත්පාද ක්ෂණය හා සමඟ උපන් ප්‍රසාද රූපයමුත් සෙසු අටසාලිසක් (48) ප්‍රසාදරූපයන් නිඃශ්‍රයකර නොගනිත්. ඒ එසේමය.

අතීත භවඞ්ග චිත්තයට පූර්වයෙහි තෙළෙස් (13) වන භවඞ්ග චිත්තයාගේ භඞ්ග ක්ෂණයෙහි පටන් ප්‍රථම භවඞ්ගයාගේ භඞ්ග ක්ෂණයදක්වාමේ අතර සත්තිස් (37) චිත්ත ක්ෂණයක් හා සමඟ උපන් සත්තිසක් (37) ප්‍රසාදරූපයෝ චිතීය තදාරම්මණයාගේ භඞ්ග ක්ෂණය දක්වා ධරා නොසිටින හෙයින් මේ වීථියේ අරමුණට වඩා මඳවූආයුඇත්තෝය. එහෙයින් "මන්දං ආයුකෙ සන්තිමන්දායුකා" යන වචනාර්ථය පරිද්දෙන් මන්දායුෂකයෝනම් වෙත්. අතීතභවඞ්ගචිත්තයාගේ ස්ථිති ක්ෂණයෙහි පටන් පඤ්චවරාවර්ජන චිත්තයාගේ භඞ්ග ක්ෂණය දක්වා මේඅතර චිත්තක්ෂණ එකොළොසක් (11) හා සමඟ උපදනාවූ ප්‍රසාදරූපයෝ එකොළොස් (11) දෙන වනාහි චිතීය තදාරම්මණයාගේ භඞ්ගක්ෂණය ඉක්මයන හෙයින් මේවීථියේ අරමුණට වඩාවැඩිආයු ඇත්තෝය. එහෙයින් "අමන්දං ආයුකෙ සන්ති අමන්දායුකා" යන වචනාර්ථය පරිද්දෙන් අමන්දා

යුෂ්කයෝ නම් වෙත්. මෙසේ කියනලද කරුණු හෙයින් දෙපස් විඥානයෝ දසදෙන (10) මේ අට සාළිස් (48) ප්‍රසාදරූපයන් නිඃශ්‍රයකර නොගනිත්. අතීත භවඞ්ගයාගේ උත්පාද ක්‍ෂණයහා සමඟ උපන් ප්‍රසාද රූපය වනාහි මේ වීථියේ අරමුණ හා සම ආයු ඇති හෙයින් "මජ්ඣිමං ආයු යස්සාති මජ්ඣිමායුකං' යන වචනාර්ථය පරිද්දෙන් මධ්‍යමායුෂ්කනම් වේ. දෙපස් විඥානයෝ දසදෙන (10) මේ මධ්‍යමායුෂ්ක ප්‍රසාදරූපයම නිඃශ්‍රයකර ගනිත්. එහෙයින් මණිසාර මඤ්ජූසායෙහි :–

සත්තතිංස මන්දායුකා එකංව මජ්ඣිමං මතං,
අමන්දකා දසා චෙති විඤ්ඤා තබ්බා විභාවිතා.

යි කීහ. මේ නය මරණාසන්න වීථියෙහිදී නොලැබෙන හෙයින් බහුල වශයෙන් කියනලද්දකැයි දතයුතු.

සංක්‍ෂෙප වණ්ණනා ටීකාචාර්‍ය්‍ය මතයෙන්ද මෙහි විභාග දක්වනුලැබේ. අතීත භවඞ්ග චිත්තයෙන් පූර්වයෙහි පස් (5) වන චිත්තයාගේ භඞ්ග ක්‍ෂණය හා සමඟ උපන් ප්‍රසාදරූපය පඤ්චවිඥානයාගේ උත්පත්ති කාලයෙහි චිත්තක්‍ෂණ සවිස්සක් (26) ඉකුත්කිරීමෙන් ආයු වෙමධ්‍යගතව මධ්‍යමායුෂ්ක වේ. එසින් පූර්වයෙහි තෙවිසි (23) චිත්තක්‍ෂණය හා සමඟ උපන් ප්‍රසාදරූපයෝ තෙවිසි (23) දෙනද පශ්චිම කාලයෙහි පස්විසි (25) චිත්ත ක්‍ෂණය හාසමඟ උපදින ප්‍රසාදරූපයෝ පස්විසිදෙන (25)ද පිළිවෙළින් මඳවූ අමඳවූ ආයුඇති හෙයින් මන්දායුෂ්ක අමන්දායුෂ්කයෝනම් වෙති එසින් පස්විසි (25) අමන්දායුෂ්ක ප්‍රසාදරූපයන් අතුරෙන් අතීත භවඞ්ග චිත්තයාගේ උත්පාද ක්‍ෂණය හා සමඟ උපන් මධ්‍ය ප්‍රසාදරූපය පමණක් පඤ්චාරම්මණය හා සමඟ ඉපදීමෙන් භවඞ්ග චලනයෙහිදී පඤ්චාරම්මණය හා සඞ්ඝට්ටනයවීමෙන් ඒ පඤ්චාරම්මණය හා සමඟම නිරුද්ධවන හෙයින් පඤ්ච විඥානයන්ගේ නිඃශ්‍රය වේ. සෙසු අට සාළිස්(48) ප්‍රසාදයෝ පඤ්ච විඥානයන්ගේ නිඃශ්‍රය නොවෙත්. මේ සංක්‍ෂෙප වණ්ණනා ටීකාචාර්‍ය්‍යයන් විසින් චුතිප්‍රතිසන්ධි චිත්තයන් සඳහා මෙසේ වෙනස්කර කියනලද්දේයයි හැඟේ.

තෙවීසති මන්දායුකා එකංව මජ්ඣිමං මතං
අමන්දා පඤ්චවීසාති අමන්දෙ මජ්ඣනිස්සිතං

යනු සඞ්ග්‍රහ ගාථායි :–

අර්ථ:–මන්දායුකා, මන්දායුක ප්‍රසාද රූපයෝ; තෙවීසති, තෙවිසිදෙනෙකැයි; මතා, දන්නාලදහ; මජ්ඣිමං, මධ්‍යමායුෂ්ක ප්‍රසා

දරූප ; එකංච, එකක්මයසි ; මතං, දන්තාලදි ; අමන්ද, අමන්දායුෂ්කා ප්‍රසාද රූපයෝ; පඤ්චවීස, පස්විසිදෙනෙකැයි; මතං, දන්තාලදහ ; ඉති (ඉමෙසු තීසුවත්ථු රූපෙසු), මේ ත්‍රිප්‍රභෙද වස්තු රූපයන් අතුරෙන් ; අමන්දෙ, පස්විසි අමන්දායුක වස්තුරූපයෙහි, මජ්ඣ නිස්සිතං, (පඤ්ච විඥානය) මධ්‍ය වස්තුරූපයම් නිඃශ්‍රය කරගනී.

මේ නය අති මහන්තාරම්මණ වීථියෙහි ප්‍රසාදරූපයන් සඳහා කියනලද්දේයයි දතයුතු. මහන්තාරම්මණ පරිත්තාරම්මණ වීථීන්හි වනාහි මණිසාර මඤ්ජුසාගත නයින් මන්දායුෂ්කා ප්‍රසාදරූප තුන තුන බැගින් අඩුවනබවද අමන්දායුෂ්කා ප්‍රසාදරූප තුන තුන බැගින් වැඩිවනබවද පෙනේ. එහෙයින් පරිත්තාරම්මණවීථි සදෙන (6) අතුරෙන් අන්තිම වීථියෙහි මන්දායුෂ්කා ප්‍රසාදරූප තෙළෙසක් (13)ද අමන්දායුෂ්කා ප්‍රසාදරූප පන්තිසක් (35) ද ලැබේ. සංක්ෂෙප වර්ණනා ටීකාගත නයින් නිඃශ්‍රය වස්තු රූප සඞ්ක්‍රමණය මුත් අන්වෙනසක් නොමැත්තේය. අති පරිත්තාරම්මණ ෂට් (6) වීථියෙහි වූකලී නිඃශ්‍රිත විඥානය පවා නොලැබෙන හෙයින් ප්‍රසාද වස්තුරූප විචාරණයක් නොලැබේ.

මේ මන්දා මන්ද මධ්‍යමායුෂ්කා ප්‍රසාදරූප විචාරණයයි.

**මෙතෙකින් පඤ්චං ඕතික සව්‍යාකෘතකාම වීථි ප්‍රස්තාර නිමි.**

**(10)** අර්පිතා වීථිද. ධ්‍යාන මාර්ග ඵලසමාපත්ති අභිඥා නිරොධ සමාපත්ති වීථීන්ගේ වශයෙන් පස් (5) වැදෑරුම්. එයින් ධ්‍යාන වීථිද ආදි කම්ම සමාපජ්ජන වශයෙන් දෙවදෑරුම්. එයින් ආදි කම්මික වීථි ප්‍රස්තාරයෙහි–භවඞ්ග චලනය–භවඞ්ගු පච්ඡේදය–මනොද්වාරාවර්ජනය–මන්ද ප්‍රාඥ දන්ධාභිඥයාහට–පරිකර්මය–උපචාරය–අනුලොමය– ගොත්‍රභූයයි උපචාර සමාධි ජවන සතර (4) වරක්ද තීක්ෂප්‍රාඥ ක්ෂිප්‍රාභිඥයාහට උපචාරය–අනුලොමය ගොත්‍රභූයයි උපචාර සමාධි ජවන තුන් (3) වරක්ද අර්පිතා සමාධි ධ්‍යාන ජවනය වරක් (1) ද වීමෙන් භවඞ්ග පතනය වේ.

සමාපජ්ජන වීථි ප්‍රස්තාරයෙහි ලබනලද ධ්‍යානය සමාපජ්ජන අධිෂ්ඨාන ව්‍යුත්ථාන යන ත්‍රිවිධ වසී භාවයෙන් සමවැදීම ඉටීම නැගිටීම අභිමත වූකල්හි කියනලද නයින්ම චිත්ත ප්‍රවෘත්තිය වේ. ධ්‍යාන ජවනයන්ගේ බහුල ප්‍රවෘත්තියම වෙනසි. ප්‍රත්‍යවෙක්ෂා වීථි ප්‍රස්තාරයෙහි ලබනලද සම වදිනලද ධ්‍යානගත විතර්කාදී ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා වසීභාව ප්‍රත්‍යවෙක්ෂාවසී භාවයෙන්

ආවර්ජනය සහ ප්‍රත්‍යවෙක්ෂාව අභිමත වූකල්හි භවඞ්ග චලනය භවඞ්ගු පච්ඡේදය මනොද්වාරාවර්ජන ප්‍රත්‍යවෙක්ෂා ජවන පස් (5) වරක්දැවීමෙන් ඊට අනතුරුව භවඞ්ග පතනයවේ

රූපධ්‍යාන පස(5) අරූපධ්‍යාන සතර (4) යන ධ්‍යානනවය (9) කුශල ක්‍රියාදෙකින් වැඩූකල්හි අටළොස් (18) වීථියක්වේ. ඒ අට ළොස් (18) වීථියආදි කම්ම සමාපජ්ජන දෙකින් වැඩූකල්හි සතිස් (36) වීථියක්වේ. ඒ සතිස් වීථිය තීක්ෂ ප්‍රාඥමන්ද ප්‍රාඥ යන දෙදෙනාගෙන් වැඩූකල්හි ධ්‍යාන වීථි දෙසැත්තෑව (72)කි. මෙහි ප්‍රථම ධ්‍යාන වීථිඅටය (8) – පෙ – චතුර්ථ ධ්‍යාන වීථි අට (8)ය. පඤ්චමධ්‍යාන වීථි සතළිස (40)ය.

ප්‍රත්‍යවෙක්ෂා වීථි වූකලී ධ්‍යානාඞ්ගයකට එක (1) බැගින් ලැබෙන හෙයින් අටවැදැරුම් ප්‍රථම ධ්‍යාන වීථි කෙරෙන් සතළිස (40) ය එසේම ද්විතීය ධ්‍යාන වීථි කෙරෙන් දෙතිස (32) ය තෘතීය ධ්‍යාන වීථි කෙරෙන් සූවිස්සය (24) චතුර්ථ ධ්‍යානවීථි කෙරෙන් සොළසය (16) සමසාළිස්(40) වැදෑරුම් පඤ්චම ධ්‍යාන වීථි කෙරෙන් අසූවය (80) මෙසේ ප්‍රත්‍යවෙක්ෂා වීථි එකසිය අනූ දෙදෙන (192) කි.

(ඣාන නවකෙ යථාක්කමං කුසලකිරිය ආවජ්ජන සමාපජ්ජන තික්ඛමන්ද භෙදෙන ගුණිතෙ වෙ සත්තති ඣාන වීථියො. පච්ච වෙක්ඛණාපන එකෙ කස්මිං ඣානඞ්ගෙ එකෙකං කත්වා චින වූතෙක සතං හොන්ති.)

මෙකී වීථීන් අතුරෙන් රූප ධ්‍යාන වීථීන්ගේ චිත්ත සවරූපාදිය මතු දක්වන නයින් දතයුතු.

(පඨම ඣානස්ස ආදි කමෙම මනොද්වාරාවජ්ජන කාමති හෙතුක සොමනස්ස පඨමඣාන ජවන වසෙන සත්ත චිත්තානි ආරම්මණතො පුබ්බා පරභවඞ්ගානි පුබ්බෙ වුත්තනයං තෙව. සෙ ස වීථි චිත්තානි උපෙක්ඛා වජ්ජිත පඤ්ච වීසති පඤ්ඤත්තා රම්මණානි තිස්සයතො අනන්තරාතීත හදය වත්ථුකානි. භූමි තො කාම සුගතිය මෙව. පුග්ගලතො පුථුජ්ජන තිහෙතුක ඵලඨ පඤ්චකෙ. භවඞ්ගපප වෙසොපන භූමි පුග්ගලෙ සල්ල කෙඛ ත්වාකා තබ්බා.)

උපෙක්ඛා වජ්ජිතයයි කී තන්හි අර්ථ යථානූපචාර ඵලූපචාරව ශයෙන් දතයුතු.

(එවමුපරූපරි ඣානෙසුපි යථා ලාභ භවඞ්ග භූමියො පක්ඛිපිත්වා පත්ථාරෙතබ්බා. ආරම්මණ තොපි වීථි චිත්තා

ති ආරම්මණ සඞ්ග හෙ වුත්ත කසිණා සුභ කාය කොට්ඨාස ආනාපාන බ්‍රහ්ම විහාරානං වසෙන ඡබ්බීසති පඤ්ඤත්තාරම්මණානි. සමාපජ්ජනෙපි සබ්බ රූප භවඞ්ගානං සබ්බ භූමිනඤ්ච ප වෙසොව විසෙසො. සෙසං පුරිමසදිස මෙව.)

සමහර ආචාර්‍ය්‍යයෝ කෙනෙක් මේ සමාපජ්ජන වීථියෙහිද භූමි සහ භවාඞ්ග ක්‍රමයෙන් වැඩිකරමින් ප්‍රස්තාරකරති. එය යුක්ති රහිතය. රාශි සමොධානයටද නොගැලපේ.

රූප ධ්‍යාන වීථින්හි චිත්ත සඞ්ඛ්‍යාදිය කියානිමි.

අරූප ධ්‍යාන වීථින්හි එය සුගම් හෙයින් නොකියා හැරියෙමු.

චතුධා සුඛ පුඤ්ඤම්හා—පඤ්චධා පෙක්ඛ කා පරං,
සුඛ ක්‍රීයතො චතුධා—පඤ්චු පෙක්ඛාමහග්ගතෙ.

යන ගය අවබොධ වේවා.

(පච්ච වෙක්ඛණෙ මනොවාර වජ්ජන සොභන කාම ජවන වසෙන සත්තරස චිත්තානි-පුබ්බා පර භවඞ්ගානි පුබ්බෙ වුත්තනයා නෙව. සෙසානි ඣානඞ්ගාරම්මණානි. සෙසං සමපජ්ජනෙ වුත්තනය සදිසං.)

පරිකම් උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත්ත වශයෙන් නිමිත්ත ත්‍රිවිධයි. පරිකම් භාවනා උපචාර භාවනා අර්පනාභාවනා වශයෙන් භාවනාවද ත්‍රිවිධයි. සමාධියද එමෙනි. මෙහි පරිකම් උද්ග්‍රහ නිමිත්තවයෙහි පරිකම් භාවනාව පමණක්ද ප්‍රතිභාග නිමිත්තෙහි උපචාර අර්පනා වශයෙන් භාවනාවයක්ද ලැබෙන බව සැලකිය යුතු.

මෙතෙකින් දෙසැත්තෑ (72) ධ්‍යාන වීථි ප්‍රස්තාර නිමි.

මාර්ග වීථිද සොතාපත්ති මග්ග වීථි. සකදාගාමි මග්ග වීථි. අනාගාමි මග්ග වීථි අරහත්ත මග්ග වීථි වශයෙන් සිවු (4) වැදෑරුම්. එයින් සොතාපත්ති මග්ග වීථිද. ප්‍රථම ධ්‍යාන සොතාපත්ති මග්ග වීථි. ද්විතීය ධ්‍යාන සොතාපත්ති මග්ග වීථි. තෘතීය ධ්‍යාන සොතාපත්තිමග්ග වීථි. චතුර්ථ ධ්‍යාන සොතාපත්තිමග්ග වීථි. පඤ්චම ධ්‍යාන සොතාපත්ති මග්ග වීථින්ගේ වශයෙන් පස් (5) වැදෑරුම්. එයින් ප්‍රථම ධ්‍යාන සොතාපත්ති මාර්ග වීථියෙහි ධ්‍යාන වීථියෙහි කීපරිද්දෙන් චිත්තපතනයව් ගොත්‍රභූ චිත්තයට අනතුරුව මාර්ගජවනය (1) වරක් මන්ද ප්‍රාඥ දන්ධාභිඥයාහට ඵල ජවනය දෙ (2) වරක් තීක්ෂ ප්‍රාඥ ක්ෂිප්‍රාභිඥයාහට ඵල ජවනය තුන් (3) වරක්ද වීමෙන් ඊට අනතුරුව සුළුසු පරිද්දෙන්

භවඞ්ගපතනයවේ. මෙහි මාර්ගචිත්තය එකචිත්තක්ෂණික හෙයින් සමාපජ්ජන වීථි නොලැබෙන බව සැලකිය යුතු.

ප්‍රත්‍යවෙක්ෂා වීථින්හි ලබනලද මාර්ගඵල නිර්වාණ ප්‍රහීනකෙලශ අප්‍රහීනකෙලශ යන මේ පඤ්චවිධ(5) ධර්මයන් මෙනෙහිකරනු කැමැත්ත ඇතිවූ කල්හි ධ්‍යාන වීථියට අනතුරුව උපදින ප්‍රත්‍යවෙක්ෂා වීථියෙහි මෙන් චිත්ත ප්‍රවෘත්තිය වේ. මෙහි ශීඝ්‍ර ප්‍රවෘත්තිය අනභිමත හෙයින් ප්‍රත්‍යවෙක්ෂා ජවනය සත්වර (7) ක් ඉපදී මම වෙනසී මාර්ගඵලාදී ධර්ම පඤ්චකය වෙන වෙනම මෙනෙහි කලයුතු හෙයින් ප්‍රත්‍යවෙක්ෂා වීථි පස (5) ක් ලැබේ. විතර්කාදී ධ්‍යාන සම්ප්‍රයුක්ත සෝතාපත්තිමාර්ග වීථිද මේ නයින් දතයුතු. උපරිමාර්ග වීථින්හිද ගොත්‍රභූ ස්ථානයෙහි වොදාන පතනයම වෙනසී. ප්‍රත්‍යවෙක්ෂා වීථිද කියනලද නය ඇත්තේමය. අර්හත්මාර්ග වීථියට අනතුරුව අප්‍රහීන කෙලශ නොමැති හෙයින් මාර්ග ඵල නිර්වාණ ප්‍රහීනකෙලශ යන කොඨාස චතුශ්ක (4)යෙහි ප්‍රත්‍යවෙක්ෂා වීථි සතර (4) ක් ලැබේ.

සෝතාපත්ති මාර්ග වීථි පඤ්චක (5) ය තීක්ෂ්ණ ප්‍රාඥ මන්දප්‍රාඥ දෙදෙනාගෙන් වැඩිකලවිට වීථි දසය(10)ක. ඒ දසය පාදක ධ්‍යානසමසිත ධ්‍යාන පුද්ගල ධ්‍යාස යන තුනෙන් වැඩිකලවිට වීථි සම තිසෙ (30)ක. මෙසේ 'ගොත්‍රභූ' චිත්තය වන ගොත්‍රභූවාර සම සති (30)ද සකෘදාගාමිආදී මාර්ගත්‍රයද මේ නයින් වැඩිකලවිට 'වොදාන චිත්තය වන වොදානවාර අනූව (90)ක්ද විමෙන් මාර්ග වීථිම එකසිය විස්සක්(120)වේ. ප්‍රත්‍යවෙක්ෂා වීථි වනාහි සංක්ෂෙප නයින් එකුන් විස්සක් (19)ද විස්තාර වශයෙන් සෝතාපත්ති ආදී මාර්ග තුනට අනතුරුව එකසිය පනස(150) එකසිය පනස (150) බැගින්ද අර්හත් මාර්ගයට අනතුරුව එකසිය විස්ස (120) ක්ද ලැබෙන හෙයින් ඒ සියල්ලම පිඩුකලවිට ප්‍රත්‍යවෙක්ෂා වීථි පන්සිය සමසැත්තෑව (570)ක්වේ.

(චතු මග්ගෙ ඣාන තික්ඛ මන්දපාදක සමසිත පුග්ගල ජ්ඣාසය භෙදෙන ගුණිතෙ මග්ග වීථියො වීසාධික සතං හොන්ති පච්ච වෙක්ඛණා පන සඞ්ඛෙපතො එකූන වීසති, විත්ථා රාපනසත්තත්‍යාධික පඤ්ච සතං හොන්ති.)

ලෞකික ධ්‍යාන නොලත් ශුෂ්ක විදර්ශක ආර්යයන්ටද, ලබන ලද ලෞකික ධ්‍යාන ඇතිවද එය පාදක සමසිතව වශයෙන් පුරුදු නොකලාවූ ධ්‍යානලාභී ආර්යයන්ටද සඞ්ඛාරුපෙක්ඛා අනුලොමඤාණයයි කියනලද වුට්ඨානගාමිනී විදර්ශනා නියම

යාගේ වශයෙන් ප්‍රථම ධ්‍යාන සම්ප්‍රයුක්ත මාර්ග ඵල පමණක් ලැබේ. පාදක ධ්‍යාන සමසිත ධ්‍යාන ඇතත් පුද්ගල ධ්‍යාසයක් නැත්නම් ඔවුන්ට මතු ධ්‍යාන හා සදෘශවූ මාර්ගඵලම ලැබෙන බව දතයුතු. මේ මාර්ග වීථීන්හි චිත්ත ස්වරූපාදිය වක්ෂ්‍යමාණ නයින් දතයුතු.

(පඨම ඣාන සොතාපත්ති මග්ග වීථියං පඤ්ච චිත්තානි මනොද්වාරාවජ්ජන තිහෙතුක කාම කුසල ජවන සකමග්ග ඵල වසෙන. ආරම්මණතො පුබ්බාපර භවඞ්ගානි පුබ්බෙ වුත්තනයා නෙව. සෙසානි යාවානු ලොමා තෙභූමික සඞ්ඛාරාරම්මණානි. ගොත්‍රභූ වොදාන මග්ග ඵල චිත්තානි නිබ්බානාරම්මණානි. නිස්සයතො අනන්තරාතීත හදයවත්ථුකානි. භූමිතො කාමාවචරෙ රූපාවචරෙච. පුග්ගලතො තිහෙතුක පුථුජ්ජනෙසක මග්ග ඵලට්ඨෙච.)

මෙහි නවවිධ ත්‍රිහෙතුක පඤ්චවොකාර භවඞ්ගයන්ම පූර්වාපර භවඞ්ග වන බව සැලක්යයුතු. මනොද්වාරාවර්ජන පරිකර්ම උපචාර අනුලොම යන මොවුහු ත්‍රෛභූමික සංස්කාරද ගොත්‍රභූ වොදාන මාර්ග ඵල ජවන්යෝ නිර්වාණයද අරමුණුකරත්. මේ ආදී වශයෙන් අදහස් තෙරුම් ගතයුතු.

ප්‍රීතියාදි ධ්‍යාන සම්ප්‍රයුක්ත සොතාපත්ති මාර්ග වීථීන්හිද මේ නයින් විභාග දතයුතු. චතුවොකාර භූමියෙහිද ලැබෙන හෙයින් උපරිමාර්ග වීථීන්හි ත්‍රිහෙතුක භවාඞ්ග තෙළස (13) පමණක් ප්‍රස්තාර කටයුතු. මාර්ගඵල නිර්වාණ ප්‍රත්‍යවෙක්ෂායෙහිදී ප්‍රත්‍යවෙක්ෂා වීථීන්හිද ඥාන සම්ප්‍රයුක්ත කාම ජවනම ප්‍රස්තාර කටයුතු.

මනොද්වාරාවර්ජිත ප්‍රත්‍යවෙක්ෂා ජවනයන් විසින්

මග්ගං ඵලඤ්ච නිබ්බානං—පච්චවෙක්ඛති පණ්ඩිතො,
හීනෙ කිලෙසෙ සෙසෙච—පච්චවෙක්ඛති වා නවා.

යනුවෙන් දක්වනලද ධර්ම පඤ්චකය අරමුණු කරනුලැබේ. මේ ප්‍රත්‍යවෙක්ෂා වීථී ඵලස්ථයන්ට මුත් සෙසු පුද්ගලයන්ට නොලැබේ. මෙපමණක්ම වෙනසී.

**මේ එකසිය විසි (120) වැදෑරම් මාර්ග වීථි ප්‍රස්තාර නයයි.**

ඵල සමාපත්ති වීථී ප්‍රස්තාරයෙහි භවඞ්ගචලනය භවඞ්ගුපච්ඡේදය මනොද්වාරාවර්ජනය මන්දප්‍රාඥයාහට අනුලොම ජවන

සතර වරක් (4) හා තීක්ෂ ප්‍රාඥයාහට තෙ වරක් (3) ද තදනන්තරව අභිමතවූ පරිදි ඵල ජවනද වීමෙන් භවඞ්ග පතනයවේ.

මෙහි මනොද්වාරාවජ්ජනය හා අනුලොම ජවනයන් නිර්‍වාණ යද ත්‍රෛභූමික සංස්කාරද අරමුණුකරන බව දතයුතු. ඵලසථ පුද්ගලයන්ටම සවකීය සවකීය ඵලසමාපත්ති වීථි ඇතිවේ. මාර්‍ගී වීථියෙහි කීපරිද්දෙන් අවශෙෂ විභාගද දතයුතු.

**මේ එකසියවිසි (120) වැදෑරුම් ඵලසමාපත්ති වීථි ප්‍රස්තාරානයයි.**

මාර්‍ගී ඵල වීථි දෙකොටස පිඩුකලවිට :-

අඨ වීස සුඛාපුඤ්ඤා-සත්තධා පෙක්ඛකා පරං,
සුඛක්‍රියාතො චතුධා-එකො පෙක්ඛා අනුත්තරෙ.

යනුවෙන් කියනලද අර්පිතා ජවනසඞ්ඛ්‍යාවලැබේ. යට කියනලද මහද්ගත ජවනද එකතුකලවිට "චත්තිංස සුඛ පුඤ්ඤම්හා" යනාදි ගාථාගත පරිද්දෙන් අර්පිතා ජවන සඞ්ඛ්‍යාව ලැබෙන බව සැලකියයුතු.

තෙවීසති ගොත්‍රභූම්හා-වොදානා පණ්ණරසාසියුං,
නුලොමා වීස විත්ථාරා-අඨ පණ්ණාස අප්පනා.

යනුවෙන් ගොත්‍රභූ වොදාන අනුලොම යන තුන් කොටසේ ජවනයන්ට අනතුරුව උපදින සවිසි (26) අර්පිතා ජවනයන්ගේ විස්තාර විභාග දතයුතු.

(සබ්බ වීථියො පන. ද්‍වෙ සත නාලීස ලොක උත්තරා. තිසත චාදස පිණ්ඩිත අප්පනා. චතුස්සත තිළුන මිස්සිත සබ්බකා)

මත්තෙහි දක්වනු ලබන්නාවූ අභිඥා වීථි නිරොධ සමාපත් නිර්වාණද වුක්තප්‍රකාර මහද්ගත ලොකොත්තර වීථීන්හි ඇතුලත් වනබව සැලකියයුතු. හුදෙක් ප්‍රස්තාර වශයෙන් විශෙෂ සහිත හෙයින්ම වෙනම ප්‍රස්තාරකොට දක්වීමු. ඒ විප්‍රකාර වීථීන් අතුරෙන්. අභිඥා වීථි නොමෝ දිබ්බචක්ඛු අභිඥා. දිබ්බසොත අභිඥා. ඉද්ධිවිධ අභිඥා. පරචිත්ත විජානන අභිඥා. පුබ්බෙනිවාසානුස්සති අභිඥා. යථා කම්මූපග අභිඥා. අනාගතංස අභිඥා. වීථීන්ගේ වශයෙන් සත් (7) වැදෑරුම්. එයින් දිබ්බචක්ඛු අභිඥා වීථි ප්‍රස්තාරය කෙසේද ? යත්. බහුල වශයෙන් අෂ්ට සමාපත්ති ලාභී පුද්ගලයන් විසින් දූරපටිච්ඡන්න සණ්හ සුඛුම රූප දකිනු

කැමැත්ත ඇතිවූ කල්හි තෙජෝ කසිණය, අවදාත කසිණය, ආලෝක කසිණය යන කසිණතුන (3) අතුරෙන් එක්තරා කසිණයෙක්හි රූපාවචර පඤ්චම ධ්‍යානයට සමවදිනු ලැබේ. (මේ පරිකර්මයට ආධාරවූ පාදක ධ්‍යාන වීථියි.) ඊට අනතුරුව තොදැක් කාලද අනාගත රූපයන් අරමුණුකොටගෙන "එතස්ස රූපං පස්සාමි එතං රූපං පස්සාමි" යනුවෙන් අධිෂ්ඨාන වශයෙන් කාමාවචර මනොද්වාරවීථි ඇතිවේ. (මේ පරිකර්ම වීථියි) ඊට අනතුරුව යටකී නයින්ම තෙජෝදාතාලෝක කසිණතුන (3) අතුරෙන් එක්තරා කසිණයෙක්හි රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදිනු ලැබේ. (මේ අභිඥාපාදක ධ්‍යාන වීථියි) ඊට අනතුරුව අධිෂ්ඨිත ප්‍රත්‍යුත්පන්න රූපයන් අරමුණුකොටගෙන අතිශය සුපරිශුද්ධ විශෙෂ දර්ශන ඇති ධ්‍යාන ජවනයෙන් යුක්ත රූප පඤ්චම ධ්‍යාන අභිඥා වීථිය ඇතිවේ. මෙසේ වීථි සතරක් (4) ප්‍රස්තාර කටයුතු. අතිරික්ත ෂට්විධ (6) අභිඥා වීථීන්හිද මේ නයින්ම ප්‍රස්තාරනය දතයුතු.

දසවිධ (10) කසිණ අතුරෙන් කැමැති කසිණයක් ඍද්ධිවිධ අභිඥාවට පාදකවූ විවිධ ධ්‍යාන වීථීන්ගේ ආරම්මණ භාවයෙන් ගතයුතු. සමහර ආචාර්‍ය්‍ය කෙනෙක් පෘථිවි කසිණය ඍද්ධිවිධ අභිඥා වීථිහුගේ අරමුණු වශයෙන්ද ආලෝක කසිණය ඉතිරි සවැදෑරුම් (6) අභිඥා වීථීන්ගේ අරමුණු වශයෙන්ද ගතයුතු බව කියති. එය සාධක රහිත කීමක් බැවින්ද යුක්ති රහිත හෙයින්ද උපලක්ෂණ නිදර්ශන න්‍යායෙන් කියනලද්දක්යයි සැලකියයුතු. මේ අභිඥා වීථීන්ගේ විස්තාරනය මතු තුදුස් (14) වන සමථාධිකාරයෙහි දක්වනු ලැබේ.

දිබ්බසොත අභිඥාවට "එතස්ස සද්දං සුණොමි එතං සද්දං සුණොමි" කියාද ඍද්ධිවිධ අභිඥාවට "සතං හොමි සහස්සං හොමි" කියාද පරචිත්ත විජානන අභිඥාවට "එතස්ස චිත්තං ජානාමි" කියාද පුබ්බේ නිවාසානුස්සති අභිඥාවට "පුබ්බෙනිවුත්ථං ඛන්ධං ජානාමි" කියාද යථා කම්මූපග අභිඥාවට "අතීතං කම්මං ජානාමි" කියාද අනාගතංස අභිඥාවට "අනාගතං ඛන්ධං ජානාමි" කියාද මේආදි වශයෙන් අධිෂ්ඨානනය දතයුතු. දිව්‍ය ශ්‍රොත්‍ර අභිඥායෙන් ප්‍රත්‍යුත්පන්න ශබ්දාරමුණුද ඍද්ධිවිධ අභිඥායෙන් පාදක ධ්‍යාන සමඟ නිර්මිත රූපද පරචිත්ත විජානන අභිඥායෙන් අතීතයෙන් සත්දිනයක් අනාගතයෙන් සත් දිනයක් යන තුදුස් (14) දිනය තුළ මෙරමාහට ඇතිවන

චිත්ත චෛතසික ධර්මද පූර්වේනිවාසානුස්මෘති අභිඥයෙන් අතීතානන්තර ච්‍යුතියෙහි පටන් අතීත භවයන්හි අජ්ඣාවුත්ථ නිවාස ගොචර නිවාස භාවයෙන් සෙවිතාලද තමන්ගේ ස්කන්ධ අනුන්ගේ ස්කන්ධ තත්සම්බන්ධ නාම ගොත්‍රාදි ප්‍රඥප්ති නිර්වාණ යන ෂඩාලම්බනද යථාකම්මූපග අභිඥයෙන් අතීත කුශලාකුශල කර්ම චේතනොත්පාදද අනාගතාංස අභිඥයෙන් අනාගත ස්කන්ධ තත්සම්බන්ධ නාම ගොත්‍රාදි ප්‍රඥප්ති නිර්වාණ යන ෂඩාලම්බනද අරමුණු කරනුලැබේ.

මේ සප්තවිධ අභිඥ විථිය කුශල ක්‍රියා දෙකෙන් වැඩිකළ විට තුදුසක් (14) වේ. ඒ තුදුස (14) තීක්ෂ ප්‍රාඥ මන්දප්‍රාඥ දෙන්නාගෙන් වැඩිකළවිට අටවිසි (28) විථියක්වේ. චිත්ත සව රූපාදිය සුගමයි. 'පඤ්ච අභිඥ' යයි කීතන්හි දිව්‍යං චක්ෂුරභිඥානයට කියනලද පරිකර්ම යථාකම්මූපග අනාගතාංස අභිඥාවයටත් පරිකර් වන හෙයින් ඒ අභිඥාවය දිව්‍යං චක්ෂුරභිඥානයෙහි සඞ්ග්‍රහ වනබව සැලකියයුතු.

එහෙයින් "නාමරූප පරිච්ඡේද" යෙහි

අනාගතංස ඤාණඤ්ච-යථා කම්මූපගං තථා,
තනන්තිස්සි තත්තා ගච්ඡන්ති-දිබ්බ චක්ඛුම්හි සඞ්ගහං.

යි කීහ—ආශ්‍රවක්ෂයකර ඥානය සමග එකතුකළවිට අභිඥ සවැදෑරුම් (6) වේ. එහෙයින් "සූතවණ්ණනා" යෙහි :-

ඉද්ධිවිධං දිබ්බසොතං-පරචිත්ත විජානනං,
පුබ්බෙනිවාසානුස්සති-දිබ්බ චක්ඛාස චක්ඛයො,
ඡළාභිඤ්ඤෙඤ්ඤි සම්පන්නං-වන්දෙ පුරිස කුඤ්ජරං, යි කීහ.

අධිෂ්ඨාන ඍද්ධිය. විකුර්වණ ඍද්ධිය. මනෝමය ඍද්ධිය. ඥානවිස්ඵාර ඍද්ධිය. සමාධි විස්ඵාර ඍද්ධිය. ආර්‍ය්‍ය ඍද්ධිය. කර්මවිපාකජ ඍද්ධිය. පුණ්‍යවතො ඍද්ධිය. විද්‍යාමය ඍද්ධිය. තත්‍ර තත්‍ර සම්‍යග්ප්‍රයොග ඍද්ධිය යන දශ (10) විධ ඍද්ධීන් අතුරෙන් අධිෂ්ඨාන, විකුර්වණ මනෝමය යන ත්‍රිවිධ ඍද්ධිය 'ඍද්ධිවිධ' අභිඥයෙහි සඞ්ග්‍රහවේ.

අධි විකුබ්බ මනොඤාණං-සමාරිය කම්මපාකජං,
පුඤ්ඤං විජ්ජාමයං තත්‍ර-තත්‍රාති ඉද්ධියො දස.

අටවිසි (28) අභිඥා විථි ප්‍රස්තාර නයයි.

### දැන් නිරෝධ සමාපත්ති වීථි ප්‍රස්තාරනය කියනුලැබේ.

අෂ්ට සමාපත්තිලාභී අනාගාමි රහතන්වහන්සේලා විසින් "භාරාහවෙ පඤ්චක්ඛන්ධා. භාරාහාරොච පුග්ගලො" යනාදීන් දක්වනලද ස්කන්ධ භාර ඉසිලීමෙන් කලකිරි "දිෂ්ට ධම්මනිබ්බාණ" සුඛය විඳිනු කැමැත්ත ඇතිවූ කල්හි ප්‍රථම ධ්‍යානයට සමවැදී එයින් නැගිට එහි ඇත්තාවූ සංස්කාර ධර්ම අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් ගෙන විදර්ශන ඥානයෙන් මෙනෙහි කරනුලැබේ.

මේ නයින් ආකිඤ්චඤ්ඤා යතන ධ්‍යානය දක්වා සමවදිමින් මෙනෙහි කරමින් ගොස් ඒ ආකිඤ්චඤ්ඤා යතන ධ්‍යානයෙන් නැගිට 'නානාබද්ධ අවිකොපන' 'සංඝපතිමානන' සත්ථුපක්කොසන' 'අද්ධානපරිච්ඡෙද, යන චතුර්විධ පූර්වකෘත්‍යය අධිෂ්ඨාන කරනුලැබේ. එවිට ඒ යොගී පුද්ගලයාහට කාම මනොද්වාර වීථි ඇතිවේ. (රූපාවචර භූමියෙහි වේ සිවු (4) කිස ඉටීමක් නැත්තේය.) ඒට අනතුරුව නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන ධ්‍යානයට සමවදිනුලැබේ. ධ්‍යාන ජවන දෙවරක් (2) ඉපද නිරුද්ධවූවිට කාමාවචර භූමියෙහිනම් සත්දවසක් මුලුල්ලෙහි රූපාවචර භූමියෙහිනම් කැමැති කාලයක් මුලුල්ලෙහි චිත්ත චෛතසික චිත්තජ රූපයන් නිරුද්ධකොට තිජරූප වීජරූප මාත්‍රයෙන්ම විසීම නිරොධ සමවතට සමවැදීමනම් වේ. එයින් නැගී සිටිවිට අනාගාමි ඵලසථායාහට අනාගාමි ඵල ජවනය අර්හත්ඵලසථායාහට අර්හත්ඵල ජවනය වරක් ඉපද නිරුද්ධවූවායින් පසු භවඞ්ගපතනය වේ.

මේ නිරොධ සමාපත්ති වීථිය කාමාවචර රූපාවචර දෙකින් වැඩිකලවිට වීථි දෙක (2) කි. ඒ දෙක අනාගාමි අර්හත් ඵලසථ දෙන්නාගෙන් වැඩිකලවිට වීථි සතර (4) කි. ඒ සතර තික්ඛපඤ්ඤ මන්දපඤ්ඤ දෙන්නාගෙන් වැඩිකලවිට නිරොධ සමාපත්ති වීථි අටක් (8) වේ. චිත්ත ස්වරූපාදිය සුගම හෙයින් නොදක්වීමු.

### අෂ්ට ප්‍රකාර නිරොධ සමාපත්ති වීථි ප්‍රස්තාර නයයි.

(11) දැන් මේ වීථි සඞ්ග්‍රහයෙහි ස්වරූප විභාග දක්වනුලැබේ. චිපඤ්ච විඥානයෝ දසදෙන (10) මනොධාතු ත්‍රිකය (3). මාර්ග චිත්තයෝ සතර දෙන (4) යන මොව්හු සතළොස් දෙන (17) එක්වරක් (1) උපදින චිත්තයෝයි. සුඛසන්තීරණය එක්වරක් (1) ද දෙවරක් (2) ද උපදින චිත්තයයි. නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන

කුසලක්‍රියා වජ්ජිත මහද්ගත චිත්තයෝ පස්විසිදෙන (25) එක්වරක්ද බොහෝ වරක්ද උපදින චිත්තයෝයි. මනොද්වාරාවජ්ජිතය එක්වරක්ද දෙවරක්ද තෙවරක්ද උපදින චිත්තයයි. කාම ප්‍රතිසන්ධි චිත්තයෝ දසදෙන (10) නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන කුශල ක්‍රියා දෙදෙන (2) යන දොළොස්දෙන (12) එක්වරක්ද දෙවරක්ද බොහෝවරක්ද උපදින චිත්තයෝයි. සොතාපත්ති ඵලය සහ ශකෘදාගාමි ඵලය දෙවරක්(2)ද තෙවරක්(3)ද බොහෝවරක්ද උපදින චිත්තයෝයි. අකුශල මහා කුශල ක්‍රියා විප්‍රයුක්ත හසිතොත්පාද යන එකොළොස් දෙන (11) පස්වරක් (5)ද සවරක් (6)ද සත්වරක් (7)ද උපදින චිත්තයෝයි. මහාකුශල ක්‍රියා සම්ප්‍රයුක්තයෝ අටදෙන (8) තෙවරක් (3)ද සිවුවරක්(4)ද පස්වරක් (5)ද සවරක්(6)ද සත්වරක් (7)ද උපදින චිත්තයෝයි මේ සියල්ල එකතුකළවිට එකූනානු (89) චිත්ත සඞ්ඛ්‍යාව සම්පූර්ණ වේ.

තවද එක්වරක් උපදින සිත් අටපනස (58) කී. දෙවරක් උපදින සිත් අටළොස (18) කී. තෙවරක් උපදින සිත්තුන (3) කී. සතරවරක් උපදින සිත් අට (8) කී. පස්වරක් උපදින සිත් එකුන්තිස (29) කී. සවර සත්වර උපදින සිත්ද එකුන්තිස (29) බැගිනි. බොහෝවර උපදින සිත් එක්සාළිස (41) කී. මෙය යට කියනලද නය ආශ්‍රයකරමින් සෙවියයුතු. මණිසාර මඤ්ජූසායෙහි වනාහි ප්‍රතිසන්ධියට අනතුරුව භවඞ්ගය තෙළෙස්වරක් (13) තුදුස් වරක් (14) පසළොස්වරක් (15) සොළොස් වරක් (16) ද මාර්ග විථියෙහි ඵල ජවනය එක්වරක් (1) දෙවරක් (2) තුන්වරක් (3) ද නිරෝධ සමාපත්තියට පූර්ව භාගයෙහි නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන ධ්‍යාන ජවනය එක්වරක් (1) දෙවරක් (2) ද උපදින බව කීහ. මේ වාර භෙද විභාගයි.

තවද අනන්තර ප්‍රත්‍යය පට්ඨාන නය වශයෙන්ද මෙහි චිත්ත ස්වරූප දක්වනුලැබේ.

ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව භවඞ්ග චිත්තය වේ. භවඞ්ග චිත්තයට අනතුරුව භවඞ්ග සහ ආවජ්ජිතය වේ. පඤ්චද්වාරාවජ්ජිතයට අනතුරුව පඤ්ච විඥානය වේ. ඊට අනතුරුව සංපටිච්ඡිතය. ඊට අනතුරුව වොට්ඨපනය. ඊට අනතුරුව වොට්ඨපනය සහ කාමාවචර ජවන පඤ්චවොකාර භවඞ්ගද වේ. මනොද්වාරාවජ්ජිතයට අනතුරුව කාමාවචර ජවන. ඊට අනතුරුව කාමාවචර මහද්ගත ලොකොත්තර ජවන සහ තදාරම්මණ භවඞ්ග චුතිද වේ. අර්පිනා ජවනයට අනතුරුව අර්පිනා ජවන සහ ත්‍රි

හෙතුක භවඞ්ගද වේ. තදාරම්මණයට අනතුරුව තදාරම්මණ් කාමාවචර භවඞ්ග සහ චුතිද වේ. චුතියට අනතුරුව ප්‍රති සන්‍ධියවේ.

**මේ උත්පත්ති ක්‍රමයෙන් චිත්ත සවරූප විභාග නයයි.**

තවද ලොභ මූල චිත්තයට අනතුරුව ලොභ මූල. සන්තීරණ මහාවිපාක. මහද්ගත විපාක යන අටවිසි (28) චිත්තය උපදී. ද්වෙෂ මූල චිත්තයට අනතුරුව ද්වෙෂමූලචය. උපෙක්‍ෂා සන්තීරණ. උපෙක්‍ෂා සහගත මහාවිපාක යන අෂ්ට (8) විධ චිත්තය උපදී. මොහ මූල චිත්තයට අනතුරුව මොහමූලචය. සන්තීරණ. මහාවි පාක. මහද්ගත විපාක. යන දෙවිසි (22) චිත්තය උපදී. කාමා වචර කුශලයට අනතුරුව සන්තීරණ. මහාකුසල්. මහාවිපාක. රූපාරූප කුසල් විපාක සහ විසි (20) වැදැරුම් මාර්‍ගී චිත්තය පස ළොස් (15) වැදැරුම් හෙයිම ඵල චිත්ත යන දෙසැත්තෑ (72) චිත් තය උපදී. කාම විපාකයට අනතුරුව ආවර්ජනවය පඤ්ච විඤ්ඤා ණ වර්ජිත ලෞකික විපාක යන සූවිසි (24) චිත්තය උපදී. කාම ක්‍රියාවන්ට අනතුරුව අකුසල් කාමාවචර කුසල්. මනොධාතු ත්‍රි කය වර්ජිතකොට ඇති කාම රූපාරූප විපාක ක්‍රියා අභිත්ඵල චිත්තයෝ පස්දෙන යන සිව් සැත්තෑ (74) චිත්තය උපදී. රූපා වචර කුසලයට අනතුරුව රූපාවචර කුසල්. පඤ්චවොකාර ත්‍රිහෙතුක විපාක යන තුදුස් (14) චිත්තය උපදී. රූපාවචර විපා කයන්ට අනතුරුව ආවර්ජන මහාවිපාක රූපාරූප විපාක යන එකුන්විසි (19) චිත්තය උපදී. රූප ක්‍රියාවට අ නතුරුව රූපක්‍රියා පඤ්චවොකාර ත්‍රිහෙතුක විපාක යන තුදුස් (14) චිත්තය උපදී. අරූප කුශලයට අනතුරුව අරූප කුසල් ත්‍රිහෙතුක භවඞ්ග අනාගාමි ඵල යන අටලොස් (18) චිත්තය උපදී. අරූප විපාක යන්ට අනතුරුව මනොවාරාවර්ජනය ඥාන සම්ප්‍රයුක්ත මහාවිපාක අරූප විපාක යන නව (9) විධ චිත්තය උපදී. අරූප ක්‍රියාවට අනතුරුව අරූප ක්‍රියා, ත්‍රිහෙතුක භවඞ්ග අභිත්ඵල යන අට ළොස් (18) චිත්තය උපදී මාර්‍ගී චිත්තයට අනතුරුව චතුර්විධ ඵල චිත්තය උපදී. ඵලචිත්තයට අනතුරුව ඵල චිත්තය සහ ත්‍රිහෙතුක භවඞ්ග යන සතළොස් (17) චිත්තය උපදී.

තවද ලොභ මූල ප්‍රථම අසංස්කාරික චිත්තයට අනතුරුව ඵම අසංස්කාරික චිත්තය සමඟ සන්තීරණ මහාවිපාක මහද් ගත විපාක යන එක්විසි (21) චිත්තය උපදී. මේ නයින් අභිත්

ඵල පඤ්චම ධ්‍යාන චිත්තය දක්වා එකී එකී චිත්තයකට අනතුරුව උපදින චිත්ත සංඛ්‍යාව ගිණියයුතු.

තවද ලොභමූල චිත්තයට අනතුරුවම ඉපදී ද්වෙෂමූල චිත්තයට අනතුරුව නූපදින සිත් ද්වෙෂමූල චිත්තයට අනතුරුවම ඉපදී ලොභමූල චිත්තයට අනතුරුව නූපදින සිත් ඒ දෙකම කෙරෙන් උපදින සිත් ඒ දෙකම කෙරෙන් නූපදින සිත් මේ ආදී වශයෙන්ද බෙදියයුතු.

මෙසේ දක්වනලද වීථි චිත්තයන්ගේ ස්වරූප විභාගය යහපත්සේ පුහුණු කළහොත් වීථි ප්‍රස්තාරය සුවසේ අවබොධකළ හැකි හෙයින් අකුසීතව නැවත නැවත ස්වරූප විභාගකටයුතු.

**මේ වීථි චිත්තයන්ගේ ස්වරූප විභාගනයයි.**

(12) දැන් මෙහි වාවෝද්ග කලයුතු සාධක ගාථාදිය දක්වනු ලැබේ.

රූප සද්දා අනෙකාව–සකණ්ඨානාප දිස්සරෙ,
තපන ස මූද යෙන–අල්ලී නෙ කා පි සෙ සකා.
පසාද පිච එකාපි–හොන්ති විඤ්ඤාණ තිස්සයා,
“ චක්ඛුං පටිච්ච රූපෙච උප්පජ්ජන්ති ” පාඨතො.
යදි චෙතං චයං අත්ත–සම්පං යෙව ගණ්හති,
අක්ඛි වණ්ණං තථා මූලං–පසෙස්සය්‍ය හමුඛස්සච.
දිසා දෙස ච වත්ථානං–සද්දස්ස න භවෙය්‍යච,
සියාච සද්ද වෙධිස්ස–සකණ්ණෙ සර පා තනං.
යථා වෙගෙ න ධා චනෙතා–ධාතු කාමො තතිඨති,
එවං චික්ඛත්තුං භවඞ්ගං–උප්පජ්ජිත්වා ච ඡිජ්ජති,
ඡිවාරත්තා ති රුඩත්තා–තදාලම්බං න ජායති,
අතීතෙ පිච ආලම්බෙ–නානාරම්මණ භාවතො,
නහිමග්ග ඵලාඤ්ඤත්‍ර–නානාරම්මණ සම්භවො.
උතුබීජනියාමොච–කම්ම ධම්ම නියා මතා,
චිත්තස්සච නියාමොති–ඤෙය්‍යා පඤ්ච නියා මතා.
පුප්ඵාදි ධාරණං තුල්‍ය–ඵලුප්පා දො විපාක දො,
මහිකමෙපා චිත්තුප්පත්ති–නිදස්සන මිදංකමා.
මණිඛනා න පෙ අග්ගි–අසනෙනාපි සමාගමෙ,
යථා හොති තථා චිත්තං–චක්ඛා ලම්බාදි සඞ්ගමෙ.
ජනකං තං සමානංවා–ජවනං අනුබන්ධති,
කතුඤ්ඤුං තදාලම්බං–බාලදාර ක ලීලයා,

සම්භව තොව බීජස්ස-කාමෙ තණ්හා වසෙනවා,
ඉඨා තිඨාන්ති මජ්ඣස්ස-වසාචාර වසෙනවා,
පයොගස්ස වසෙනාපි-තිවජිතා නීති ආගතං.

( මරණාසන්න භාවෙන මන්දීභූත වෙගත්තා පඤ්චෙව ජවනානි )

අවිජ්ජා තණ්හා සඞ්ඛාර-සහජෙහි අපායිතං,
විසයාදීනව ඡන්දං-තා මතංඛි පතං පිව.
අප්පහීනෙහි සෙසානං-ඡාදනං තා මතං පිව,
ඛිපකා පන සඞ්ඛාරා-කුසලාව භවනතිහ.
උපරූපරි ආ රූප්පා-න ආයු භනති හෙඩිමං,
බලිනතා චූපචාරස්ස-තිහෙතුකාව සන්ධියො.
භවනතර කතං කම්මං-යමොකා සං ලභෙ තතො,
හොතිසා සන්ධි තෙ තෙව-උපඨාපිත ගොචරෙ.

මෙහි අර්ථ :-රූපසද්දා, රූපාරම්මණ ශබ්දාරම්මණයෝ, අනෙකාව, (මනඃසකාරාදු රූපව) අනෙකවිධවූවාහුම; සකඨානං, සවකීය ස්ථානයෙන්; පදිස්සරෙ, දෘශ්‍යාපාතගත වෙත්; පන (තථාපි), එසේ දෘශ්‍යාපාතගතව තුදු; සමුදායෙන, සමූහභාවයෙන්, න, ආරම්මණ භාවයට නොපැමිණෙත්. සෙසකා, අතිරික්තගන්ධරස ස්ප්‍රෂ්ටව්‍යයෝ වනාහි; අල්ලීනා, (විඥානනිඃශ්‍රය ප්‍රසාදවස්තුයෙහි) ලග්නවීමෙන්; එකාපි, එකකලාපස්ථ ආරම්මණයෝද; පදිස්සරෙ, දක්නාලැබෙත්.—පසාද පිව, ප්‍රසාදයෝද, ඒකාපි, එකකලාපස්ථ වූවාහු නමුදු; විඤ්ඤාණනිස්සයා, පඤ්ච විඥානයාගේ නිඃශ්‍රයෝ; හොනති, වෙත්; (මේ අර්ථය කවරක් සාධකකිරීමෙන් දතයුත්තේද ? යත්.) චක්ඛුං පටිච්චරූපෙච උප්පජ්ජතීති පාඨතො, 'චක්ඛුං පටිච්චරූපෙච උප්පජ්ජති, යනු වදාළ හෙයින් දතහැක්කේය; ටීකාසඞ්ගහ ගාථා, එතංවයං, මේ චක්ෂුශ්‍රොත්‍රය, අසම්පත්ත ගොචරං යෙව, තම සමීපයට පැමිණි රූප ශබ්දම; යදිව ගණ්හති, ඉදින් ගන්නේවීනම්; අක්ඛිවණ්ණං, අක්ෂිවර්ණය, පස්සෙය්‍ය, දක්නේවෙයි; තථා, එපරිද්දෙන්; හනුකස්සව මූලං, බැමමුලද; පස්සෙය්‍ය, දක්නේවෙයි—සද්දස්ස, ශබ්දයාගේ; දිසාදෙස වවත්ථානං, දිශාදෙස ව්‍යවස්ථාවක්ද; නභවෙය්‍ය, නොවන්නේය; සද්දවෙධිස්ස, ශබ්ද ශ්‍රවණයෙන් විදින්නාවූ අන්ධ ධනුර්ධරයාගේ; සකණ්ණ, සවකීය කණ්ණියෙහි, සරපාතනඤ්ච, සැරනිපාතනයද; සියා, වන්නේය; විභාවනි ටීකා, වෙගෙන වෙගයෙන්; ධාවනෙනා, දුවන පුරුෂතෙම; ඨාතුකාමො, (එකපහරින්) සිටිනු කැමැත්

තේවි නමුදු; යථා න ති ඨ ති, යම්සේ නොසිටියහැක්කේ වේද, එවං, එපරිද්දෙන්; භවඞ්ගං, භවඞ්ගය; විකඛිත්තුං, දෙවරක් (2) උප්පජ්ජිත්වාව, ඉපදම; ජිජ්ජති, සිදෙයි.

තදාලම්බං, තදාරම්මණය, විචාරත්තං, දෙවරක් (2) ඉපදීම සව භාවකොටඇති හෙයින්ද; නිරුඬත්තං, අරමුණු නිරුඬවූ හෙයින් ද, නජායති, (මහන්තාරම්මණාදියෙහි) නූපදී; අතීතෙපිච ආල ම්බෙ, නිරුඬව අතික්‍රාන්තවූ අතීත ආරම්මණයෙහිද; නානාරම්ම ණ භාවතො, ආවජ්ජනාදීන් සමඟ කාලවශයෙන් භින්නාරම්මණ ඇති හෙයින්; නජායති, තදාරම්මණ නූපදී; හි, ඒ එසේමය; මග්ග ඵලා, මාර්ග් වීථිඵල සමාපත්ති වීථින් කෙරෙන්; අඤ්ඤත්‍ර, අන්‍යවීථි යෙක්හි; නානාරම්මණ සම්භවො, නානාරම්මණ සම්භවය; න, නැත්තේය; උතු බීජනියාමොච, ඍතුනියාම බීජනියාමවයද; කම්මධම්මනියා මතා, කර්මනියාම ධර්මනියාමවයද; චිත්තස්ස, චිත්ත යාගේ; නියාමොච, නියාමයද; ඉති, මෙසේ; නියාමතා, නියාමධර් යෝ; පඤ්චව, පස්දෙනකැ (5) යී; ඤෙය්‍යා, දතයුත්තාහුය; පුප්ඵාදි ධාරණං, (වෘක්ෂලතාවන්ගේ ඵකපහරින්) මල්ආදිය දූරමද, තුල්‍ය ඵලුප්පාදෙ, බීජය හා සදෘශඵලොත්පාදයද; විපාකදෙ, කාමයට අනුකූල විපාකදනයද; මහීකම්පෙ, බුඬාඞ්කුරයන්ගේ ප්‍රතිසන්ධි ග්‍රහණය නිමිත්තකොටගෙන පෘථිවි කම්පාවද; ඉදං, මෙය; කමා, පළිවෙළින්; නිදස්සනං, උදාහරණයි. ටීකා සඞ්ග්‍රහ ගාථා, මණි ඞනාතපෙ, සූර්‍ය්‍යකාන්ත පාෂාණය කාෂ්ටය හා ආතපය; සමාගමෙ, සඞ්ගමවූ කල්හි; අසන්තොපි, අවිද්‍යමානවූද ; අග්ගි, වහ්නිය තෙම; යථාහොති, යම්සේ උපදනේවේද; තථා, එපරිද්දෙන්; චිත්තං, චිත්තයද; වත්ථාලම්බාදි සඞ්ගමෙ, වස්තුආලම්බනාදී ප්‍රත්‍යය සාමාග්‍රිය ඇති කල්හි; අසන්තංපි, පළමු නොතුබූ නමුදු; හොති; ඇතිවේ. සච්චසඞ්ඛෙප අඨකථා. තදාලම්බං, තදාරම්මණයතෙම; බාලදාරකලීලයා (බාලදාරකලීලාය) බාලදරුවෙකුගේ ලීලාවෙන්; ජනකංවා, ජනකවූ කාමකුශලාකුශල ජවනය සාරද; තංසමා නං, තත්සමානවූ; ජවනංවා, කාමක්‍රියා ජවනය කරාද; අනුබන්ධ ති, ලුහුබැඳයයි; අඤ්ඤනතු, අන්‍යමහද්ගත ලොකොත්තර ජවන කාර. වනාහි; නානුබන්ධත්, ලුහුබැඳ නොයයි---බීජස්සච, (කාම ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත) බීජයාගේද; සම්භවතො, සම්භවය වන හෙ යින්; වා, නොහොත්; තණ්හා වසෙන වා, කාමතෘෂ්ණාවගේ වශ යෙන් හෝ; කාමෙ, කාමාවචර භූමියෙහිම; හොති, තදාරම්මණය ඇතිවේ; විභාවනීටීකා සඞ්ග්‍රහ ගාථා, ඉඨානිඨාන, ඉෂ්ට අනිෂ්ට

ආරම්මණයෝ; මජ්ඣිමස්ස, මධ්‍යස්ත පුද්ගලයාගේ; වසා, වශයෙන් ද; මාර වසෙනවා, මාර වශයෙන්ද; පයොගස්ස, ප්‍රයොගයාගේ; වසෙනාපි, වශයෙන්ද; නිච්ඡිතාති, නිශ්චිතයහ; ඉති, මෙසේ; අංගනං, **විභඞ්ග අඨ කථායෙහි** ආයේය.

මරණාසන්න භාවෙන, මරණාසන්න භාවයෙන්; මන්දීභූත වෙගත්තා, මඳවූ වෙගඇති හෙයින්; පඤ්චෙව, පස්වරක් (5) මවූ; ජවනානි, ජවනයෝ; හොන්ති, වෙත්; **විසුද්ධිමග්ග අඨ කථා,** අවිජ්ජා තණ්හා සඞ්ඛාර සහජෙහි, මරණාසන්න ජවන සහගත අවිද්‍යා තෘෂ්ණා කර්මයන්ගෙන්; අපායිනං, අපායගතවන සත්වයන්ගේ; විසයාදීනවච්ඡාදං; (ආරම්මණයාගේ) ආදී නවවැසීමද; නාමනං, භවයට නැමවීමද; ඛිපනංපිච, භවයෙහි දමාගැසීමද; හොති, වේ; සෙසානං, අවශෙෂ සුගතිගාමී සත්වයන්ගේ; අප්පහීනෙහි, මාගීයෙන් අප්‍රහීන අවිද්‍යා තෘෂ්ණාවන්ගෙන්; ඡාදනං, (ආරම්මණයාගේ) ආදීනව වැසීමද; නාමනංපිච, භවයට නැමවීමද; හොති, වේ; ඛිපකා සඞ්ඛාරාපන, භවයෙහි හෙල නසංස්කාරයෝ වනාහි; ඉහ, මේ සුගතිගාමී කර්මයෙහි; කුසලාව භවන්ති, මරණාසන්න ජවන සම්ප්‍රයුක්ත කුශලකර්මයෝම වෙත්; **සච්චසඞ්ඛෙප අඨකථා,** උපරූ පරිආරුප්ප, උපරූපරිආරූප්‍ය භූමිගත බ්‍රහ්මයෝ: හෙයිමං, හෙයිමහෙයිම රූපාරූප ධ්‍යානකර්ම; න ආයූහන්ති, රැස්නොකෙරෙත්; තසමාච, එහෙයින්ද, උපචාරස්ස, උපචාර ධ්‍යානයාගේ; බලිත්තාව, බලවත් භාවයෙන්ද; තිහෙතුකාව සන්ධියො, සවකීය ප්‍රතිසන්ධිය සමග උපරූපරි අරූපප්‍රතිසන්ධි කාමත්‍රිහෙතුක ප්‍රතිසන්ධිහුම්; හවන්ති, ඇතිවෙත්; **විභාවනී ටීකා සඞ්ග්‍රහ ගාථා.** භවන්තර කතං, අනතුරූ කාමසුගති භූමියෙහිදී කරනලද්දාවූ යංකම්මං, උපචාර ධ්‍යාන චෙතනා සඞ්ඛ්‍යාත) යම් කර්මයක්; ඔකාසංලභෙ, අවකාශ ලබයිද; තතො, එහෙයින්; සායන්ධි, ඒ (අරූතලයෙන් චුතවන පුද්ගලයන්ගේ) කාමප්‍රතිසන්ධි තොමෝ; තෙ තෙව, ඒ (උපචාර ධ්‍යාන චෙතනා සඞ්ඛ්‍යාත) කර්මයෙන්ම; උපඨාපිත ගොචරෙ, එලවනලද අරමුණෙහි; හොති, වේ.

**කාම විපි සාධක පාලයාඤ්ඡ යොජනායි.**

පපා තාහි මුඛොධාවං—ඨාතු කාමො පි තුස්සහෙ,
එවං ඡඬෙ සන්න මෙවා—අපෙපතුං නච සක්කාති.
(භවඞ්ගාසන්නත්තා)
අලද්ධා සෙවනං චිත්තං—දුබ්බලත්තාව ගොත්‍රභුං,
උප්පාදෙතුං නසක්කොති—තතී යෙපි න සක්කාති,

අප්පනාංහි සඞ්ඛාරත්තා–නාතිදූරංච තස්සතු,
පුබ්බා පරානුලොමත්තා–නාම ගොත්‍රාදිනී භවා.
පරිකම්මාදිනාමාති–ලභන්තීති පකාසිතා.
උප්පජ්ඣාන කිච්චත්තා–නාමාදි පටිපක්ඛතො,
සනෙන සවපිච අඞ්ගෙසු–පඤ්චච ඣාන සඤ්ඤිතා.
විතක්කො ථීන මිද්ධස්ස–විචිකිච්ඡාය විචාරො,
පීති ච ව්‍යාපාදස්ස–සුඛං උද්ධච්ච කුක්කුච්චං.
සමාධි කාමච්ඡන්දස්ස–පටිපක්ඛොති පෙටකෙ,
තස්මා පඤ්චවතෙ ධම්මා–පහා නඞ්ගතියා මිතා.
සභාවත්තා ච තෙ ඤාතා–එකස්සාපිච ගම්භීරා,
බුද්ධානුස්සති ආදීසු–උපචාරොව නාප්පනා,
පරම ත්වෙපි භාවනා–බලෙනා රුප්පනුත්තරා.
නාවාඅරිත්ත බලෙන–සීඝසොතම්හි තිට්ඨති,
එවං සු හෙසු චිත්තම්පි–තක්කන බලෙන තිට්ඨති,
තෙනෙතං පඨමං ඣානං–නහොන්ති දුතියාදිනි.
ලක්ඛණෙ තාප්‍යප්පමඤ්ඤා–තිසෙසාපුරාච තුකකාජ,
සොමනස්සා විප්පයොගා–දොමනස්ස ජතිස්සරා,
මජ්ඣත්ත වෙදනා යොගා–පඤ්චමෙ ජිතුපෙක්ඛකා,
මෙත්තාදීසුච ලද්ධජ්ඣා–නිකාසෙස වෙස වත්තති.
යථා පිසාච නීරූකො–රත්තිංබණ්ණුම්පි හයාති,
එවං කාරජ නිරූකො–යොගී කසිණ රූපකං.

(අනන්තතා පනස්ස උප්පාද වයන්තා භාවතො අනන්ත මනසිකාර වසෙනවා වෙදිතබ්බා–සනන්තතො වෙමනසී කරෙති. තථං සමතික්ක මොති. අසමාපජ්ජිතු නාමනාය.)

ආලම්බිතං කරෙතෙව–අඤ්ඤා භාවෙන්තං ඉදං,
දිඨ දෙ සමපි රූජතං–වුත්ති හෙතුජනො යථා.

(අප්පෙති ආරම්මණෙ අප්පෙනෙනාවිය පවත්තතීති විතක්කො අප්පනා–තංමූඛ තා වසෙන සබ්බෙපි මහග්ගතා නුත්තර ඣාන ධම්මා අප්පනාති වුච්චන්ති.)

(පඤ්චසු ඣානඞ්ගෙසු එකෙකාරම්මණෙ උප්පන්නා වජ්ජනා නන්තරංචතු පඤ්ච ජවන කතිපය භවඞ්ගතො පරං අගන්තවා අපරාපරං ඣානඞ්ගාවජ්ජන සමත්ථතා අවජ්ජනව සිතානාම.)

(සමාපජ්ජිතු [කාමතානන්තරං කතිපය භවඞ්ගතො පරං අගන්ත්වා උප්පන්නා වජ්ජනා නන්තරං සමාපජ්ජිතුං සමත්ථතා සමාපජ්ජන වසිතා නාම.)

(සෙතුවිය සීඝසොතාය නදියා ඔඝං භවඞ්ග වේගං උපච්ඡින්දිත්වා යථා පරිච්ඡින්න කාලං ඣානං ඨ පෙතුං සමත්ථතා භවඞ්ගපාතතො රක්ඛණ යොග්‍යතා අධිට්ඨාන වසිතා නාම.

(යථා පරිච්ඡින්න කාලං අනතික්කමිත්වා ඣානතො උට්ඨාන සමත්ථතා උට්ඨාන වසිතා නාම.)

(පච්චවෙක්ඛණ වසිතා ආවජ්ජන වසිතාය එව සිද්ධා.)

(ආවජ්ජනානන්තරං උප්පන්න ජවනානෙවහි පච්ච වෙක්ඛණ ජවනානි නාම.)

මෙහි අර්ථ :-පපාතාභි මුඛො, ප්‍රපාතාභි මුඛව; ධාවං, දුවන තැනැත්තේ; ඨාතු කාමොපි, නවතිනු කැමැත්තේවී නමුදු; නුසස්ස හෙ යථා, යම්සේ නොහැක්කේවේද; එවං, එපරිද්දෙන්; ජනෙවා, සවෙතිවද; සත්ත මෙවා, සත්වෙතිවද, අපෙපතුං, (අපීතා භාවයෙන්) උපදින්ට; නවසක්කාති, නොමහැක්කේය; කස්මා කුමක් හෙයින්ද? යත්. භවඞ්ගසන්තානතා, භවඞ්ගයට ආසන්න හෙයිනි. විසුද්ධිමග්ග සඞ්ගහ ගාථා. අලද්ධා සෙවනං, ලබන ලද ආ සෙවන ප්‍රත්‍යය නැත්තාවූ; චිත්තං, චිත්තයතෙම; දුබ්බලත්තාව, දුර්වල භාවයෙන්ම; ගොත්‍රභුං, ගොත්‍රභූ ජවනය; උප්පාදෙතුං, උපදවන්ට; නසක්කා, නොහැකිවේ. ඉති (කස්මා) එහෙයින්; තතියෙපි, තෙවෙනිවද; අපෙපතුං,(අපීතා භාවයෙන්) උපදින්ට; නසක්කොති, නොහැකිවේ; පරමත්ථ මඤ්ජුසා සඞ්ගහ ගාථා. අප්පනාභි සඞ්ඛාරත්තා, අපීතාභි සංස්කාරක හෙයින්ද; තු, මෙයින් අතික් නවත් කාරුණක් නම්; තස්ස, ඒ අපීතාවගේ; නාතිදූරාච, අතිදූර නොවීමෙන්ද; (චශබ්දයෙන් අප්පනං උපෙච්ච චරතීති උපචාරං, යන ටීකා නීතිය අර්ථ විකල්පය පිඹුකෙරේ) පුබ්බා පරානු ලොමත්තා, පෙරපසු ජවන අපීතාවන්ට අනුරූප හෙයින්ද; කාම ගොත්තාදිභි භවා, කාමගොත්‍රාදිය අභිභවනය කරන හෙයින්ද; පරිකම්මාදි නාමානි, පරිකර්මාදි නාම හෙවත්. පරිකර්ම. උපචාර. අනුලොම. ගොත්‍රභූ යන නාමයන්; ලභන්ති, ලබත්; ඉති, මෙසේ; පකාසිතා, විභාවනී ආදියෙහි ප්‍රකාශිතයහ; අඤ්ඤෙසුඵස්සාදීසු, අන්‍යඵස්සාදි ධර්මයෝ; සන්තෙසුපිච, විද්‍යමාන වද; පඤ්චෙව, විතර්කාදි ධ්‍යානාඞ්ගයෝ පස්දෙනම; උපනිජ්ඣාන කිච්චත්තා, උපනිධ්‍යාන කෘත්‍යවත් හෙයින්; කාමාදි පටි පක්ඛතො, කාමච්ඡන්දනී වරණාදීන්ට ප්‍රතිපක්ෂ හෙයින්; ඣානඞ්ගානීති, ධ්‍යානයෝයි දන්නාලදහ; පූර්වාචාර්‍ය්‍යයෝ භාෂිතයි; විතක්කො,

විතක්කයතෙම; ථිනමිද්ධස්ස, ථිනමිද්ධනීවරණයාගේ; පටිපක්ඛො, ප්‍රතිපක්‍ෂ ධර්‍මයි; විචාරො, විචාරයතෙම; විචිකිච්ඡාය, විචිකිච්ඡානීවරණයාගේ; පටිපක්ඛො, ප්‍රතිපක්‍ෂ ධර්‍මයි; පීතිචාපි, ප්‍රීතිතොමෝද; බ්‍යාපාදස්ස, ව්‍යාපාද නීවරණයාගේ; පටිපක්ඛො, ප්‍රතිපක්‍ෂ ධර්‍මයි; සුඛං, සුවයතෙම; උද්ධච්චකුක්කුච්චං, (උද්ධච්චකුක්කුච්චස්ස,) උද්ධච්ච කුක්කුච්ච නීවරණයාගේ; පටිපක්ඛො, ප්‍රතිපක්‍ෂ ධර්‍මයි; සමාධි,සමාධියතෙම; කාමච්ඡන්දස්ස, කාමච්ඡන්දනී වරණයාගේ; පටිපක්ඛො, ප්‍රතිපක්‍ෂ ධර්‍මයි; ඉති, මෙසේ; පෙටකෙ, නෙත්ති ප්‍රකරණයෙහි; වුත්තං, වදාරණලදී; තස්මා, එහෙයින්; තෙපඤ්ච ධම්මා, ඒ ධ්‍යානාඞ්ග ධර්‍මයෝ පස්දෙනම; පහානඞ්ගා, ප්‍රහානාඞ්ගයෙහිලා; නියාමිතා, නියමකරන ලදහ; සභාවත්තාච, පරමාර්ථ ස්වභාව ධර්‍මවූ හෙයින්ද; නෙකත්තාච, අනෙකවිධවූ හෙයින්ද; එකස්සපි, එක අරමුණක්හුගේද; ගම්භීරත්තාච, ගාම්භීර්‍ය්‍ය හෙයින්ද; බුද්ධානුස්සති ආදීසු, බුද්ධානුස්මෘති ආදී කර්‍මස්ථානයන්හී; උපචාරෙච, උපචාරසමාධියම; හොති, වේ; අප්පනා, අර්පිතා සමාධිය; න,නොවේ; ආරුප්පනුත්තරා, විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ලොකොත්තර යන ධර්‍මයෝ වනාහී; පරමත්ථෙපි, පරමාර්ථ ආරම්මණයෙහිද; භාවනා බලෙන, භාවනා බලයෙන්; අප්පනං, අර්පිතාවම; පාපුණන්ති, පැමිණෙත්. නාවා නෞකා තොමෝ; අරිත්ත බලෙන, අරිත්ත (රිටි) බලයෙන්; සීඝසොතම්හි ශීඝ්‍රසැඩ පහර ඇති ජලශ්‍රොත්‍රයෙහි; යථාතිට්ඨති, යම්සේ නැවතී සිටීද; එවං, එපරිද්දෙන්; අසුභෙසු; අසුභ ආරම්මණයන්හි; චිත්තංපි, චිත්තයද; තක්ක බලෙන, විතර්‍ක බලයෙන්; තිට්ඨති, නැවතී සිටී; තෙන, එහෙයින්; එත්ථ, මේ අසුභ ආරම්මණයෙහි; පඨමං ඣානං, ප්‍රථම ධ්‍යානයම; හොති, ඇතිවේ; දුතීයාදීනි, විතීය ධ්‍යානාදීහු; නහොන්ති, ඇති නොවෙත්; අප්පමඤ්ඤා, අප්‍රමණ්‍යයෝ; ලක්ඛණෙකාපි, අප්‍රමාණ සත්වප්‍රඥප්ති ආරම්මණකරණ ලක්‍ෂණයෙන් සමානවූවාහු නමුදු; පුරිමතිස්සො, මෛත්‍රීකරුණා මුදිතා යන පූර්‍ව අප්‍රමණ්‍යයෝ තිදෙන; සොමනස්සවිප්පයොගා, සොම්නස් වෙදනාව හා සම්ප්‍රයොග වන හෙයින්ද; දොමනස්ස පනිස්සරා, දෞර්‍මනස්‍යජ ව්‍යාපාදාදීන්ගේ නිඃශ්‍රරණ ස්ථාන හෙයින්ද; චතුක්කජ්ඣ, ධ්‍යානචතුෂ්කයෙහි උපදනාහුය; උපෙක්ඛා, උපෙක්‍ෂා අප්‍රමණ්‍යයතොම; මජ්ඣත්ත වෙදනා යොගා; මධ්‍යස්ත වෙදනා වහා සම්ප්‍රයොග වන හෙයින්; පඤ්චමෙ, පඤ්චම ධ්‍යානයෙහි; ජාතා ඇතිවන්නීය; මෙත්තාදීසු, මෛත්‍රී ආදී අප්‍රමණ්‍ය

ආරම්මණයන්හි; ලද්ධජ්ඣානිකාසෙසව, ලබනලද ධ්‍යාන ඇති යෙ ගාවචරයාහටම; එස (එසො), මේ උපෙක්ෂා බ්‍රහ්ම විහාර සමාධි තෙම; වත්තති, ඇතිවේ.

පිසාචභීරුකො, පිසාචභීරුක පුරුෂතෙම; රත්තිං, රාත්‍රිකාල යෙහි; ඛාණුම්පි, කණුවටද; යථාභායති; යම්සේ බියවේද; එවං, එ පරිද්දෙන්; කරජභීරුකො, කරජකායට බියවූ; "කරජකායන්ති චතුසන්තති රූපමාහ" යනු සූත්‍රාන්ත ටීකායි. යොගී, යොගාව චරතෙම; කසිණරූපකම්පි, කසිණරූපයටද; භායති, බියවෙයි; අළුකථා සඞ්ගහ ගාථා. අස්ස, ඒ ආකාශ ප්‍රඥප්තිහුගේ; අනන්ත තාපන, අනන්තතාව වනාහි; උප්පාද වයන්තා භාවතො, උත් පාදාන්ත භඞ්ගාන්තයන්ගේ අභාව වශයෙන්; වා, නොහොත්; අනන්තමනසිකාර වසෙන, අනන්තමනස්කාර වශයෙන්; වෙදි තබ්බා, දතයුත්තීය; අභිධම්මත්ථවිභාවනී. සන්තතො, ශාන්ත වශයෙන්; වෙමනසී කරොති, ඉදින් මෙනෙහිකරයි නම්; කථං සමතික්කමොති, කෙසේ සමතික්‍රමණය වේද ? යත්. අසමාප ජ්ජිතු කාමතාය, සමව දිනු කැමැත්ත නැති හෙයින්; සමතික්ක මො, සමතික්‍රමණය; හොති, වේ; (ඉතා සමත් දන්න ශිල්පියෙකු දිටු මහිපාලයෙකු මෙනි යනු භාවයි) ජනො, මහජනතෙම; රාජා නං, රජහු; දිට්ඨදොසම්පි, දක්නාලද දොස් ඇතිවද; වුත්තිහෙතු, ජීවි කාවෘත්තිය හෙතුකොටගෙන; නිස්සාය, නිඃශ්‍රයකොට; පවත්තති යථා, පවත්නාක් මෙන්; ඉදං, මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයතෙම; අඤ්ඤා භාවෙන, අන් අරමුණක්ගැනීමට නැති හෙයින්; තං, ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය; දිට්ඨදොසම්පි, දක් නාලද දොස් ඇතිවද; ආරම්මණං කරොතෙව; අරමුණු කෙරේ මය; අළුකථා. ආරම්මණෙ, ආරම්මණයෙහි; අප්පෙන (අප්පෙ නොනාවිය පවත්තති), එළඹ ඇතුල්වන්නාක්මෙන් වෙයි; ඉත (ත සමා), එහෙයින්; විතක්කො, විතර්කයතෙම; අප්පනා, අර්පනා නම්; තාම්මුඛ නාවසෙන, ඒවිතර්කප්‍රමුඛභාව වශයෙන්; සබ්බොපි මහග්ග තානුත්තර ඣාන ධම්මා, සකල මහද්ගත ලොකොත්තර ධ්‍යාන ධර්මයෝද; අප්පනාති, අර්පනායයි; වුච්චන්ති, කියනු ලැබෙත්; පඤ්චසු ඣානඞ්ගෙසු, පඤ්චවිධ ධ්‍යානඞ්ගයන් අතුරෙහි; එකෙකා රම්මණෙ, එකී එකී ධ්‍යානඞ්ගාරම්මණයෙක්හි; උප්පන්නා වජ්ජනා නන්තරං, උපන් ආවර්ජනයට අනතුරුව; චතු පඤ්ච ජවන කති පය භවඞ්ගතො පරං, ජවන සිත් සතර වරකට පස්වරකට භව ඞ්ග සිත් දෙවරකට තුන්වරකට වඩා; අගන්ත්වා, නොගොස්; අපරා

පරං, ඔබමොබ; ඣානඞ්ගාවජ්ජිත සමත්ථතා, ධ්‍යානාඞ්ගාව වර්ජිත යට සමර්ථභාවය; ආවජ්ජනවසිතා නාම, ආවර්ජනවශිතා නම් වේ.

මෙසේ කියනලද අර්ථානුසාරයෙන් අතිරික්ත පාළ්‍යාර්ථ දතයුතු.

### ධ්‍යාන විධි සාධක පාළ්‍යර්ථ යොජනායි.

---

යථාභිනන ජිති කස්ස–තත්ථා සෙවන පච්චයො,
භිනන වෙදනී කස්සාපි තෙනාවත්තිං සආදිසො.
සමාපජ්ජීය යං ඣානං–සඞ්ඛාරං සම්ම සන්තස්ස,
ජිතා වුට්ඨානගාමිනි–තදිදං පදකජ්ඣානං.
සම්මසන්තස්ස යං ඣානං–සාජිතා සමසී තකං,
විසු යං ඉච්ඡතෙ යොගී–පුග්ගල ජ්ඣාසයං මතං.
සචෙ අජ්ඣා සො නත්ථි–උපරිමංව ලබ්භති,
වෙදනාතීය මො එත්ථ–වුට්ඨානගාමිනී වසා,
සුක්ඛ විපස්සකස්සාපි–ඣානඞ්ගනිය මො තථා.

මෙහි අර්ථ:–භිනන ජතිකස්ස, භිනනජතී ඇත්තාවූ ජවනය හට; ආසෙවනපච්චයෙ, ආසෙවන ප්‍රත්‍යයක්; නත්ථි, යථා නැති වාක්මෙන්; භිනන වෙදනීකස්සාපි, භිනන වෙදනා ඇත්තාවූ ජවනය හටද; ආසෙවනපච්චයො, ආසෙවන ප්‍රත්‍යයක්; නත්ථි, නැත්තේය; තෙන, එහෙයින්; වත්තිංස ආදිකො, වත්තිං සාදි විධානය හොති, වේ.

යංඣානං, යම් ධ්‍යානයකට; සමාපජ්ජිසි; සමවැද; සංඛාරං, සංස්කාර; සම්මසන්තස්ස සම්මශීනයකරන යොගාවචරයාහට; වුට්ඨානගාමිනී, වුසථානගාමිනී විදශීනතොමෝ; ජිතා, හටගනීද; තදිදං, ඒ සමවදිනලද ධ්‍යානය; පාදකජ්ඣානං, පාදක ධ්‍යානනම් වේ; යංඣානං, යම් ධ්‍යානයක්; සම්මසන්තස්ස, සම්මශීනයකරන යොගාවචරයාහට; සා, ඒ වුසථානගාමිනී විදශීනාතොමෝ; ජිතා හටහනීද; තං, ඒසම්මශීනය කරනලද ධ්‍යානය; සමසිතකං, සමසිත ධ්‍යාන නම්වේ; විසු, විප්‍රකාර පාදක සමසිතධ්‍යානයන් අතුරෙහි; යං, යම් ධ්‍යානයක්; යොගී, යොගාවචරතෙම; ඉච්ඡතෙ, කැමැතිවේද; තං, ඒ ධ්‍යානය; පුග්ගලජ්ඣාසයං, පුද්ගල ධ්‍යාසයයි; මතං, දන්නාලදී; 'පුග්ගලෙන අජ්ඣාසියතෙති පුග්ගලජ්ඣාසයං'යි නිර්වචන කරනු; අජ්ඣාසයො, පුද්ගලයාහට අභිසන්ධියක් ආශාවක් සචෙ නත්ථි, ඉදින් නැත්නම්; උපරිමංව, මතු ධ්‍යාන

යක්ම; ලබ්භති, ලැබේ. එත්ථ, මේ මාර්ගඵල වීථීන්හි; වෙදනා නියමෝ, වෙදනානියමය; වුට්ඨානගාමිනී වසං, වුට්ඨානගාමිනී විදර්ශනා වශයෙන්; හොති, වේ. සුක්ඛ විපස්සකස්සාපි, සමථනමැති සෙනහය වියලුණු විදර්ශනා යොගී පුද්ගලයාගේද; ඣානඞ්ගනියමෝ, ධ්‍යානාඞ්ග නියමය; තථා, එපරිද්දෙනි. විභාවනී ටීකා සඞ්ගහ ගාථා.

## මාර්ග වීථී සාධක පාළ්‍යර්ථයි.

පුබ්බෙ අභිඤ්ඤා පාදක ජ්ඣාන සමාපජ්ජනං පරිකම්ම චිත්තස්ස ථාමාධානත්ථං. පුන සමාපජ්ජනං අධිට්ඨාන චිත්තස්ස බලග්ගාහත්ථං අධිට්ඨානත්ථිහි සබ්බත්ථ අභිඤ්ඤාඤාණං වුච්චති. පරිකම්ම චිත්තං අස්සුතස්ස ගහණතො සද්ද මත්තං ගණ්හාති. අභිඤ්ඤා චිත්තංපන අස්සුතංපි ගණ්හන්තං සවණාකාරෙන ගහණතො අත්ථාවබොධස්සාපි පච්චයභාවෙනෙව ගණ්හාතීති අය මෙතෙසං විසෙසො. තහි අට්ඨසු සමාපත්තීසු චුද්දසාහාකාරෙහි චිණ්ණවසී භාවං විනා උපරි අභිඤ්ඤාධිගමොහොති.

මෙහි අර්ථ:— පුබ්බෙ, පූර්වභාගයෙහි; අභිඤ්ඤා පාදකජ්ඣාන සමාපජ්ජනං, අභිඥාවට පාදකවූ ධ්‍යානයට සමවැදීම; පරිකම්ම චිත්තස්ස–(සතංහොමි' යනාදීන් සංස්කරණය කරනලද) පරිකර්ම චිත්තයාගේ; ථාමාධානත්ථං, මොනවට තබාගතහැකිවීම ප්‍රයොජනකොට ඇත්තේය; පුනසමාපජ්ජනං–නැවත සමවැදීම; අධිට්ඨාන චිත්තස්ස, අභිඥා චිත්තයාගේ බලග්ගාහත්ථං, බලගැන්වීම ප්‍රයොජනකොට ඇත්තේය. හි, ඒ එසේමය. අධිට්ඨානත්ථි, අධිෂ්ඨානයයි; සබ්බත්ථ, සියලුතන්හි; අභිඤ්ඤා ඤාණං, අභිඥා ඥානය; වුච්චති, කියනුලැබේ.

පරිකම්ම චිත්තං, පරිකර්ම චිත්තය; අස්සුතස්ස, අශ්‍රැතශබ්දය; ගහණතො, ගන්නාහෙයින්; සද්දමත්තං, ශබ්ද සාමාන්‍යමාත්‍රයමු; ගණ්හාති, ගනී අභිඤ්ඤාචිත්තංපන, අභිඥා චිත්තය වනාහි; අස්සුතං, අශ්‍රැතශබ්දය, ගණ්හන්තම්පි, ගන්නේවීනමුත්; සවණාකාරෙන, ශ්‍රවණාකාරයෙන්, ගහණතො, ගන්නා හෙයින්; අත්ථාවබොධස්සාපි, අර්ථාවබොධක ඥානයාගේද; පච්චය භාවෙනෙව, ප්‍රත්‍යය භාවයෙන්ම; ගණ්හාති, ගනී. අයං, මේ; එතෙසං, මේ පරිකර්ම අභිඥා යන විවිධචිත්තයන්ගේ; විසෙසො, වෙනසයි. අභිධම්මත්ථ විභාවිනී හි, ඒ එසේමය. අට්ඨසුසමාපත්තීසු, අෂ්ටප්‍රභෙද සමාපත්තීන්හි; චුද්දසහි ආකාරෙහි, තුදුස් ආකාරයකින්; චිණ්ණවසී

භාවං විනා, පුරුදුකරණලද වසීභාවයෙන් තොරව; උපරි අභිඤ්ඤාධිගමො, මත්තෙහි අභිඥාධිගමයක්; නහොති නොවේ. **සුමඞ්ගල විලාසිනී,**

**අභිඥා වීථි පාල්‍යර්ථ යොජනායි.**

---

සමාධි පරිබන්ධස්ස–කාමරාගස්ස හායිනං,
අප්පිතත්තාචානු පුබ්බාය–නිරොධො කාමරූපිනං.

උදයබ්බය සඞ්ඛාරෙ–උක්කණ්ඨිත්වාන යොනිසො,
ඵාසුං විහරිස්සාමාති–සමාපජ්ජන්ති තෙ ඉමං.

ආහාර මූපජීවීනං–භුත්තස්ස එකදීවසං,
සත්තාහං ච යාපනතො–කාමෙසත්තාහ මෙවච.

මෙහි අර්ථ :– සමාධි පරිබන්ධස්ස, සමාධිය ආවරණකරන්නාවූ; කාමරාගස්ස, පඤ්චකාම ගුණිකරාගයාගේ; පහායිනං, ප්‍රහාණකාරීවූ; කාමරූපීනං, කාමරූපී අනාගාමි රහතුන්ට; අනුපුබ්බාය, අනුපූර්ව්ක අෂ්ට සමාපත්තිහුගේ; අප්පිතත්තාච, විද්‍යමාන භාවයෙන්ද; නිරොධො, නිරොධ, සමවත; හොති, ඇතිවේ. උදයබ්බය සඞ්ඛාරෙ, ඇතිව නැතිවන සුලුවූ ත්‍රෛභූමික සංස්කාර සමූදයෙහි; යොනිසො, කාරණානුකූලඥාණයෙන්; උක්කණ්ඨිත්වාන, කලකිරී; ඵාසුං, සැපසේ; විහරිස්සාමාති, වසන්නෙමුයයි; තෙ, ඒ කාමරූපීඅනාගාමි රහතන්වහන්සේලා; ඉමං, මේනිරොධ සමවතට; සමාපජ්ජන්ති, සමවදිත්. **විසුද්ධිමග්ග සඞ්ගහ ගාථා.** ආහාරං උපජීවිනං, කබලීකාරාහාරයනිසා ජීවත්වන්නාවූ කාමාවචර සත්වයන්ට; එකදිවසංභුත්තාහාරස්ස, එක දිනයෙක්හි වළඳනලද ආහාරයාගේ; සත්තාහංච, සතියක්ම; යාපනතො, යැපීමවන හෙයින්; කාමෙ, කාමභූමියෙහි; සත්තාහමෙවච, සතියක් මුළුල්ලෙහිමද; සමාපජ්ජන්ති; සමවදිත්. **සාරත්ථ දීපනී ටීකා සඞ්ගගාථා.**

**නිරොධ සමාපත්ති වීථි සාධකපාල්‍යාර්ථ යොජනායි.**

**මේ සත්වන වීථි සඞ්ග්‍රහනයයි.**

වීථි සඞ්ගුහ

ස්වරූප විභාග

නය.

යටකී ක්‍රමානු සාරයෙන් කොටු පුරවා ගණන් ලියනු.

| | අතිමහන්තාරම්මණ වීථි 5 | මහන්තාරම්මණ ... 10 | පරිත්තාරම්මණ ... 30 | අතිපරිත්තාරම්මණ ... 30 | පඤ්චද්වාර ... 75 | විභූතාරම්මණ ... 6 | අවිභූතාරම්මණ ... 3 | අර්පණා ... 1 | කාම මනොද්වාර ... 10 | මරණාසන්න ... 24 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අකුසල සිත් | — | — | — | — | — | — | — | — | — | — |
| අහෙතුක ,, | — | — | — | — | — | — | — | — | — | — |
| අසොභන ,, | — | — | — | — | — | — | — | — | — | — |
| කාමසොභන ,, | — | — | — | — | — | — | — | — | — | — |
| කාම ,, | — | — | — | — | — | — | — | — | — | — |
| රූප ,, | — | — | — | — | — | — | — | — | — | — |
| අරූප ,, | — | — | — | — | — | — | — | — | — | — |
| මහද්ගත ,, | — | — | — | — | — | — | — | — | — | — |
| ලොකිය ,, | — | — | — | — | — | — | — | — | — | — |
| සංක්ෂෙපලොකොත්තර | — | — | — | — | — | — | — | — | — | — |
| එම විස්තර ,, | — | — | — | — | — | — | — | — | — | — |
| සංක්ෂෙප ,, | — | — | — | — | — | — | — | — | — | — |
| එම විස්තර ,, | — | — | — | — | — | — | — | — | — | — |
| සංක්ෂෙපකු ,, | — | — | — | — | — | — | — | — | — | — |
| එමවිස්තර ,, | — | — | — | — | — | — | — | — | — | — |
| සංක්ෂෙප විපාක,, | — | — | — | — | — | — | — | — | — | — |
| එම විස්තර ,, | — | — | — | — | — | — | — | — | — | — |
| ක්‍රියා සිත් | — | — | — | — | — | — | — | — | — | — |
| චෛතසික ... | — | — | — | — | — | — | — | — | — | — |

| | |
|---|---|
| සියලු කාම විථි | 85 |
| ලොකිය ඣාන ... | 72 |
| ප්‍රත්‍යවෙක්ෂා ... | 192 |
| ලොකිය ... | 157 |
| මග්ග ... | 120 |
| ඵලසමාපත්ති ... | 120 |
| මාර්ග ප්‍රත්‍යවෙක්ෂා... | 120 |
| ඵලප්‍රත්‍යවෙක්ෂා ... | 120 |
| නිර්වාණ ප්‍රත්‍යවෙක්ෂා | 120 |
| ප්‍රහීණ ක්ලෙශ ප්‍ර ... | 120 |
| අප්‍රහීණ ක්ලෙශප්‍ර ... | 90 |
| විස්තාරප්‍ර විථි | 570 |
| එම සංක්ෂෙප ... | 19 |
| අභිඥ ... | 28 |
| නිරොධ ... | 8 |
| සියලු විථි ... | 397 |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු